# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயற்திறன் அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2014









## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
## ஏற்றுமதி விவசாயத் திணைக்களம்
## DEPARTMENT OF EXPORT AGRICULTURE

### සුළු අපනයන බෝග ප්‍රවර්ධන ආමාත්‍යාංශය
### சிறு ஏற்றுமதிப் பயிர் ஊக்குவிப்பு அமைச்சு
### MINISTRY OF MINOR EXPORT CROP PROMOTION

## අපේ දැක්ම

**කුළුබඩු හා ආශ්‍රිත නිෂ්පාදන අපනයනයෙන් විශිෂ්ඨත්වය**

## අපේ මෙහෙවර

**වැඩි විදේශ විනිමයක් ඉපයීමත්, අපනයන කෘෂි බෝග ක්ෂේත්‍රයේ නිරත සියලු පාර්ශවකරුවන්ගේ තිරසාර ආර්ථික හා සමාජීය සංවර්ධනයත් පෙරදැරි කර ගනිමින්, පරිසරය සුරැකෙන අයුරින් අපනයන කෘෂි බෝග නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ප්‍රවර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වන්නාවූ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.**

## எமது தொலைநோக்கு

"வாசனைத் திரவியங்களுக்கும் அதனுடன் இணைந்த உற்பத்திகளுக்கும் ஏற்றுமதியில் சிறப்பிடம்"

## எமது குறிக்கோள்

"உயர் அந்நியசெலாவணி வருவாயைப் பெறுவதுடன், ஏற்றுமதி விவசாயத்துறையில் ஈடுபட்டிருக்கும் அனைவரினதும் பொருளாதார, சமூக அபிவிருத்திக்கு முன்னுரிமை வழங்கி, சூழல் பாதுகாப்பை உறுதி செய்து, ஏற்றுமதி விவசாய உற்பத்திகளின் அளவையும் தரத்தையும் உயர்த்துவதற்குத் தேவையான ஆராய்ச்சி, அபிவிருத்தி நடிவடிக்கைகளைத் திட்டமிடலும் நடைமுறைப்படுத்தலும்"

## OUR VISION

"Excellence in Exports of Spices and Allied Products"

## OUR MISSION

"Planning and Implementation of an appropriate Research and Development Programme with the prime objective of earning more foreign exchange through enhancement of quality and quantity of Export Agricultural Crop production for sustainable development of economic and social standards of all the stakeholders of the Export Agricultural Crop sector while ensuring the safeguards to environment"

# 2014

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயற்திறன் அறிக்கை

# Annual Performance Report

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**
**සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය**

ஏற்றுமதி விவசாயத் திணைக்களம்
சிறு ஏற்றுமதிப் பயிர் ஊக்குவிப்பு அமைச்சு

Department of Export Agriculture
Ministry of Minor Export Crop Promotion

## කෘතඥතාව

මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම සඳහා ලබා දුන් දායකත්වය වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම අංශවල ප්‍රධානීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පිරි නැමේ.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු (පර්යේෂණ හා සංවර්ධන), අධ්‍යක්ෂ (පරිපාලන), අධ්‍යක්ෂ (පර්යේෂණ), අධ්‍යක්ෂ (සංවර්ධන), අධ්‍යක්ෂ (නියාමන), ගණකාධිකාරී හා උප පර්යේෂණ ආයතන හා ආර්ථික පර්යේෂණ ඒකක භාර සහකාර අධ්‍යක්ෂවරු (පර්යේෂණ) විසින් අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි. පිටකවරය නිර්මාණය හා වාර්තාව මුද්‍රණයෙහි ලා සන්නිවේදන අංශයේ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය ද මෙහි දී කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

මෙම වාර්තාව සිංහලට පරිවර්තනය කර දීම වෙනුවෙන් චතුමිණි රණසිංහ මහත්මියට මාගේ ස්තුතිය පුද කරන අතර අවශ්‍ය සියලු දත්ත රැස් කර මෙම වාර්තාව සම්පාදනය කිරීම වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ජී.ඊ.එම්.ඒ.කේ දිසානායක මහත්මියට ද මාගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුද කරමි.

එන්.කේ.ඒ. රූපසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2015.05.18

**පටුන** **පිටුව**


| | | |
|---|---|---|
| | සාමාන්‍ය තොරතුරු – 2014 | 2 |
| 1. | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය | 3 |
| | 1.1 භූමිකාව හා අරමුණු | 3 |
| | 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් | 3 |
| 2. | පරිපාලන අංශය | 4 |
| | 2.1 හැඳින්වීම | 4 |
| | 2.2 කාර්ය මණ්ඩලය | 5 |
| | 2.3 2014 වර්ෂයේ කාර්ය මණ්ඩල වෙනස්වීම | 7 |
| | 2.4 දෙපාර්තමේන්තු විභාග - 2014 | 8 |
| | 2.5 විදේශ ශිෂත්ව හා විදේශ ගමන් - 2014 | 8 |
| | 2.6 2014 වසරේ දී ළඟා කරගත් ඉලක්ක | 9 |
| 3. | මූල්‍ය අංශය | 10 |
| | 3.1 මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් – 2014 | 11 |
| | 3.2 2014 වර්ෂයේ ආදායම | 12 |
| 4. | සංවර්ධන අංශය | 13 |
| | 4.1 හැඳින්වීම | 13 |
| | 4.2 භෝග සංවර්ධන වැඩසටහන | 14 |
| | 4.3 කෘෂි අපනයන භෝග අංශයේ ප්‍රවර්ධනය සඳහා ආයෝජන ආධාර යෝජනා ක්‍රමය | 14 |
| | 4.4 ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන | 16 |
| | 4.5 පසු අස්වනු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපනයන කෘෂි ආධාර යෝජනා ක්‍රමය | 17 |

4.6 වැවිලි අංශයේ භෝග සංවර්ධන වැඩසටහන 19

4.7 රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම 20

4.8 පැළ සහතිකකරණ වැඩසටහන 21

4.9 අපනයන කෘෂි භෝග ආධාර යෝජනා ක්‍රමය

යටතේ පැළ බෙදා හැරීම 22

4.10 වෙනත් අපනයන කෘෂි භෝග සංවර්ධනය 22

4.11 කාබනික වගා වැඩසටහන 23

4.12 ගොවි පුහුණුව 23

4.13 ආදර්ශන පිහිටුවීම 25

4.14 කිතුල් සංවර්ධන වැඩසටහන 25

4.15 "දිවි නැඟුම" ජාතික සංවර්ධන වැඩසටහන -2014 28

4.16 සන්නිවේදන අංශයේ ක්‍රියාකාරීත්වය 30

5. පර්යේෂණ අංශය 32

5.1 පර්යේෂණ අංශයේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය හා සංවිධානය 33

5.2 2014 වර්ෂය තුළ අපනයන කෘෂි භෝග සම්බන්ධ පර්යේෂණවල ප්‍රගතිය 33

5.3. 2014 වසර තුළ සිදුකෙරෙමින් පවතින පර්යේෂණ 45

5.4 පර්යේෂණ අංශයේ වෙනත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය 50

5.5 අපනයන කෘෂි භෝග පිළිබඳ ආර්ථික හා වෙළෙඳ පර්යේෂණ 54

5.6 පර්යේෂණ ප්‍රකාශන 59

ඇමුණුම 1 : අපනයන කෘෂි භෝග වගා වපසරිය (හෙක්) දිස්ත්‍රික්ක අනුව - 2014* 61

ඇමුණුම I1 : අපනයන කෘෂි භෝගවල අපනයන පරිමාව හා අගය – 2013/2014 62

ඇමුණුම III : 2011/2014 දක්වා අපනයන කෘෂි භෝග වල දළ මිල ගණන් (කි.ග්‍රෑ./රු.) 63

ඇමුණුම 1V : අපනයන කෘෂි භෝගවල ආනයන පරිමාව හා අගය – 2013/2014 64

ඇමුණුම VI : ව්‍යාප්ති නිලධාරීන් ස්ථාන ගතකිරීම 65

ඇමුණුම VI : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවිධාන සැලැස්ම 67

| වගුව | | පිටුව |
|---|---|---|
| 2.2.1 | 2014 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු | 5 |
| 2.4 | දෙපාර්තමේන්තු විභාග -2014 | 8 |
| 2.5 | විදේශ ශිෂ්‍යත්ව හා විදේශ ගමන් -2014 | 8 |
| 3.1 | මූල්‍ය ප්‍රතිපාදන හා වියදම්– 2014 | 11 |
| 3.2 | 2014 වර්ෂයේ ආදායම | 12 |
| 4.3.1.1 | නව වගා සඳහා අපනයන කෘෂි භෝග ආයෝජන ආධාර ක්‍රමය | 15 |
| 4.3.1.2 | නව වගා වැඩසටහනේ ප්‍රගතිය – 2014 | 15 |
| 4.4.1 | ඵලදායීතා ප්‍රවර්ධනය වැඩසටහන සඳහා ආධාර යෝජනා ක්‍රමය | 16 |
| 4.4.2 | ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය | 16 |
| 4.4.3 | ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ විවිධ දිස්ත්‍රික්ක වල සංවර්ධනය කරන ලද භූමි ප්‍රමාණය | 17 |
| 4.5.1 | පසු අස්වනු ක්‍රියාකාරකම් සඳහා ආධාර යෝජනා ක්‍රමය | 18 |
| 4.5.2 | 2014 වසර තුල පසු අස්වනු ආධාර යෝජනා ක්‍රමයේ ප්‍රගතිය | |
| 4.6.1 | 2014 වසරේ වැවිලි අංශයේ භෝග සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද භෝග | 19 |
| 4.7.1 | දිස්ත්‍රික්ක අනුව දෙපාර්තමේන්තු පැළ තවාන්වල ව්‍යාප්තිය | 20 |
| 4.7.2 | දෙපාර්තමේන්තුව යටතේ විවිධ දිස්ත්‍රික්කවල ලියාපදිංචි වී ඇති පුද්ගලික පැළ තවාන් ගණන | 20 |
| 4.7.3 | බීජ හා රෝපණ ද්‍රව්‍යවල මිල ගණන්(රු.) | 21 |
| 4.8.1: | 2014 වසරේ දී සහතිකකරණය ලබාදුන් පැළ පිළිබඳ විස්තර | 21 |
| 4.9.1 | රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීම | 22 |
| 4.10.1 | වැනිලා දඬු කැබලි බෙදා දීමේ ප්‍රගතිය | 22 |

| | | |
|---|---|---|
| 4.11.1 | 2014 වසරේදී කාබනික වගා සංවර්ධන වැඩසටහන යටතේ ඇතිකළ වගා බිම් ප්‍රමාණය | 23 |
| 4.12.1 | 2014 වසරේ ගොවි පුහුණු ප්‍රගතිය | 23 |
| 4.12.2.1 | කුරුඳු තළන්නන් පුහුණු කිරීමේ වැඩසටහනෙහි ප්‍රගතිය | 24 |
| 4.12.3.1 | මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් වල විස්තර | 24 |
| 4.13.1 | 2014 වසර තුළ දී විවිධ දිස්ත්‍රික්කවල පිහිටුවා පවත්වාගෙන යන ලද ආදර්ශන ගණන | 25 |
| 4.14.2.1 | සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට බෙදා දුන් කෘෂි අපනයන භෝග පැළ ගණන | 26 |
| 4.14.3.1 | තේ සමග අතුරුභෝගයක් ලෙස වගා කිරීම සඳහා අපනයන කෘෂි භෝග බෙදා හැරීම | 26 |
| 4.14.3.2 | කෘෂි අපනයන භෝග ප්‍රතිලාභීන් සඳහා කුඩා වැව්ලි සංවර්ධන වැඩසටහන යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන් | 27 |
| 4.14.5.1 | ගම්මිරිස් සෙවන කප්පාදු කිරීමේ සතියේ ප්‍රගතිය | 27 |
| 4.15.1.1 | ගෙවතු වගා වලට සඳහා රෝපණ ද්‍රව්‍ය ලබා දීම | 28 |
| 4.15.2.1 | වාණිජ වගා ඒකක වැඩ සටහනේ භෞතික ප්‍රගතිය | 29 |
| 4.15.3.1 | අපනයන කෘෂි භෝග ආශ්‍රිත ගෘහස්ථ වාණිජ ඒකකවල ප්‍රගතිය | 30 |
| 4.15.4 | අපනයන කෘෂි භෝග පැළ තවාන්වල වාණිජ පැල ගෘහ ඉදිකිරිම | 30 |
| 5.4.8.1 | ශාක ආරක්ෂණ සේවය සම්බන්ධ තාක්ෂණ සම්ප්‍රේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර | 53 |
| 5.4.9 | පර්යේෂණ අංශයෙන් නිකුත් කළ රෝපණ ද්‍රව්‍ය | 53 |
| 5.5.2.1 | අපනයන කෘෂි භෝග ආධාර යෝජනා ක්‍රමය යටතේ අලුතින් සිටුවන ලදවගා බිම් ප්‍රමානය 201455 | |
| 5.5.3.1 | තක්සේරු කළ අපනයන කෘෂි භෝග නිෂ්පාදනය – 2011/2014 | 56 |

# අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය



සංවර්ධන හා පර්යේෂණ ක්‍රියාදාමයන් තුළින් අපනයන කෘෂි භෝග නිෂ්පාදනයන්ගේ ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම හා අගය එකතු කළ නිෂ්පාදනවල ධාරිතාව වැඩි දියුණු කිරීම මගින් අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයෙන් ලැබෙන විනිමය ආදායම වැඩි කර ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කැපවී සිටි. තේ,රබර් , පොල් හා කජු වලට අමතරව කුළුබඩු, පානීය භෝග, කාර්මික භෝග, සගන්ධ තෙල් හා උත්තේජක භෝග වැනි බහුවාර්ෂික භෝගවලින් සැදුම් ලත් මෙම ක්ෂේත්‍රය, අදාළ වර්ෂය තුළ කෘෂි හා වැවිලි අංශයේ සමස්ත විනිමය ආදායමෙන් 11.8 %කට දායක වී තිබේ. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2014 වසර තුළ, ස්වකීය අරමුණු කරා ළඟා වීම සඳහා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාවට නංවන ලදී.

මෙම වසර තුළදී දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික නිෂ්පාදන සිදුකරන අනෙකුත් රටවල් හා තරඟ කිරීමට හැකිවන පරිදි අන්තර්ජාතික ප්‍රමිතීන් හා වෙළෙඳ රීතිවලට අනුකූල වීම සඳහා නිෂ්පාදනය, ඵලදායීතාව හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. අන්තර්ජාතික වෙළෙඳපොළේ අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින්, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත් නිෂ්පාදනය පිළිවෙත් ප්‍රවර්ධනය කරමින් ගෘහස්ථ නිෂ්පාදන පද්ධතිය තුළ ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ දී ද, ‘‘වඩා ඉහළ ගුණාත්මයකින් යුත් නිෂ්පාදනයක්’’ යන තේමාව යටතේ සිය මෙහෙවර අඛණ්ඩව සිදු කරන ලදී.

දළදා වහන්සේට පලමු අස්වැන්න පූජා කිරීමේ චිරාගත සම්ප්‍රදාය අනුගමනය කරමින් චාරිත්‍රානුකූලව කුළුබඩුවල මංගල අස්වැන්න ‘‘කුළුබඩු පූජා මංගල්‍යය‘‘ ඔස්සේ දළදා වහන්සේට පුද කරන ලදී. ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ සහයෝගයෙන් දේශීය පාරිභෝගිකයින් අතර ගම්මිරිස් පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ දී ගම්මිරිස් දිනයක් පවත්වන ලද අතර දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ කුළුබඩු නිෂ්පාදන හා රෝපණ ද්‍රව්‍ය අලෙවි කිරීම සඳහා අලෙවි මධ්‍යස්ථානයක් ද මෙම වසරේ දී විවෘත කරන ලදී.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ පවතින පර්යේෂණ, සංවර්ධන, පරිපාලන හා මූල්‍ය යන අනු අංශ හතරට අදාළ තොරතුරු හා සමස්ත කාර්යසාධනය මෙම වාර්තාව ඔස්සේ සැකෙවින් දක්වා ඇති අතර එහි දෙපාර්තමේන්තුවේ සියලු ක්‍රියාකාරකම්, අපේක්ෂිත ඉලක්කයන් වෙත ළඟා වීම සඳහා යොදා ගත් උපාය මාර්ග සහ 2014 වසර තුළ අත්පත් කරගත් ප්‍රගතිය අන්තර්ගත වේ.

එන්.කේ.ඒ.රූපසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

- **2014 වසරේ අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ වර්ධනය**

- දළ දේශිය නිෂ්පාදිතයට දායකත්වය - 0.3%
- කෘෂි අපනයන ආදායම් සඳහා දායකත්වය - 11.8 %
- අපනයන පරිමාව (මෙට්‍රික් ටොන්) - 59,827.28
- අපනයන අගය (රු.මි. ) - 43,223.45
- තක්සේරු කළ අපනයන කෘෂි භෝග ධාරිතාව (හෙක්) - හෙක්. 109,690 (ඉඟුරු හා කහ ඇතුළුව)

- **දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යයාල, පර්යේෂණ මධ්‍යස්ථාන හා පැළ තවාන්**

**දිස්ත්‍රික් කාර්යාල -14 (මෙම දිස්ත්‍රික් කාර්යයාලවල ව්‍යාප්තිය පහත පරිදි වේ)**

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත | - | මහනුවර, මාතලේ, නුවරඑළිය |
| සබරගමුව පළාත | - | කෑගල්ල, රත්නපුර |
| ඌව පළාත | - | බදුල්ල, මොණරාගල |
| දකුණු පළාත | - | ගාල්ල, මාතර, හම්බන්තොට |
| බස්නාහිර පළාත | - | කොළඹ, කළුතර, ගම්පහ |
| වයඹ පළාත | - | කුරුණෑගල, පුත්තලම |

**පර්යේෂණ මධ්‍යස්ථාන හා උප පර්යේෂණ මධ්‍යස්ථාන**

1. මධ්‍යම පර්යේෂණ ස්ථානය, මාතලේ
2. කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය, පළොල්පිටිය, තිහගොඩ, මාතර
3. අතුරුභෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානය, දම්පැලැස්ස, නාරම්මල
4. ආර්ථික හා වෙළෙඳ පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
5. මැදරට පර්යේෂණ මධ්‍යස්ථානය, දැල්පිටිය
6. පටක රෝපණ ඒකකය හා පැළ තවාන, වල්පිට
7. පර්යේෂණ අනු ඒකකය, කුණ්ඩසාලේ
8. පර්යේෂණ අනු ඒකකය, නිල්ලඹ

**දෙපාර්තමේන්තු පැළ තවාන්**

| | | |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කය | - | සෙරපිස් පැළ තවාන - පොල්ගහවෙල<br>හොලොන්ගොල්ල පැළ තවාන - දොඩන්ගස්ලන්ද<br>වෙන්නෝරුව පැළ තවාන - නාරම්මල |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | - | බ්ලැක්වෝටර් පැළ තවාන - ගිනිගත්හේන හා මුල්හාල්කැලේ, වලපනේ පැළ තවාන |
| මාතලේ දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - ඇල්වල |
| මාතර දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - මාපළාන, කඹුරුපිටිය |
| කෑගල්ල දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - ගස්නාව |
| ගම්පහ දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන - වල්පිට |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | - | මධ්‍යම පැළ තවාන හා කුළුබඩු උද්‍යානය - මිද්දෙණිය |

# 1. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

## 1.1 භූමිකාව හා අරමුණු

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ අපනයන පරිමාව ඉහළ නංවා නිෂ්පාදිතයන්ගේ ගුණාත්මය වැඩි දියුණු කිරීම මගින් වැඩි විනිමය ආදායමක් ලබා ගත හැකි වන පරිදි අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමයි. නිල වර්ගීකරණයට අනුව වාර්ෂික නිෂ්පාදනයෙන් 50%කට අධික පරිමාවක් අපනයනය කරනු ලබන (තේ, රබර්, පොල් හා කජු අයත් නොවේ.) බහු වාර්ෂික භෝග හා අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් දෙපාර්තමේන්තුවේ විෂය පථයට ඇතුළත් කළ යුතු යැයි නම් කරන ඕනෑම භෝගයක් අපනයන කෘෂි භෝගයක් ලෙස හැඳින්වේ. මෙම වර්ගීකරණයට අනුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අවධානය යොමු වී ඇත්තේ කුරුඳු, ගම්මිරිස්, කරාබු, සාදික්කා, කරදමුංගු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, වැනිලා, පැඟිරි, සේර, ගොරකා, කිතුල්, ඉඟුරු හා කහ ආදී සාම්ප්‍රදායික භෝග සංවර්ධනය කිරීම කෙරෙහිය. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මූලික වශයෙන් තාක්ෂණික දෙපාර්තමේන්තුවක් වන අතර එහි කාර්යයන් කේන්ද්‍රගත වී ඇත්තේ අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහිය.

## 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ පාර්ලිමේන්තුවේ 1992 සැප්තැම්බර් 22 දිනැති අංක 46 දරන අපනයන කෘෂි භෝග ප්‍රවර්ධනය කිරීමේ පනත මගින් පහත සඳහන් කාර්යයන් හා සේවාවන් සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ව්‍යවස්ථාපිත බලය පවරා දෙනු ලැබ තිබේ.

- කෘෂි අපනයන භෝග වගාව හා පිරිසැකසුම්කරණය සංවිධානය හා ප්‍රවර්ධනය.
- භෝග සංවර්ධනය, භෝග වගාව, භෝග ආරක්ෂණය, පසු අස්වනු කළමනාකරණය හා සමාජ ආර්ථික විද්‍යාව සම්බන්ධ බහු විෂයානුබද්ධ පර්යේෂණ සිදු කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින්යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සැපයීම.
- භෝග නිෂ්පාදනය, ඵලදායීතා වර්ධනය හා ගුණාත්මභාවය වර්ධනයට අදාළ අපනයන කෘෂි භෝග ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- භෝග ආරක්ෂණ උපදේශන සේවා සැපයීම.
- ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය.
- ඒකාබද්ධ ශාක පෝෂණ කළමනාකරණය ප්‍රවර්ධනය.
- කාබනික වගාව ප්‍රවර්ධනය.
- අලෙවිකරණය, ගුණාත්මක ප්‍රමිතීන් හා මිල ගණන් ආදිය පිළිබඳ දත්ත නිකුත් කිරීම.
- අපනයන කෘෂි භෝග හා රෝපණ ද්‍රව්‍ය ආනයනය පාලනය කිරීම.
- අපනයන කෘෂි භෝග නිෂ්පාදනය, පිරිසැකසුම්කරණය, අලෙවියෙහි නියුතු පුද්ගලයින් හා අනෙකුත් පාර්ශවකරුවන් පුහුණු කිරීම.
- වැවිලි අංශය තුළ අපනයන කෘෂි භෝග ප්‍රවර්ධනය සඳහා උපදේශන සේවා සැපයීම.
- අපනයන කෘෂි භෝග ආශ්‍රිත රාජ්‍ය හා පෞද්ගලික ආයතන අතර සම්බන්ධතාව ශක්තිමක් කිරීම.
- 1992 අංක 46 දරණ අපනයන කෘෂිකර්ම පනත යටතේ විධායක අධිකාරී බලය පැවරීම.
- කෘෂි අපනයන භෝග ආශ්‍රිත ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් අනෙකුත් රාජ්‍ය සංවිධාන වෙත උපදෙස් සැපයීම.
- තාක්ෂණික ආදර්ශන පවත්වාගෙනයාම.





# පරිපාලන

## நிர்வாகம்

# ADMINISTRATION





## 2. පරිපාලන අංශය

2014 වසරේ විශේෂ සිදුවීම්

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ වැඩ බැලීම සඳහා 2014.06.10 දින සිට එන්.කේ.ඒ.රූපසිංහ මහතා පත් කරන ලදී.

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු හයක් සඳහා නවක නිලධාරීන් බඳවා ගන්නා ලදී.

- දෙපාර්තමේන්තුවේ සියලු තනතුරුවලට අදාල බඳවා ගැනීමේ පරිපාටි අනුමතකර ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

### 2.1 හැඳින්වීම

අධ්‍යක්ෂ (පරිපාලන) ගේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මකවන පරිපාලන අංශය, අනෙකුත් සියලු අංශ හා බාහිර ආයතන සමඟ සම්බන්ධ වෙමින් දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු මෙහෙයවීමට උර දෙනු ලබයි. ඒ අනුව නව බඳවා ගැනීම්, උසස් කිරීම් සහ ස්ථාන මාරු, මානව සම්පත් සංවර්ධනය, විනය පාලනය, දෙපාර්තමේන්තු විභාග හා ප්‍රසම්පාදන කටයුතුවලට අදාල කරුණු හා දෙපාර්තමේන්තුවේ මූලධන වත්කම් නඩත්තු කිරීම ආදී කටයුතු ප්‍රධාන වශයෙන්ම සිදු කරනු ලබයි. එසේම කාර්ය මණ්ඩලයේ සුභසාධනය හා අභිප්‍රේරණය උදෙසා යෝග්‍ය පරිදි සුභසාධන සේවා ක්‍රියාත්මක කිරීමේ වගකීමද පරිපාලන අංශය විසින් දරනු ලැබේ.

## 2.2 කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ සංවිධාන සැළැස්ම ඇමුණුම VI හි දක්වා ඇත. අනුමත සේවක සංඛ්‍යාව සහ සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 2.2.1 වගුවෙහි දැකුවේ.

**2.2.1 වගුව : 2014 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු**

| අංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | | දැනට සිටින සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන් | ස්ථිර | කොන්. | |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | - | - | - | 01 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | - | - | - | 02 |
| 03 | අධ්‍යක්ෂ(පර්යේෂණ/සංවර්ධන) | 07 | - | - | - | 07 |
| 04 | අධ්‍යක්ෂ(පාලන) | 01 | - | 01 | - | - |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර | 01 | - | 01 | - | |
| 06 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 67 | - | 45 | - | 22 |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | - | 01 | - | - |
| 08 | ගණකාධිකාරී | 01 | - | - | - | 01 |
| 09 | සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන) | 01 | - | 01 | - | - |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර | 01 | - | 01 | - | - |
| 11 | අභ්‍යන්තර විගණක | 01 | - | - | - | 01 |
| 12 | සංඛ්‍යා ලේඛණඥ | 01 | - | 01 | - | |
| **ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව** | | **85** | **-** | **51** | **-** | **34** |
| 13 | පරිපාලන නිලධාරී | 03 | - | 03 | - | |
| 14 | ව්‍යාප්ති නිලධාරී (විශේෂ ශ්‍රේණිය) | 19 | - | 03 | - | 16 |
| 15 | ප්‍රධාන තාක්ෂණ නිලධාරී | 03 | - | 02 | - | 01 |
| 16 | ගොවිපල් කළමණාකරු(විශේෂ ශ්‍රේණිය) | 01 | - | - | - | 01 |
| 17 | භාෂා පරිවර්තක | 02 | - | 01 | - | 01 |
| **තෘතීය මට්ටමේ එකතුව** | | **28** | - | **09** | - | **19** |
| 18 | පර්යේෂණ හා සංවර්ධන සහකාර/ සංවර්ධන සහකාර | 84 | - | 80 | - | 4 |
| 19 | සංවර්ධන නිලධාරී | 411 | - | 286 | - | 125 |
| 20 | අයවැය සහකාර (ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කිරීම | 01 | - | 01 | - | - |
| 21 | පුස්තකාලයාධිපති | 03 | - | 01 | - | 02 |
| 22 | ව්‍යාප්ති නිලධාරී | 171 | - | 135 | - | 36 |
| 23 | තාක්ෂණ නිලධාරී | 22 | - | 19 | - | 03 |
| 24 | කාර්මික නිලධාරී | 01 | - | - | - | 01 |
| 25 | ගොවිපල් කළමණාකරු | 13 | - | - | - | 13 |
| 26 | රාජ්‍ය කළමණාකරන සහකාර | 83 | - | 71 | - | 12 |
| 27 | පරිගණක දත්ත ක්‍රියාකරු | 01 | - | 01 | - | - |
| 28 | නිවාස පාලක | 01 | - | 01 | - | - |
| 29 | ගොවිපල්සේවා සහකාර | 09 | - | 09 | - | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ද්විතීය මට්ටමේ එකතුව** | | **800** | - | **604** | - | **196** |
| 30 | රියදුරු | 61 | - | 51 | - | 10 |
| 31 | පෙදරේරු | 01 | - | 01 | - | - |
| 32 | ට්‍රැක්ටර් රියදුරු | 02 | - | - | - | 02 |
| 33 | ඉසින යන්ත්‍ර ක්‍රියාකරු | 02 | - | 02 | - | - |
| 34 | බද්ධකරු | 01 | - | 01 | - | - |
| 35 | ජලනල ක්‍රියාකරු | 01 | - | 01 | - | - |
| 36 | පැල තවාන්කරු | 02 | - | 02 | - | - |
| 37 | කාර්යාල කාර්ය සහායක | 35 | - | 29 | - | 06 |
| 38 | ලොරි ක්ලීනර් | 07 | - | 07 | - | - |
| 39 | රියදුරු සහායක | 01 | - | 01 | - | - |
| 40 | මුරකරු | 47 | - | * 63 | - | |
| 41 | කම්කරු | 190 | 97 | * 264 | ➢ 09 | |
| 42 | අරක්කැමි | 01 | - | 01 | - | |
| 43 | සංචාරක බංගලා භාරකරු | 02 | - | 01 | - | 01 |
| **ප්‍රාථමික මට්ටමේ එකතුව** | | **353** | **97** | **424** | **09** | **19** |
| **එකතුව** | | **1266** | **97** | **1088** | **09** | **268** |

* රා.ප.ව. 25/2014 අනුව සේවයේ නියුතුව සිටි කොන්ත්‍රාත් සේවකයන් ස්ථිර කිරීම හේතුවෙන් කම්කරු හා මුරකරු සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ඇත

➢ රා.ප.ව. 25/2014 අනුව ස්ථිර කිරීමට සුදුසුකම් නොලත් කොන්ත්‍රාත් කම්කරුවන් 09 ක් සේවයේ අවශ්‍යතාවයන් මත තවදුරටත් සේවයේ යෙදී සිටී.

## 2.3 2014 වර්ෂයේ කාර්යමණ්ඩල වෙනස් වීම්

**නව පත්වීම්**

| | |
|---|---|
| 1. සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 |
| 2. සහකාර අධ්‍යක්ෂ ( පර්යේෂණ) | 04 |
| 3. කළමණාකරන සහකාර සේවය | 03 |
| 4. සංවර්ධන නිලධාරී | 40 |
| 5. මුරකරු | 28 |
| 6. කම්කරු | 113 |

**ස්ථානමාරුවී පැමිණි**

| | |
|---|---|
| 1. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 01 |
| 2. සංවර්ධන නිලධාරින් | 02 |
| 3. සංවර්ධන සහකාර | 01 |
| 4. රාජ්‍ය කළමණාකරන සහකාර | 14 |
| 5. කාර්යාල සේවක සේවය | 01 |
| 6. රියදුරු | 10 |

**ස්ථානමාරුවී යාම**

| | |
|---|---|
| 1. සංවර්ධන නිලධාරී | 04 |
| 2. රාජ්‍ය කළමණාකරන සහකාර | 04 |
| 3. කාර්යාල සේවක සේවය | 01 |
| 4. රියදුරු | 03 |

**සේවයෙන් ඉල්ලා අස්විම**

| | | |
|---|---|---|
| 1. සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | - |
| 2. සංවර්ධන නිලධාරී | 02 | |

**මුදාහැරීම**

| | |
|---|---|
| 1. ව්‍යාප්ති නිලධාරි | 02 |
| 2. සංවර්ධන නිලධාරින් | 10 |
| 3. රාජ්‍ය කළමණාකරන සහකාර | 01 |
| 4. කම්කරු | 02 |

**මියයාම**

| | |
|---|---|
| 1. කොන්ත්‍රාත් කම්කරු | 01 |
| 2. රියදුරු | 01 |

**විශ්‍රාම යාම**

| | |
|---|---|
| 1. අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 2. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 |
| 3. නියෝජ්‍ය අධ්‍යක්ෂ ( සංවර්ධන) | 01 |
| 4. ව්‍යාප්ති නිලධාරි | 07 |
| 5. රාජ්‍ය කළමණාකරන සහකාර | 06 |
| 6. ගොවිපල් සේවා සහකාර | 01 |
| 7. රියදුරු | 05 |
| 8. මුරකරු | 01 |
| 9. කම්කරු | 09 |

**සේවය හැරයාම**

| | |
|---|---|
| 1. ව්‍යාප්ති නිලධාරී | 01 |
| 2. පර්යේෂණ හා සංවර්ධන නිලධාරින් | 01 |

## 2.4 දෙපාර්තමේන්තු විභාග - 2014

| අංකය | විභාගය | පවත්වන ලද දිනය |
|---|---|---|
| 01 | දෙමළ භාෂා වාචික පරීක්ෂණය (1 වන වාරය) | 2014. 03. 28 |
| 02 | දෙමළ භාෂා වාචික පරීක්ෂණය (2 වන වාරය) | 2014. 10. 10 |
| 03 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (1 වන වාරය) | 2014. 03. 21 |
| 04 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (2 වන වාරය) | 2014. 11. 11 |
| 05 | පර්යේෂණ හා සංවර්ධන නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | 2014. 10. 27 |

## 2.5 විදේශ ශිෂ්‍යත්ව සහ විදේශ ගමන් - 2014

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | කාරණය | කාල සීමාව | රට |
|---|---|---|---|---|---|
| 01 | ඩබ්.ඩී.එල්.ගුණරත්න මයා | අධ්‍යක්ෂ ජනරාල් | Codex කමිටුව හා කුළුබඩු සමුළුව සඳහා සහභාගීවීමට | 2014.02.10 සිට 2014.02.19 | ඉන්දියාව |
| 02 | ඩබ්.එම්.ආර්.ඩබ්.බී. විජේකෝන් මයා | පර්යේෂණ නිලධාරී | Codex කමිටුව හා ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාවේ ගුණාත්මක කමිටුව | 2014.02.10 සිට 2014.02.16 | ඉන්දියාව |
| 03 | එන්.කේ.ඒ.රූපසිංහ මයා | අ.අ.ජනරාල්(සං.) | ජාත්‍යන්තර ගම්මිරිස් පිළිබඳ විශේෂ සාකච්ඡාව | 2014.02.24 සිට 2014.02.27 | ඩුබායි |
| 04 | ජේ.එල්.කීර්තිවීරලාල් මයා | නි.අධ්‍ය(සං.) | ආවරණ ගෘහ තුළ බෝග වගා තාක්ෂණ පුහුණුව | 2014.04.02 සිට 2014.05.16 | චීනය |
| 05 | එස්.පී.එල්. සෙනෙවිරත්න මිය | අධ්‍ය.(සං.) | ආසියානු රටවල කෘෂිකර්මයේදී තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය | 2014.05.09 සිට 2014.05.29 | චීනය |
| 06 | ජී.ජී, ජයසිංහ මයා | නි.අධ්‍ය.(පර්.) | ආසියානු රටවල කෘෂිකර්මයේදී තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය | 2014.05.09 සිට 2014.05.29 | චීනය |
| 07 | කේ.ජී. උපාලි රණවක මයා | අධ්‍ය.(පාලන) | සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන ආර්ථිකය පිළිබඳ පුහුණුව | 2014.06.04 සිට 2014.06.26 | චීනය |
| 08 | ආර්.ඒ.ඒ.කේ.රණවක මහතා | සහ. අධ්‍ය(පර්.) | ආසියානු රටවල පළතුරු නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | 2014.06.12 සිට 2014.07.26 | චීනය |
| 09 | ටී.ඒ.එච්.කේ.සෝමලතා මිය | ව්‍යාප්ති නිලධාරී | ආසියානු රටවල පළතුරු නිෂ්පාදනය පිළිබඳ පුහුණුව | 2014.06.12 සිට 2014.07.26 | චීනය |
| 10 | එන්.කේ.ඒ.රූපසිංහ මහතා | අධ්‍ය.ජනරාල් | සුළු අපනයන භෝග ප්‍රවර්ධන ගරු අමාත්‍යතුමා සමග නිල සංචාරයක් සඳහා | 2014.07.16 සිට 2014.07.21 | තායිලන්තය |
| 11 | ඩී.එම්.ඒ. බණ්ඩාර මයා | ව්‍යාප්ති නිලධාරී | ධාන්‍ය හා තෙල් භෝග හා වාරි පද්ධති පිළිබඳ විස්තීරණ උපයෝජ්‍යතා තාක්ෂණය පුහුණු වැඩමුළු සහභාගීවීම | 2014.07.25 සිට 2014.10.22 | චීනය |
| 13 | අයි.වී.ඒ.ඩී.එස්.ඉඳුරුව මයා | සහ.අධ්‍ය.(පර්) | නිවර්තන කෘෂිනිෂ්පාදන වල ගුණාත්මය සහ සුරක්ෂිතභාවය පිළිබඳ පුහුණු වැඩමුළුවට සහභාගීවීම | 2014.08.27 සිට 2014.10.20 | චීනය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | ටී.ඊ.වීරවර්ධන මිය | සහ.අධ්‍යා.(පර්) | න්‍යෂ්ටික පරයේෂණ භුවමාරු වැඩසටහන | 2014.10.05 සිට 2015.03.07 | ජපානය |
| 15 | ආර්.එන්.අමරසිංහ මිය | ව්‍යාප්ති නිලධාරී | ප්‍රමාණික ආර්ථික දර්ශනය ඔස්සේ මූලික ආර්ථික සංවර්ධන | 2014.10.19 සිට 2014.11.22 | තායිලන්තය |
| 16 | එන්.කේ.ඒ.රූපසිංහ මයා | අධ්‍යා.ජනරාල් | 42 වන ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුව | 2014.10.25 සිට 2014.10.31 | වියට්නාමය |
| 17 | ආචාර්ය ඒ.පී. හීන්කෙන්ද මයා | අති.අධ්‍යා.ජනරාල් (පර්) | 42 වන ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුව | 2014.10.25 සිට 2014.10.31 | වියට්නාමය |
| 18 | ආචාර්ය එම්.ඒ.පී.කේ. සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ(සං) | 42 වන ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුව | 2014.10.25 සිට 2014.10.31 | වියට්නාමය |
| 19 | ඊ.ඒ.පී.එස්.අමරවංශ මිය | සහ.අධ්‍යා(සං) | ප්‍රායෝගික ක්‍රියාකාරකම් තුලින් කාබනික කෘෂිකර්මය උගැන්ම | 2014.11.03 සිට 2014.11.25 | තායිලන්තය |
| 20 | පී.ඊ.එම්.ඒ.කේ. දිසානායක මිය | සහ.අධ්‍යා (සැළසුම්) | ප්‍රමාණික ආර්ථිකයක් ඔස්සේ සශ්‍රික ජාතියක් කරා | 2014.11.03 සිට 2014.12.01 | තායිලන්තය |
| 21 | පී.ආර්.ජී.එස්. අමරසේන මහතා | ව්‍යාප්ති නිලධාරී | ගිවිසුම්ගත ගොවිතැන ඔස්සේ සුළු පරිමාන ගොවීන් කලාපීය හා ගෝලීය වෙළඳපොල දාමයන් වෙත ඒකාබද්ධ කිරීමේ වැඩමුළුව | 2014.11.03 සිට 2014.11.07 | වියට්නාමය |
| 22 | එච්.ඒ.එස්.කේ.වීරතුංග මිය | පර්යේෂණ හා සංවර්ධන සහකාර | දේශීය ගොවීන්ගේ සහභාගීත්වයෙන් ඒකාබද්ධ කෘෂිකර්මය හා ග්‍රාමීය සංවර්ධනය | 2014.11.03 සිට 2014.12.21 | ජපානය |
| 23 | ඒ.පී.පී.දිස්නා මෙය | අධ්‍යක්ෂ (නියාමන) | කෘෂි ආහාර නිෂ්පාදන සඳහා වෙළෙඳ පහසුකම් සැපයීම හා කවදාසී රහිත පද්ධතිය යොදා ගැනීම | 2014.12.15 සිට 2014.12.17 | තායිලන්තය |
| 24 | ආචාර්ය ඒ.එල්.එස්.ධර්මපරාක්‍රම මයා | අධ්‍යක්ෂ (පර්යේෂණ) | කෘෂිකාර්මික පර්යේෂණ කළමණාකරණය පිළිබඳ පුහුණුව | 2014.12.21 සිට 2015.01.01 | ඉන්දියාව |

## 2.6. 2014 වසරේදී ළඟාකර ගත් ඉලක්ක

- **ඉඩම් පවරා ගැනීම**

1) මාතර සහකාර අධ්‍යක්ෂ කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීම අවසන්කර, ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 44 වගන්තිය අනුව 2014. 05.27 දින මෙම දෙපාර්තමේන්තුව යටතේ අයිතිය ලියාපදිංචි කර ඇත.
2) මිද්දෙණිය අපනයන කෘෂිභෝග ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය හා සැකසුම් මධ්‍යස්ථානය පිහිටි ඉඩම, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත ප්‍රාදේශීය ලේකම් විසින් 2014.12.31 දින මෙම දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.

- **බඳවාගැනීමේ පරිපාටි අනුමත කරගැනීම**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණය සඳහා වන බඳවාගැනීමේ පරිපාටිය 2014.07.24 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර 2014 වර්ෂයේ අවසානය වන විට දෙපාර්තමේන්තුවේ සියලුම තනතුරුවලට අදාල බඳවාගැනීමේ පරිපාටි අනුමත කිරීමේ කටයුතු අවසන් කර ඇත.

- **කාර්ය මණ්ඩලය බඳවාගැනීම**

1) ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරු 06 ක් සඳහා බඳවාගැනීම් සිදුකරන ලදී.
2) දෙපාර්තමේන්තුගත මුරකරු තනතුරු 12 ක්, කම්කරු තනතුරු 15 ක් හා සංචාරක බංගලා භාරකරු තනතුරු 01 ක් සඳහා බඳවාගැනීම් සිදුකර ඇත.
3) රා.ප.ච. 25/2014 ප්‍රකාරව සේවයේ යෙදී සිටි කොන්ත්‍රාත් කම්කරුවන් 113 ක් හා මුරකරුවන් 28 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලබාදෙන ලදී.






# මූල්‍ය

# நிதி

# FINANCE





## 3. මූල්‍ය අංශය

**මූල්‍ය අංශයේ විශේෂ සිදුවීම්**

- 2014 වර්ෂය තුළ දී සමස්ත ප්‍රතිපාදනයෙන් 89.7%ක් වැය කෙරිණි.
- 1 හා 2 ව්‍යාපෘතිවල මූල්‍ය කාර්යසාධනය ප්‍රතිපාදනවලින් 90% හා 89% බැගින් විය.
- 1 හා 2 ව්‍යාපෘති යටතේ මූලධන වියදම් ප්‍රගතිය පිළිවෙළින් 81.3% හා 60.9% බැගින් වූ අතර පුනරාවර්තන වියදම් යටතේ එය පිළිවෙළින් 99.92% හා 99.94% බැගින් විය.

2014 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවලින් පුනරාවර්තන වියදම් ව්‍යාපෘති දෙකක් හා මූලධන වියදම් ව්‍යාපෘති දෙකකින් සමන්විත එක් වැඩසටහනක් සඳහා වැය ශීර්ෂ 289 යටතේ රුපියල් මිලියන 788.292ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. මීට අමතරව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් රු.මි. 3.9ක වර්ෂාවසාන පරිපූරක වෙන් කිරීමක් ලබා දෙන ලදී.

2014 වර්ෂය සඳහා ඒකාබද්ධ අරමුදලෙන් සංවර්ධනය වෙනුවෙන් වෙන් කරන ලද මුළු මුදල 2013 වර්ෂයට වඩා රුපියල් මිලියන 62.78කින් වැඩි වි ඇති අතර මෙය 8 %ක වර්ධනයකි. රුපියල් මිලියන 788.3ක මුළු ප්‍රතිපාදනවලින් වර්ෂය තුළ රුපියල් මිලියන 707.4 ක් වැය කෙරුණු අතර මෙය වර්ෂය සඳහා වෙන් කළ මුළු මුදලෙන් 89.7% ක ප්‍රතිශතයකි. ව්‍යාපෘති අංක 1 හා 2 හි මූල්‍ය කාර්යසාධනය වෙන් කළ මුදල්වලින් 90% ක් හා 89% ක් වේ. 2014 වර්ෂය සඳහා ව්‍යාපෘති අංක 1 හි හා 2 හි මූලධන වියදම් යටතේ වැය කළ මුදලේ ප්‍රතිශතය පිළිවෙළින් 81.3% ක් හා 60.9% ක් වන අතර පුනරාවර්තන වියදම් යටතේ එය ව්‍යාපෘති දෙක සඳහාම 99.9% බැගින් විය. ක්ෂේත්‍ර මට්ටමේ තාක්ෂණික සේවක සංඛ්‍යාවන්ගේ දැඩි හිඟය මෙන්ම මූල්‍ය අවහිරතා මධ්‍යයේ වුව ද 2014 වර්ෂය සඳහා වෙන් කළ මුළු ප්‍රතිපාදනයෙන් 89.7% ක ප්‍රතිශතයක් වියදම් කිරීම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලත් විශේෂ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැක.

**3.1 : මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් - 2014**

**ව්‍යාපෘතිය - 01- අපනයන භෝග සංවර්ධන වැඩසටහන**

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය - 289<br>වැඩසටහන - 02 | | | |
| අයිතමය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම (%) |
| මූලධන වියදම් | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා සංවර්ධනය | 14,300,000.00 | 11,237,481.00 | 78.58 |
| ගොඩනැගිලි හා ඉදි කිරීම | 10,000,000.00 | 7,282,305.00 | 72.82 |
| යන්ත්‍රෝපකරණ | 800,000.00 | 776,170.00 | 97.02 |
| වාහන | 3,500,000.00 | 3,179,006.00 | 90.83 |
| ස්ථාවර වත්කම් අත් කර ගැනීම | 8,500,000.00 | 8,125,935.00 | 95.60 |
| ලී බඩු හා කාර්යාල භාණ්ඩ | 2,300,000.00 | 2,227,210.00 | 96.84 |
| යන්ත්‍රෝපකරණ | 2,200,000.00 | 2,077,829.00 | 94.45 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | 4,000,000.00 | 3,820,896.00 | 95.52 |
| අපනයන භෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | | | |
| සංවර්ධන ආධාර | 309,000,000.00 | 250,757,365.00 | 81.15 |
| ශක්‍යතා වර්ධනය | | | |
| කාර්ය මණ්ඩල පුහුණු | 1,500,000.00 | 1,063,304.00 | 70.89 |
| **සමස්ත මූලධන වියදම** | **333,300,000.00** | **271,184,085.00** | **81.36** |
| **පුනරාවර්තන වියදම්** | **289,522,000.00** | **289,304,118.00** | **99.92** |
| පුද්ගලික වේතන | 251,393,875.00 | 251,341,072.00 | 99.98 |
| වෙනත් ගාස්තු | 38,128,125.00 | 37,963,046.00 | 99.57 |
| **මුළු වියදම (ව්‍යාපෘතිය-01)** | **622,822,000.00** | **560,488,203.00** | **89.99** |

**ව්‍යාපෘතිය - 02 අපනයන භෝග පර්යේෂණ හා ඒකාබද්ධ පළිබෝධ/රෝග පාලනය**

| අයිතමය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | වියදම (%) |
|---|---|---|---|
| මූලධන පිරිවැය | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා | 5,300,000.00 | 3,274,582.00 | 61.78 |
| ගොඩනැගිලි හා ඉදි කිරීම් | 2,500,000.00 | 1,084,477.00 | 43.38 |
| යන්ත්‍රෝපකරණ | 800,000.00 | 576,110.00 | 72.01 |
| වාහන | 2,000,000.00 | 1,613,995.00 | 80.70 |
| මූලධන වත්කම් අත් කර ගැනීම | 30,000,000.00 | 16,341,358.00 | 54.47 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 2,500,000.00 | 1,918,857.00 | 76.75 |
| යන්ත්‍රෝපකරණ | 11,500,000.00 | 2,400,355.00 | 20.87 |
| ගොඩනැගිලි හා ඉදි කිරීම් | 10,000,000.00 | 7,788,196.00 | 77.88 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන | 6,000,000.00 | 4,233,950.00 | 70.57 |
| ශක්‍යතා සංවර්ධනය | | | |
| කාර්ය මණ්ඩල පුහුණුව | 600,000.00 | 333,111.00 | 55.52 |
| ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම (NARP) ක්‍රියාවට නැංවීම | | | |
| ආයෝජනය | 4,000,000.00 | 3,899,371.00 | 97.48 |
| ආයෝජනය (සාදික්කා පත්‍ර හැලීමේ රෝගය) | 7,450,000.00 | 5,016,468.00 | 67.34 |
| **මුළු මූලධන වියදම** | **47,350,000.00** | **28,864,890.00** | **60.96** |
| **පුනරාවර්තන වියදම** | **118,120,000.00** | **118,051,365.00** | **99.94** |
| පුද්ගලික වේතන | 99,139,608.00 | 99,138,942.00 | 100.00 |
| වෙනත් ගාස්තු | 18,980,392.00 | 18,912,421.00 | 99.64 |
| **මුළු වියදම (ව්‍යාපෘතිය 2)** | **165,470,000.00** | **146,916,255.00** | **88.79** |
| **මුළු වියදම ( ව්‍යාපෘතිය 1 සහ ව්‍යාපෘතිය 2)** | **788,292,000.00** | **707,404,458.00** | **89.74** |

## **3.2** 2014 **වර්ෂයේ ආදායම**

| ආදායම් මූලාශ්‍රය | ඇස්තමේන්තුව(රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) |
|---|---|---|
| රාජ්‍ය ගොඩනැගිලි හා නිවාස කුලී | 1.40 | 1.39 |
| ණය පොළී -වෙනත් | 3.00 | 3.08 |
| දෙපාර්තමේන්තු අලෙවි | 5.00 | 5.21 |
| වෙනත් ලැබීම් | 8.00 | 7.57 |
| වැන්දඹු හා අනත්දරු | 13.00 | 12.71 |
| මූලධන වත්කම් අලෙවිය | 2.00 | 0.08 |
| මුළු | 32.40 | 30.04 |

| උසස් ගිණුම් සීමා | ඇස්තමේන්තුව (රු.) | සත්‍ය වියදම (රු.) |
|---|---|---|
| උපරිම පිරිවැය සීමාව | 30,000,000.00 | 23,771,598.00 |
| අවම ලදු සීමාව | 20,000,000.00 | 23,666,685.00 |
| උපරිම හර ශේෂ සීමාව | 120,000,000.00 | 82,439,778.00 |








# සංවර්ධන

# அபிவிருத்தி

# DEVELOPMENT











## 4. සංවර්ධන අංශය

### 2014 වසරේ විශේෂ සිදුවීම්

- ගැටඹේ ප්‍රධාන කාර්යයාල පරිශ්‍රය තුළ කුළුබඩු නිෂ්පාදන හා පැළ අලෙවි මධ්‍යස්ථානයක් විවෘත කිරීම
- මහනුවර දළදා මාළිගාවට පළමු කුළුබඩු අස්වැන්න පූජා කිරීමේ කුළු බඩු පූජා මංගල්‍යය පැවැත්වීම
- වාර්ෂික උත්සවයක් ලෙස සීනිගම දේවාලයට කුරුඳු පූජා කිරීම
- ලංකාවේ ප්‍රථම ගොරකා ගම්මානය කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රදේශයෙහි විවෘත කිරීම
- රට තුළ ගම්මිරිස් පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ දී ගම්මිරිස් දිනය සමරන ලදී.

### 4.1 හැඳින්වීම

කෘෂි අපනයන භෝග ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා ගොවීන්ට හා වෙනත් පාර්ශ්වකරුවන්ට තාක්ෂණික මාර්ගෝපදේශනය, රෝපන ද්‍රව්‍ය හා මූල්‍ය ආධාර සැපයීම සඳහා දෙපාර්තමේන්තුව තුළ වැදගත් භූමිකාවක් සංවර්ධන අංශය විසින් ඉටු කරනු ලැබේ. මෙම අංශය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) විසින් මෙහෙයවනු ලබන අතර කෘෂි අපනයන භෝග සංවර්ධන වැඩසටහන කළමනාකරණය කොට ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් දෙක බැගින් පවරා දී ඇති අධ්‍යක්ෂවරු (සංවර්ධන) තිදෙනෙකුගේ සහය ද මේ සඳහා ලැබේ. අදාළ දිස්ත්‍රික්කවලට අනුයුක්ත කර ඇති සහකාර අධ්‍යක්ෂවරු, ව්‍යාප්ති නිලධාරී කොට්ඨාස භාර ව්‍යාප්ති නිලධාරීන්, පර්යේෂණ හා සංවර්ධන සහකාරවරු සහ අංශයට අනුයුක්ත කරනු ලැබූ සංවර්ධන නිලධාරීන් සංවර්ධන අංශයේ සේවාවන් හා කාර්යයන් අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා සහයෝගය දක්වති.

සංවර්ධන අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම් හා සේවාවන් ප්‍රධාන වශයෙන් මහනුවර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, ගම්පහ, කෑගල්ල, රත්නපුර, බදුල්ල හා මොණරාගල වැනි තෙත් සහ අන්තර්මාධ්‍ය දේශගුණික කලාප සහිත දිස්ත්‍රික්ක දහහතරක් ආවරණය කරමින් ක්‍රියාත්මක වෙයි. ඒ හැරුණු කොට පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව හා අම්පාර ආදී සාම්ප්‍රදායිකව අපනයන භෝග වගා නොකරන දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවලට කහ, ඉඟුරු, පුවක්, ගම්මිරිස්, කුරුඳු හා කොකෝවා යන භෝග හඳුන්වා දීම හා ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් දියත් කෙරිණි.

### 4.2 භෝග සංවර්ධන වැඩසටහන

2014 වසරේ දී සංවර්ධන අංශය විසින් පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී.

1. නව/නැවත වගා වැඩසටහන
2. ඵලදායීතා සංවර්ධන වැඩසටහන
3. කෘෂි අපනයන භෝග ආශ්‍රිත පසු අස්වනු තාක්ෂණ හා ගුණාත්ම සංවර්ධන වැඩසටහන

2014 වර්ෂය තුළ දී පසු අස්වනු උපදේශන සේවා, වැවිලි උපදේශණ සේවා හා පැළ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මය සහතික කිරීම සඳහා වන පැළ සහතිකකරණ වැඩසටහන, තෝරාගත් ගම්මානවල පොකුරු ගොවිපළ ලෙස කෘෂි අපනයන භෝග වගා කිරීම වැනි විශේෂ වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරිණි. එකී ප්‍රධාන සංවර්ධන වැඩසටහන ප්‍රචලිත කිරීමේ ක්‍රමවේදයක් ලෙස පාර්ශ්වකරුවන් දැනුමත් කිරීම හා පුහුණු කිරීම ද සිදු කෙරිණි.

### 4.3 කෘෂි අපනයන භෝග අංශයේ ප්‍රවර්ධනය සඳහා ආයෝජන ආධාර යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය 1972 දී දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමගම හඳුන්වා දෙනු ලැබූ වැඩසටහනක් වන අතර පසුගිය වසර 40ක කාලය ඇතුළත කිහිප වතාවක්ම සංශෝධනවලට ලක් කරන ලදී. කෘෂි අපනයන භෝගවල නිෂ්පාදනය, ඵලදායීතාව හා ගුණාත්ම සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා 2007 වසරේ දී සංශෝධිත ආධාර යෝජනා ක්‍රමය මේ වන විට ක්‍රියාත්මක වේ.

#### 4.3.1. නව වගා සඳහා අපනයන කෘෂි භෝග ආයෝජන ආධාර යෝජනා ක්‍රමය

නව වගා වැඩසටහන සඳහා මේ වන විට ක්‍රියාත්මක වන අපනයන කෘෂි භෝග ආයෝජන ආධාර ක්‍රමය 4.3.1.1 වගුවෙහි දැක්වෙන අතර නව වගා වැඩසටහනෙහි ප්‍රගතිය 4.3.1.2 වගුවෙහි දැක්වේ.

## 4.3.1.1 වගුව: නව වගා සඳහා අපනයන කෘෂි භෝග ආයෝජන ආධාර ක්‍රමය

| භෝගය | භෝග අතර පරතරය | හෙක්ටයාරයකට පැළ සංඛ්‍යාව | හෙක්ටයාරයට ආයෝජන ආධාර (රු) | ආයෝජන ආධාර ක්‍රමය සඳහා සුදුසුකම් ලබන අවම කාල සීමාව (අවු.) | ආයෝජන ආධාර ක්‍රමය සඳහා සුදුසුකම් ලබන උපරිම කාල සීමාව (අවු.) |
|---|---|---|---|---|---|
| ඇරබිකා කෝපි | 1.8x1.8 m<br>1.8x2.5 m | 3,000<br>2,200 | 65,000.00 | 03 | 05 |
| රොබස්ටා කෝපි | 3.0x3.0 m | 1,100 | 29,900.00 | 03 | 05 |
| කොකෝවා | 3.0x3.0 m | 1,100 | 51,000.00 | 03 | 05 |
| කුරුඳු | 1.2x0.9 m | 9,000 | 101,000.00 | 02.5 | 05 |
| ගම්මිරිස් | 2.4x2.4 m | 1,700 | 50,600.00 | 03 | 05 |
| කරඳමුංගු | 2.0x2.5 m | 2,000 | 55,000.00 | 03 | 05 |
| කරාබු | 6.0x6.0 m | 250 | 20,000.00 | 04 | 06 |
| සාදික්කා | 6.0x6.0 m | 250 | 30,000.00 | 04 | 06 |
| වැනිලා | 2.4x1.5 m | 2,750 | 16,500.00 | 03 | 05 |
| පැඟිරි | 0.9x0.9 m<br>0.6x0.6 m | 17,500<br>30,000 | 30,625.00 | මාස 8 | 02 |
| සේර | 0.6x0.6 m | 30,000 | 30,625.00 | මාස 8 | 02 |

## 4.3.1.2 වගුව: නව වගා වැඩසටහනේ ප්‍රගතිය – 2014

| භෝගය | ඉලක්කය | ලද අයදුම්පත් | | නිර්දේශිත අයදුම්පත් | | නිකුත් කළ අවසරපත් ගණන | | වගා කළ වපසරිය | | ආධාර ගෙවූ වපසරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ. | හෙක්. | සංඛ. | හෙක්. | සංඛ. | හෙක්. | සංඛ. | හෙක්. | සංඛ. | හෙක්. |
| කුරුඳු | 717 | 6463 | 2504.0 | 5010 | 1910.7 | 3286 | 1170.0 | 2805 | 982.5 | 1642 | 663.7 |
| ගම්මිරිස් | 720 | 14248 | 4140.6 | 9536 | 2323.3 | 5369 | 1240.7 | 4295 | 922.2 | 911 | 237.3 |
| කරඳමුංගු | 40 | 36 | 24.3 | 23 | 18.7 | 18 | 12.1 | 11 | 10.8 | 2 | 1.2 |
| කෝපි | 60 | 288 | 111.6 | 211 | 88.1 | 171 | 60.2 | 123 | 50.3 | 52 | 14.9 |
| කොකෝවා | 40 | 1071 | 461.1 | 834 | 359.1 | 816 | 271.1 | 755 | 287.0 | 106 | 34.2 |
| කරාබු | 50 | 227 | 89.3 | 169 | 72.4 | 125 | 53.8 | 520 | 49.6 | 4 | 1.4 |
| සාදික්කා | 80 | 572 | 196.0 | 372 | 122.4 | 313 | 95.6 | 678 | 92.4 | 69 | 22.5 |
| වැනිලා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 26 | 4.0 | - | - |
| පැඟිරි | 10 | 98 | 61.6 | 71 | 42.3 | 18 | 11.6 | 32 | 24.5 | 4 | 2.6 |
| පුවක් | 250 | 743 | 276.5 | 585 | 214.1 | 477 | 140.9 | 692 | 168.9 | - | - |
| ඉඟුරු | 320 | 5324 | - | 4896 | 651.1 | 3287 | 436.7 | 1591 | 181.9 | - | - |
| කහ | 70 | 604 | - | 525 | 27.3 | 314 | 16.9 | 230 | 16.9 | - | - |
| බුලත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 93 | 2.4 | - | - |
| එකතුව | 2357 | 29674 | 7865 | 22232 | 5829.5 | 14194 | 3509.6 | 11851 | 2794.7 | 2790 | 977.8 |

### 4.4 ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන

ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන හඳුන්වා දෙන ලද්දේ අඩු භෝග ඝනත්වය හා දුර්වල භෝග කළමනාකරණය හේතුවෙන් අඩු නිෂ්පාදනයක් පෙන්නුම් කරන කෘෂි අපනයන වගාවල ඒකක වපසරිය වැඩි කිරීම අරමුණු කර ගනිමිනි. දැනට පවතින ගම්මිරිස්, කුරුඳු, කොකෝවා, කෝපි, කරාබු හා සාදික්කා වගා වැඩි දියුණු කිරීම සඳහා වගාකරුවන්ට තාක්ෂණික උපදෙස් ලබා දීම, පාළු සිටුවීම සඳහා නොමිලේ රෝපණ ද්‍රව්‍ය සැපයීම හා අවුරුදු තුනක කාලයක් සඳහා මූල්‍ය ආධාර පිරිනැමීම මෙමගින් සිදු කෙරේ. මෙම ආධාර යෝජනා ක්‍රමයට සුදුසුකම් ලැබීම සඳහා පාළු සිටුවීම, මනා පාංශු සංරක්ෂණ ක්‍රම, භෝග හා ආධාරක ශාක කප්පාදුව, කාබනික පොහොර භාවිතය හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ආදී යහපත් කෘෂිකාර්මික පිලිවෙත් අනුගමනය කළ යුතු වේ. ආධාර යෝජනා ක්‍රමයේ විස්තර 4.4.1 වගුවේ දැක්වේ.

**4.4.1 වගුව : ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා ආධාර යෝජනා ක්‍රමය (එක් එක් භෝගය සඳහා පිරිනමන ආධාරය හෙක්ටයාරට (රුපියල්))**

| භෝගය | පළමු වසර (රු.) | දෙවැනි වසර (රු.) | තෙවන වසර (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|
| කුරුඳු | 13,000.00 | 13,000.00 | 11,500.00 | 37,500.00 |
| ගම්මිරිස් | 13,000.00 | 13,000.00 | 11,500.00 | 37,500.00 |
| කොකෝවා | 13,000.00 | 13,000.00 | 4,000.00 | 30,000.00 |
| කෝපි | 13,000.00 | 13,000.00 | 4,000.00 | 30,000.00 |
| කරාබු | 6,500.00 | 6,500.00 | 2,000.00 | 15,000.00 |
| කරදමුංගු | 13,000.00 | 13,000.00 | 4,000.00 | 30,000.00 |
| සාදික්කා | 6,500.00 | 6,500.00 | 2,000.00 | 15,000.00 |

ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනේ ඉලක්කය හා 2014 වසර තුළ දී ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද භූමි ප්‍රමාණයේ ප්‍රගතිය 4.4.2 වගුව හා 4.4.3 වගුවෙහි දැක්වේ.

**4.4.2 වගුව: ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනේ ඉලක්ක**

| භෝගය | කුරුඳු | ගම්මිරිස් | කෝපි | කොකෝවා | කරදමුංගු | කරාබු | සාදික්කා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| ඉලක්ක(හෙක්.) | 775 | 980 | 20 | 60 | 20 | 80 | 55 | 1990 |

**4.4.3 වගුව: ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ විවිධ දිස්ත්‍රික්කවල සංවර්ධනය කරන ලද භූමි ප්‍රමාණයන් (හෙක්.)**

| දිස්ත්‍රික්කය | කුරුඳු | ගම්මිරිස් | කෝපි | කොකෝවා | කරදමුංගු | කරාබු | සාදික්කා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| කුරුණෑගල | 14.3 | 97.9 | 0.9 | 5.0 | 0 | 1.2 | 1.2 | 120.5 |
| මාතලේ | 26.6 | 117.8 | - | 4.0 | - | - | - | 148.4 |
| මහනුවර | 2.0 | 181.2 | 5.8 | 1.2 | - | 28.1 | 30.1 | 248.4 |
| නුවර එළිය | - | 44.6 | 5.6 | - | 4.0 | 2.8 | - | 57.0 |
| බදුල්ල | 17.7 | 241.3 | - | - | - | - | - | 259.0 |
| මොණරාගල | 8.0 | 49.4 | - | 6.9 | - | - | - | 64.3 |
| හම්බන්තොට | 97.4 | 31.2 | - | - | - | - | - | 128.6 |
| මාතර | 188.7 | - | - | - | - | - | - | 188.7 |
| ගාල්ල | 406.0 | 0.1 | - | - | - | - | - | 406.1 |
| කළුතර | 103.0 | - | - | - | - | - | - | 103.0 |
| කොළඹ | 7.0 | 3.7 | - | - | - | - | - | 10.7 |
| ගම්පහ | 15.5 | 44.6 | - | - | - | - | - | 60.1 |
| කෑගල්ල | 7.4 | 40.4 | - | - | - | 9.6 | - | 59.8 |
| රත්නපුර | 59.8 | 68.2 | - | - | - | - | - | 128.0 |
| එකතුව | 953.4 | 920.4 | 12.3 | 17.1 | 4.0 | 41.7 | 31.3 | 1980.2 |

## 4.5. පසු අස්වනු සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපනයන කෘෂි ආධාර යෝජනා ක්‍රමය

අපනයන කෘෂි භෝග නිෂ්පාදනවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා 1998 වසරේ දී පසු අස්වනු උපදේශන සේවා ඒකකය පිහිටුවන ලද අතර සමාලෝචිත වර්ෂය තුළ ද එම සේවාවන් ක්‍රියාවට නංවන ලදී. ආයෝජන ආධාර යෝජනා ක්‍රමය 2007 වසරේ දී සංශෝධනයට ලක් කෙරුණු අතර විවිධ මට්ටමෙන් ක්‍රියාකාරී වන පාර්ශ්වකරුවන් සඳහා යෝග්‍ය වන පරිදි පැකේජ තුනක් හඳුන්වා දෙන ලදී. මෙම ආධාර යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණු වනුයේ අන්තර්ජාතික වෙළෙඳපොළවල තරඟයට මුහුණ දීම සඳහා නිෂ්පාදිතයේ ගුණාත්මය පවත්වා ගැනීම, නිෂ්පාදිත විවිධාංගීකරණය, අගය එකතු කිරීම හා අපනයන කෘෂි භෝග අලෙවිය සඳහා පහසුකම් සැපයීමයි. ආධාර යෝජනා ක්‍රම තුනෙහි විස්තර පහත පරිදි වේ.

### 1) කණ්ඩායම් පිරිසැකසුම් ඒකක

මෙම ආධාර යෝජනා ක්‍රමයට සුදුසුකම් ලබන්නේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගොවි සංවිධාන වන අතර මේ යටතේ නිෂ්පාදන පිරිසැකසුම්කරණය සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ නොමිලයේ සපයනු ලැබේ. මෙම සැකසුම් ඒකක පාලනය කිරීමේ හා යන්ත්‍රෝපකරණ පරිහරණය කිරීමේ වගකීම ගොවි සංවිධාන විසින් දැරිය යුතු ය. තව ද සියලුම යන්ත්‍රෝපකරණ රඳවා තැබීමට අවශ්‍ය පිරිසැකසුම් ගොඩනැඟිලි හඳුනා ගැනීමේ හෝ ගොඩනැඟීමේ කාර්යය ද ගොවි සංවිධානය විසින් සිදු කළ යුතු ය. මෙම පිරිසැකසුම් මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරවීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙමින් දෙපාර්තමේන්තුව ගොවි සංවිධානවලට සහාය ලබා දේ.

2) **මධ්‍යම පිරිසැකසුම් ඒකක**

මෙම ආධාර ක්‍රමය හඳුන්වා දී ඇත්තේ රුපියල් මිලියන දෙකකට ඉහළ ආයෝජනයක් කරමින් මහා පරිමාණ පිරිසැකසුම්කරණ වැඩපිළිවෙළක් ආරම්භ කිරීමේ හැකියාව ඇති අයදුම්කරුවන් සඳහා ය. මෙම ආධාර ක්‍රමය යටතේ රුපියල් මිලියන 0.5ක උපරිමයකට යටත්ව මුළු ආයෝජනයෙන් 25%ක් වන මුදල් ප්‍රදානයක් ආයෝජකයා හට ලබා ගත හැක. මධ්‍යස්ථානය නඩත්තු කිරීමේ හා ලාභ ලැබීමේ සම්පූර්ණ අධිකාරිය ආයෝජකයා සතු වේ.

3) **පුද්ගලික පිරිසැකසුම් ඒකක**

කෘෂි අපනයන භෝග පසු අස්වනු සැකසීම සඳහා පුද්ගලික සැකසුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට කැමති අයදුම්කරුවන් හට මෙම ආධාර ක්‍රමය සඳහා ඉල්ලුම් කළ හැක. ඔවුහු, දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අදාළ යන්ත්‍රෝපකරණ හෝ අස්වනු සැකසීමේ පහසුකම් සඳහා මුදල් ආධාර ලැබීමට සුදුසුකම් ලබති. මේ පිළිබඳ විස්තර 4.5.1 වගුවේ දැක්වේ.

**4.5.1වගුව : පසු අස්වනු ක්‍රියාකාරකම් සඳහා ආධාර යෝජනා ක්‍රම**

| අංකය | ආයෝජන විධිය | ඒකකයට ආධාර මුදල (රු.) |
|---|---|---|
| 01 | ගම්මිරිස් පිරිසැකසුම්කරණය<br>ගම්මිරිස් පිරිසැකසුම්කරණය<br>අ) උණුදිය ප්‍රතිකාරක කට්ටලය<br>ආ) සුදු ගම්මිරිස් පිරිසැකසුම් යන්ත්‍රය<br>ඇ) බීජ වෙන්කරන යන්ත්‍රය<br>➢ අතින් ක්‍රියා කරවන<br>➢ විදුලියෙන් ක්‍රියා කරවන<br>➢ එන්ජිමෙන් ක්‍රියා කරවන<br>ඈ) කොළ ගම්මිරිස් බීජ තේරීමේ යන්ත්‍රය<br>ඉ) ශ්‍රේණිකරණ යන්ත්‍රය | <br><br>1,000<br>25,000<br><br>10,000<br>20,000<br>22,500<br>8,000<br>15,000 |
| 02 | කෝපි පිරිසැකසුම්කරණය<br>➢ පොතු ගලවන යන්ත්‍රය<br>➢ අතින් ක්‍රියා කරවන<br>➢ යන්ත්‍රානුසාරී/විදුලියෙන් ක්‍රියාකරන<br>කෝපි බීජ ශුද්ධ කිරීමේ යන්ත්‍රය | <br><br>5,000<br>15,000<br>10,000 |
| 03 | කොකෝවා පිරිසැකසුම්කරණය<br>➢ 2''x2''x2'' ට වැඩි පැසවීමේ පෙට්ටි 3ක් (I ශ්‍රේණියේ දැව)<br>➢ තැටි මත පැසවීම | <br>4,500 (පෙට්ටියකට1500)<br>6,000 |
| 04 | වාෂ්පශීලී තෙල් ආසවන ඒකක<br>➢ අළුතින් ඉදි කිරීම සඳහා<br>➢ අළුත්වැඩියාව සඳහා | <br>75,000<br>75,000 (උපරිම) |
| 05 | පිරිසැකසුම් මධ්‍යස්ථානය – අවම වපසරිය වර්ග අඩි 400<br>➢ කුරුඳු<br>➢ වෙනත් භෝග | <br>40,000<br>25,000 |
| 06 | වියළුම් ඒකක සඳහා<br>➢ බහුකාර්ය වියළන (ධාරිතාව කි.ග්‍රෑ. 250 හෝ ඊට වැඩි)<br>➢ සූර්යතාපන වියළන (වර්ග අඩි 100)<br>➢ ආරක්ෂිත කමත<br>➢ බිම් මට්ටමට ඉහළින් ස්ථාපිත වියළන | <br>100,000<br>10,000 (උපරිම)<br>25,000<br>උපරිම වර්ග අඩියකට රු. 25 (අවම වර්ග අඩි 200) |
| 07 | වැනිලා – පදම් කිරීම ( අවම ධාරිතාව - දිනකට කි.ග්‍රෑ. 20 ) | 10,000 |

**4.5.2 වගුව : 2014 වසර තුළ පසු අස්වනු ආධාර යෝජනා ක්‍රමයේ ප්‍රගතිය**

| අයිතමය | නිකුත් කළ ඒකක ගණන |
|---|---|
| පිරිසැකසුම් මධ්‍යස්ථාන | 55 |
| තෙල් ආසවන ඒකක | 14 |
| ගම්මිරිස් බීජ වෙන්කරන යන්ත්‍ර | 27 |
| උණුදිය ප්‍රතිකාරක කට්ටල | 29 |
| වියලන යන්ත්‍ර | 7 |
| ආරක්ෂිත කමත් | 2 |
| ශ්‍රේණි කිරීමේ යන්ත්‍ර | 1 |
| අමු ගම්මිරිස් බීජ ශ්‍රේණි කිරීමේ උපකරණ | 1 |
| කෝපි පොතුගලවන යන්ත්‍ර | 3 |
| සුදු ගම්මිරිස් නිෂ්පාදන යන්ත්‍ර | 12 |
| වෙනත් | 7 |
| කුරුඳු තැලුම් කට්ටල | 1100 |
| එකතුව | 1258 |

**4.6 වැවිලි අංශයේ භෝග සංවර්ධන වැඩසටහන**

වැවිලි අංශයේ පවතින සම්පත් උපයෝගී කරගෙන අපනයන කෘෂි භෝග වගාවන් විශාල පරිමාණයේ වැවිලි ලෙස පුළුල් කිරීමේ අරමුණින් යුතුව අපනයන කෘෂි භෝග සංවර්ධන වැඩසටහන 1998 වසරේ දී හඳුන්වා දෙන ලදී. උපරිම ලාභ ලැබීම හා අවදානම් අවම කිරීම සඳහා වැවිලි අංශය තුළ කෘෂි අපනයන භෝග සඳහා භෝග විවිධාංගීකරණ වැඩසටහන සඳහා විශේෂ සැලකිල්ලක් යොමු කරන ලදී. වැවිලි කළමනාකරුවන්ට ඔවුන්ගේ කෘෂි අපනයන භෝග සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සඳහා පර්යේෂකයින් ඇතුළු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහාය අවශ්‍ය ඕනෑම මොහොතක ලබා ගත හැකිය. 2014 වසරේ දී වැවිලි අංශයේ භෝග සංවර්ධන වැඩසටහන යටතේ වගා කරන ලද බිම් ප්‍රමාණය පහත වගුවෙන් නිරූපණය වේ.

**4.6.1 වගුව: 2014 වසරේ දී වැවිලි අංශයේ භෝග සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද භෝග**

| දිස්ත්‍රික්කය | භෝගය (හෙක්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කුරුඳු | ගම්මිරිස් | සාදික්කා | කරාබු | කෝපි | කොකෝවා | කරදමුංගු | පුවක් |
| මහනුවර | 21.2 | 40.0 | 1.4 | 23.2 | 8.7 | - | - | 4.38 |
| මාතලේ | 4.8 | 1.34 | - | 12.8 | 3.75 | 10.25 | - | - |
| නුවර එළිය | 1.4 | 7.9 | - | - | 19.7 | - | - | 1.2 |
| කුරුණෑගල | 15.3 | - | - | - | - | - | - | 1.0 |
| කෑගල්ල | 36.2 | - | - | - | - | - | - | - |
| රත්නපුර | 19.55 | 9.0 | - | - | - | - | - | 0.6 |
| ගම්පහ | 1.2 | 1.0 | - | - | - | - | - | 0.4 |
| කොළඹ | 4.5 | - | - | - | - | - | - | - |
| කළුතර | 6.0 | - | - | - | - | - | - | - |
| බදුල්ල | 8.0 | 56.08 | - | - | - | 1.0 | 5.5 | 17.28 |
| මොණරාගල | - | - | - | - | - | 5.4 | - | - |
| ගාල්ල | 23.05 | - | - | - | - | - | - | - |
| මාතර | 30.0 | - | - | - | - | - | - | - |
| **එකතුව** | 171.2 | 115.32 | 1.4 | 36.00 | 32.15 | 16.65 | 5.5 | 24.86 |

ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන යටතේ අංශය තුළ කුරුඳු හෙක්. 7.2ක්, ගම්මිරිස් හෙක්ටයාර 7.2ක්, කරාබු හෙක්ටයාර 4.0ක්, කොකෝවා හෙක්ටයාර 10.0ක්, කෝපි හෙක්ටයාර 2.0ක් සංවර්ධනය කරනු ලැබ තිබේ.

**4.7. රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම**

නව වගා හා ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ඉහළ ගුණාත්මයකින් යුත් රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම මෙම වැඩසටහනෙහි අරමුණ යි. සංවර්ධන ආධාර යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලැබූ හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි ඉඩම් සකස් කිරීම, පාංශු සංරක්ෂණය හා වෙනත් ක්ෂේත්‍ර කටයුතු සාර්ථකව සම්පූර්ණ කරන ලද සියලුම ගොවීන්ට රෝපණ ද්‍රව්‍ය නොමිලේ සපයනු ලැබිණි. රෝපණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන පැළ තවාන් එකොළහක ද (4.7.1 වගුව) දෙපාර්තමේන්තු ව්‍යාප්ති නිලධාරි මණ්ඩලයේ සමීප අධීක්ෂණය යටතේ, ලියාපදිංචි වූ පුද්ගලික පැළ තවාන්වල ද සකස් කරනු ලැබිණි. 2014 වසර ඇතුළත පුද්ගලික පැළ තවාන් 427ක් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී තිබේ. 4.7.2 වගුවෙහි පුද්ගලික තවාන්වල ව්‍යාප්තිය දැක්වේ. දිවි නැඟුම හා අනෙකුත් ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය වූ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලද්දේ ද යට කී පැළ තවාන්ම වේ.

**4.7.1 වගුව: දිස්ත්‍රික්ක අනුව දෙපාර්තමේන්තු පැළ තවාන්වල ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | රජයේ පැළ තවාන් ගණන |
|---|---|
| කුරුණෑගල | 03 |
| මාතලේ | 01 |
| නුවර එළිය | 02 |
| මාතර | 01 |
| ගම්පහ | 01 |
| කෑගල්ල | 01 |
| හම්බන්තොට | 01 |
| මහනුවර | 01 |
| **එකතුව** | **11** |

**4.7.2 වගුව: දෙපාර්තමේන්තුව යටතේ විවිධ දිස්ත්‍රික්කවල ලියාපදිංචි වී ඇති පුද්ගලික පැළ තවාන් ගණන**

| දිස්ත්‍රික්කය | පැළ තවාන් ගණන | දිස්ත්‍රික්කය | පැළ තවාන් ගණන |
|---|---|---|---|
| කුරුණෑගල | 19 | මාතර | 41 |
| මාතලේ | 26 | ගාල්ල | 42 |
| මහනුවර | 48 | කොළඹ | 15 |
| නුවරඑළිය | 30 | ගම්පහ | 14 |
| බදුල්ල | 46 | කෑගල්ල | 28 |
| මොණරාගල | 39 | රත්නපුර | 34 |
| හම්බන්තොට | 25 | කළුතර | 20 |
| **එකතුව** | | | **427** |

2012.08.20 දින සිට බල පැවැත්වෙන පරිදි සංශෝධනය කරන ලද හා 2014 වසරේ දී පැවති රෝපණ ද්‍රව්‍ය මිල ගණන් 4.7.3 වගුවෙහි දැක්වේ.

**4.7.3 වගුව: බීජ හා රෝපණ ද්‍රව්‍යවල මිල ගණන් (රු)**

| භෝග | බීජ ද්‍රව්‍ය (රු.) | රෝපණ ද්‍රව්‍ය (රු. ) |
|---|---|---|
| කොකෝවා | ගෙඩියක් 20.00 | පැළයක් 10.00 |
| ගම්මිරිස් | පුරුක් ඡේදක තුනක් 0.20 | පැළයක් 16.00 |
| කෝපි | ඉඳුණු නැවුම් කෝපි බීජ කිලෝ එකක් 80.00<br>පාච්මන්ට්, වියළි කෝපි බීජ කිලෝ එකක් 150.00 | පැළයක් 10.00 |
| කුරුඳු | බීජ කිලෝ ග්‍රෑමයක් 80.00 | පැළයක් 9.00 |
| කරදමුංගු | - | මොරෙයියෙක් 10.00 |
| පුවක් | බීජයක් 2.00 | පැළයක් 9.00 |
| වැනිලා | මීටර් 1 ක් දිග දඬු කැබැල්ලක් 5.00 | |
| කරාබු | | විශාල පැළයක් 40.00 |
| සාදික්කා | බීජයක් 10.00 | විශාල පැළයක් 60.00 |
| ගොරකා | - | බද්ධ කළ 80.00<br>බීජ පැළ 15.00 |
| කිතුල් | - | විශාල 10.00<br>කුඩා 4.00 |
| පැඟිරි | - | මොරෙයියෙක් 0.75 |
| සේර | - | මොරෙයියෙක් 0.75 |

**4.8. පැළ සහතිකකරණ වැඩසටහන**

වගාකරුවන්ට සහතික කළ පැළ සැපයීම දෙපාර්තමේන්තුව විසින් අනිවාර්ය අවශ්‍යතාවක් බවට පත් කරනු ලැබ තිබේ. ඉහළ ඵලදායීතාවක් සහිත වගාවක් සඳහා ඉහළ ගුණාත්මයකින් යුත් රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම ඉතා වැදගත් වේ. අපනයන කෘෂි භෝග සංවර්ධන වැඩසටහන මගින් ඉහළ ගුණාත්මයකින් යුත් රෝපණ ද්‍රව්‍ය සපයනු ලබන බව තහවුරු කර ගැනීම සඳහා අධ්‍යක්ෂවරයකු, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයකු හා/හෝ පර්යේෂණ නිලධාරියකු සහ ව්‍යාප්ති නිලධාරියකු, හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන නිලධරයෙකු එක් එක් පැළ තවානට ගොස් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද ප්‍රමිතීන් අනුගමනය කරමින් පැළ සහතිකකරණය සිදු කරනු ලැබේ. විස්තර 4.8.1 වගුවෙහි දැක්වේ.

**4.8.1 වගුව: 2014 වසරේ දී සහතිකකරණය ලබා දුන් පැළ පිළිබඳ විස්තර**

| භෝගය | සහතික කළ පැළ ගණන |
|---|---|
| ගම්මිරිස් | 2,017,434 |
| කෝපි | 108,600 |
| කොකෝවා | 333,720 |
| කුරුඳු | 12,371,520 |
| පුවක් | 282,246 |
| කරාබු | 12,625 |
| සාදික්කා | 16,824 |
| **මුළු එකතුව** | **15,142,969** |

## 4.9. අපනයන කෘෂි භෝග ආධාර යෝජනා ක්‍රමය යටතේ පැළ බෙදා හැරීම

සමාලෝචිත වර්ෂය තුළ ආධාර යෝජනා ක්‍රම යටතේ බෙදා හරින ලද පැළ පිළිබඳ විස්තර 4.9.1. වගුවෙන් නිරූපණයවේ.

**4.9.1 වගුව: රෝපණ ද්‍රව්‍ය නිකුත් කිරීම**

| භෝගය | නව වගා | වෙනත් | එකතුව |
|---|---|---|---|
| කුරුඳු | 8,383,785 | 3,520,969 | 11,904,754 |
| ගම්මිරිස් | 1,310,092 | 547,157 | 1,857,249 |
| කෝපි | 369,960 | 29,364 | 399,324 |
| කොකෝවා | 22,270 | 24,270 | 46,540 |
| පුවක් | 211,168 | 95,105 | 306,273 |
| කරාබු | 12,685 | 8,937 | 21,622 |
| සාදික්කා | 28,616 | 4,027 | 32,643 |
| වෙනත් | 6,610 | 35,357 | 41,967 |
| **එකතුව** | **10,345,186** | **4,265,186** | **14,610,372** |

## 4.10. වෙනත් අපනයන කෘෂි භෝග සංවර්ධනය

දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනෙන ප්‍රධාන අපනයන භෝගවලට අමතරව විදේශ විනිමය ආදායම් පුළුල් කර ගැනීමේ විභවතාවක් පෙන්නුම් කරන ඇතැම් භෝග සම්බන්ධයෙන් ද අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරයි. මෙම වැඩසටහන යටතේ හඳුනාගන්නා ලද භෝග වනුයේ වැනිලා, සේර, ගොරකා හා කිතුල් වේ. ඊට අමතරව, ඉඟුරු හා කහ යන භෝග ද 2007 වසරේ දී මෙම වර්ගීකරණය යටතට ඇතුළත් කරන ලදී. මෙම වැඩසටහන 2014 වසර තුළ දී ද ක්‍රියාත්මක කරන ලද අතර මේ යටතේ ගොවීන්ට රෝපණ ද්‍රව්‍ය හා අදාළ තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී. වසර තුළ දී, ගොවීන් අතර ඉඟුරු බීජ අල කිලෝ 297,875ක් ද කහ බීජ අල 71,655ක් ද බෙදා දෙන ලදී.

**4.10.1 වගුව: වැනිලා දඬු කැබලි බෙදා දීමේ ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | බෙදා හරින ලද දඬු කැබලි ගණන |
|---|---|
| මාතලේ | 2,550 |
| මහනුවර | 1,700 |
| එකතුව | 4,250 |

සුළු පරිමාණ ගොවීන් සඳහා අතිරේක ආදායමක් ලෙස වැනිලා දඬු කැබලි ගෙවතු වගා සඳහා බෙදා දෙන ලදී (4.10.1 වගුව).

**4.11 කාබනික වගා වැඩසටහන**

ජාත්‍යන්තර වෙළෙඳපොළේ කාබනික ආහාර සඳහා දිනෙන් දිනම වැඩිවෙමින් පවතින ඉල්ලුම සලකමින් දෙපාර්තමේන්තුව විසින් 1998 වසරේ දී කාබනික ආහාර ප්‍රවර්ධනය ආරම්භ කරන ලදී. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන භූමිකාව වූයේ, කාබනික වගාව හා ඊට අදාළ මූලධර්ම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම, තෝරාගත් ගම්මාන තුළ වගා ආදර්ශන පිහිටුවීම, වාර්තා තබා ගැනීම සඳහා ගොවීන් දිරිමත් කිරීම, කාබනික පොහොර භාවිතය හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය ආදිය යි. වගාකරුවන් , ගැනුම්කරුවන් / අපනයනකරුවන්ට හඳුන්වාදීම මගින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සකසා දෙන ලදී.

**4.11.1 වගුව 2014 වසරේ දී කාබනික වගා සංවර්ධන වැඩසටහන යටතේ ඇති කළ වගා බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | භෝගය | බිම් ප්‍රමාණය (හෙක්) |
|---|---|---|
| කුරුණෑගල | ගම්මිරිස්/කුරුඳු | 14.4 |
| කළුතර | ගම්මිරිස්/කුරුඳු | 20.0 |
| මහනුවර | ගම්මිරිස්/සාදික්කා/කරාබු | 0.1 |
| හම්බන්තොට | කුරුඳු | 3.6 |
| ගාල්ල | කුරුඳු | 11.1 |
| එකතුව | | 49.2 |

**4.12 ගොවි පුහුණුව**

යාවත්කාලීන කරන ලද තාක්ෂණික තොරතුරු මගින් ගොවීන්ගේ හා වෙනත් පාර්ශ්වකරුවන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහා හා කෘෂි අපනයන භෝග වගා කිරීමේ දී හා පිරිසැකසුම් කිරීමේ දී දියුණු කළ කෘෂිකාර්මික පිලිවෙත් වලට අනුගත වීම සඳහා ගොවීන්ව උනන්දු කරවනු පිණිස එක් එක් දිස්ත්‍රික්කය භාර සහකාර අධ්‍යක්ෂවරයා විසින් ඔහුගේ සහායක තාක්ෂණ නිලධාරි මණ්ඩලය සමග ගොවි පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම සිදු කරනු ලැබීය. පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්පත්දායකයින් හා වෙනත් සේවාවන් අවශ්‍ය වූ කල්හි පර්යේෂණ අංශයෙන් ලබා ගන්නා ලදී. සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද පුහුණු පන්ති පිළිබඳ විස්තර 4.12.1 වගුවෙන් දැක්වේ.

**4.12.1 වගුව : 2014 වර්ෂයේ ගොවි පුහුණු ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | වැඩසටහන් ගණන | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| | යහපත්කෘෂිකාර්මික පිළිවෙත් | යහපත් කළමනාකරණ පිළිවෙත් | |
| ගොවි පුහුණු පංති | 2193 | 325 | 69,342 |
| ක්ෂේත්‍ර දින | 456 | 91 | 17,140 |

### 4.12.2 කුරුඳු තැළුම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන්

කුරුඳු කර්මාන්තය තුළ පළපුරුදු කුරුඳු තැළුම් ශිල්පීන්ගේ හිඟය දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. එබැවින්, දෙපාර්තමේන්තුව විසින් 1988 වසරේ දී ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස කුරුඳු තැළුම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනක් හඳුන්වා දුන් අතර එය 2014 වසරේ දී ද සිදු කරන ලදී. ප්‍රාදේශීය මට්ටමින් තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා දින පහක සේවාස්ථ පුහුණුවක් ලබා දුන් අතර පුහුණු වැඩසටහන සාර්ථකව නිම කළ සියලු දෙනාටම කුරුඳු තැළීම සඳහා අවශ්‍ය උපකරණ කට්ටලය බැගින් ලබා දෙන ලදී. කුරුඳු තැළුම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනෙහි ප්‍රගතිය පහත වගුවෙන් දැක්වේ. (4.12.2.1).

**4.12.2.1 වගුව : කුරුඳු තළන්නන් පුහුණු කිරීමේ වැඩසටහනෙහි ප්‍රගතිය**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් ගණන |
|---|---|
| කෑගල්ල | 30 |
| ගම්පහ | 104 |
| රත්නපුර | 113 |
| කොළඹ | 24 |
| කළුතර | 110 |
| ගාල්ල | 150 |
| බදුල්ල | 72 |
| මාතලේ | 31 |
| නුවර-එළිය | 07 |
| හම්බන්තොට | 92 |
| මාතර | 183 |
| කුරුණෑගල | 12 |
| මහනුවර | 53 |
| මොණරාගල | 27 |
| **එකතුව** | **1008** |

### 4.12.3 මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය 4.12.3.1 වගුවෙහි දැක්වේ.

**4.12.3.1 වගුව : මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්වල විස්තර**

| පුහුණුව | පුහුණුලාභියා | පුහුණු වැඩසටහන් ගණන | පුහුණුලාභීන් ගණන | පුහුණු දින ගණන | මිනිස් දින ගණන |
|---|---|---|---|---|---|
| නිලධාරී පුහුණුව | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් | 27 | 773 | 48 | 1338 |
| නිලධාරී පුහුණුව | වෙනත් ආයතනවල නිලධාරීන් | 17 | 471 | 27 | 730 |
| ගොවි පුහුණුව | ගොවීන් හා වෙනත් පාර්ශ්වකරුවන් | 13 | 340 | 15 | 436 |
| සමුළු හා වැඩමුළු | අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් | 13 | 688 | 13 | 688 |
| එකතුව | | 70 | 2272 | 103 | 3192 |

මීට අමතරව, මාතලේ පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කරන ලද පුහුණුකරුවන් විසින් විවිධ ස්ථානවල පුහුණු වැඩසටහන් 17ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් දින 29ක් (මිනිස් දින 730ක් ආවරණය කරමින්) පැවැත්වුණු අතර පුහුණු වැඩසටහන්වලට පුහුණුලාභීහු 471ක් සහභාගී වූහ.

### 4.13 ආදර්ශන පිහිටුවීම

භෝග අස්වැන්න වැඩි කර ගැනීම හා නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ගොවීන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ දැනුවත් කරනු පිණිස එක් එක් ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසය තුළ ක්ෂේත්‍ර ආදර්ශන පිහිටුවා පවත්වාගෙන යන ලදී. මෙකී ක්ෂේත්‍ර ආදර්ශන, පුහුණු වැඩසටහන් මෙන්ම තාක්ෂණය බෙදා හැරීම සඳහා ද උපයෝගී කර ගන්නා ලදී. පිහිටුවන ලද ආදර්ශන පිළිබඳ විස්තර 4.13.1 වගුවෙහි දැක් වේ.

**4.13.1 වගුව : 2014 වසර තුළ දී විවිධ දිස්ත්‍රික්කවල පිහිටුවා පවත්වාගෙන යන ලද ආදර්ශන ගණන**

| දිස්ත්‍රික්කය | ආදර්ශන ගණන |
|---|---|
| කුරුණෑගල | 4 |
| මාතලේ | 1 |
| මහනුවර | 20 |
| නුවර එළිය | 1 |
| බදුල්ල | 1 |
| මොණරාගල | 4 |
| හම්බන්තොට | 0 |
| මාතර | 6 |
| ගාල්ල | 0 |
| කොළඹ/කළුතර | 0 |
| ගම්පහ | 15 |
| කෑගල්ල | 18 |
| රත්නපුර | 6 |
| එකතුව | 76 |

### 4.14. වෙනත් සංවර්ධන වැඩසටහන්

ඌව වෙල්ලස්ස කොකෝවා සංවර්ධන ව්‍යාපෘතිය, සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට අපනයන කෘෂි භෝග හඳුන්වා දීම, කුඩා වැවිලි සංවර්ධන වැඩසටහන, කිතුල් සංවර්ධන වැඩසටහන හා ගම්මිරිස් සෙවණ කප්පාදු කිරීමේ සතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් 2014 වසර තුළ දී ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩසටහන් පහතින් විස්තර කර ඇත.

#### 4.14.1. ඌව වෙල්ලස්ස කොකෝවා සංවර්ධන ව්‍යාපෘතිය

ඌව පළාතේ මොණරාගල හා බදුල්ල දිස්ත්‍රික්කවල රබර් වගාව යටතේ කොකෝවා හෙක්. 300ක් වගා කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. දීර්ඝ කාලීන නියඟයක් පැවතිය ද, කොකෝවා හෙක්.230.6ක් සාර්ථකව වගා කිරීමට හැකියාව ලැබිණි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා කොකෝවා බීජ පැළ 344,200 නිෂ්පාදනය කරන ලදී. ගොවින් 1154 දෙනෙකු, තවාන්කරුවන් 35 දෙනෙකු හා නිලධාරින් 82 ක් මෙම ව්‍යාපෘතිය සඳහා පුහුණු කරවන ලදී. ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 2.5ක් වැය විණි.

#### 4.14. 2 සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට අපනයන කෘෂි භෝග හඳුන්වා දීම

සාමාන්‍යයෙන් අපනයන කෘෂි භෝග වගා නොකරන මඩකලපුව, පොළොන්නරුව, අනුරාධපුර, වවුනියාව හා යාපනය යන දිස්ත්‍රික්කවලට කුරුඳු පැළ 9000ක්, ගම්මිරිස් පැළ 7150ක්, පුවක් පැළ 8700ක් හා බුලත් දඬු 5400ක් බෙදා හරින ලදී.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩසටහන සඳහා පැළ හා තාක්ෂණික උපදෙස් සපයන ලදී. ප්‍රමාණවත් සෙවණක් සපයා තිබූ වගා බිම්වලට පැළ සපයා දෙන ලදී. අදාළ දිස්ත්‍රික්කවලින් සහභාගී වූ ආයතන හා බෙදා හරින ලද පැළ ගණන 4.14.2.1 වගුවේ දැක්වේ.

**4.14.2.1 වගුව: සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට බෙදා දුන් කෘෂි අපනයන භෝග පැළ ගණන**

| දිස්ත්‍රික්කය | අදාළ ආයතනය | කෘෂි අපනයන භෝගය සහ බෙදා දුන් පැළ ගණන | | | |
|---|---|---|---|---|---|
| | | ගම්මිරිස් | කුරුඳු | පුවක් | බුලත් |
| මඩකලපුව | දිස්ත්‍රික් ලේකම් (දිවි නැඟුම යටතේ) | 1000 | 2000 | 2700 | - |
| පොළොන්නරුව | මහවැලි අධිකාරිය ( බී කලාපය) | 1000 | 2000 | 1000 | - |
| පොළොන්නරුව | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | - | - | 2000 | - |
| අනුරාධපුර | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | - | - | 500 | - |
| අනුරාධපුර | පළුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 400 | - | - | - |
| අනුරාධපුර | ගලෙන් බිඳුණු වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 750 | 2000 | 1000 | - |
| අනුරාධපුර | නුවරගම්පළාත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 1000 | 3000 | - | - |
| අනුරාධපුර | මහවැලි අධිකාරිය (එච් කලාපය) | 3000 | - | - | 3000 |
| අනුරාධපුර | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | - | - | 2400 |
| වවුනියාව | ශ්‍රී ලංකා යුද හමුදාව | - | - | 500 | - |
| යාපනය | ශ්‍රී ලංකා යුද හමුදාව | - | - | 1000 | - |
| එකතුව | | 7150 | 9000 | 8700 | 5400 |

#### 4.14.3. කුඩා වැවිලි සංවර්ධන වැඩසටහන

කුඩා වැවිලි සංවර්ධන වැඩසටහන ඔස්සේ මහනුවර, නුවරඑළිය හා කෑගල්ල දිස්ත්‍රික්කවල ගොවි සමාජවල සාමාජිකයින් අතර තේ සමග අතුරුභෝග ලෙස වගා කිරීම සඳහා කෘෂි අපනයන භෝග බෙදා හරින ලදී. ඒ පිළිබඳ විස්තර 4.14.3.1 වගුවෙහි දැක්වේ.

**4.14.3.1 වගුව: තේ සමග අතුරුභෝග ලෙස වගා කිරීම සඳහා අපනයන කෘෂි භෝග බෙදා හැරීම**

| දිස්ත්‍රික්කය | ගොවි සමාජ | බෙදා හරින ලද පැළ ගණන | | | |
|---|---|---|---|---|---|
| | | කුරුඳු | ගම්මිරිස් | කෝපි | පුවක් |
| මහනුවර | 17 | 210 | 6,645 | 200 | 410 |
| නුවරඑළිය | 2 | - | 3,471 | - | 4,680 |
| කෑගල්ල | 2 | 2,500 | - | - | - |
| එකතුව | 21 | 2,710 | 10,116 | 200 | 5,090 |

මෙම වැඩසටහන යටතේ මහනුවර හා කෑගල්ල යන දිස්ත්‍රික්කවල ඵලදායීතා ප්‍රවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව දැනටමත් තේ වතුවල වගා කර ඇති ගම්මිරිස් වැල්වල ඵලදායීතාව දියුණු කරන ලදී. මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන් 480 දෙනෙකු ද කෑගල්ල දිස්ත්‍රික්කයේ ගොවීන් 71 දෙනෙකු ද මෙම වැඩසටහනෙන් ප්‍රතිලාභ ලද අතර ගොවීන් 2,483 දෙනෙකු පුහුණු කරන ලදී. (4.14.3.2 වගුව)

**4.14.3.2** වගුව **: කෘෂි අපනයන භෝග ප්‍රතිලාභීන් සඳහා කුඩා වැව්ලි සංවර්ධන වැඩසටහන යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන්**

| දිස්ත්‍රික්කය | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| මහනුවර | 20 | 748 |
| නුවරඑළිය | 6 | 100 |
| කෑගල්ල | 6 | 45 |
| එකතුව | 32 | 893 |

### 4.14.4 කිතුල් සංවර්ධන වැඩසටහන

2014 අගෝස්තු පළමු වැනි දා සිට තුන් වැනි දා දක්වා කැන්ඩි සිටි සෙන්ටර්හි පවත්වන ලද 'කිතුලක වරුණ' ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී. 2015 වසරේ දී සංචාරක අමාත්‍යාංශය මගින් නිකුත් කිරීම සඳහා කිතුල් බීජපැළ විසි දහසක් බඳුන්ගත කරන ලදී.

### 4.14.5 ගම්මිරිස් සෙවණ කප්පාදු කිරීමේ සතිය

ගම්මිරිස් අස්වැන්න අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපාන සාධකය වන්නේ වගාවන් හී පවතින අධික සෙවන තත්ත්වයයි. මෙම ගැටලුවට පිළියමක් ලෙස ගොවීන් උනන්දු කරවීම සඳහා ගම්මිරිස් වගාවන් හි සෙවන ශාක කප්පාදු කර වැල්වටා කොළ පොහොරක් ලෙස යෙදීම සඳහා ගොවීන් උනන්දු කිරීමේ අරමුණින් සෙවන කප්පාදු සතිය හඳුන්වා දෙන ලදී.ගම්මිරිස් වැල්වල අස්වැන්න වැඩි කිරීමට වගාවල ග්ලිරිසීඩියා සෙවණ ශාක මහා පරිමාණයෙන් කප්පාදු කිරීම සඳහා ගම්මිරිස් සෙවණ කප්පාදු කිරීමේ සතියක් පවත්වන ලදී. මෙම ගම්මිරිස් සෙවණ කප්පාදු සතිය දිවයින පුරා ගොවීන් 9,053 දෙනෙකුට අයත් ගම්මිරිස් වගා බිම් හෙක්. 3460.9ක් ආවරණය කරමින් 2014 සැප්තැම්බර් මස 09 වැනි දින සිට 16 වැනි දින දක්වා පවත්වන ලදී. මෙම වැඩසටහනෙහි විස්තර 4.14.5.1 වගුවෙහි දැක්වේ.

**4.14.5.1** වගුව **: ගම්මිරිස් සෙවණ කප්පාදු කිරීමේ සතියේ ප්‍රගතිය (සැප්තැම්බර් 09 සිට 16 දක්වා)**

| දිස්ත්‍රික්කය | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | ආවරණය කළ ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණන | ගම්මිරිස් වගාකරුවන් ගණන | කප්පාදු කරන ලද වගා බිම් ප්‍රමාණය (හෙක්) |
|---|---|---|---|---|
| කෑගල්ල | 11 | 45 | 1298 | 340.5 |
| හම්බන්තොට | 5 | 7 | 177 | 111.74 |
| ගාල්ල | 14 | 24 | 987 | 43.0 |
| මාතර | 9 | 12 | 262 | 2.36 |
| කුරුණෑගල | 8 | 28 | 1,056 | 612.95 |
| බදුල්ල | 9 | 16 | 496 | 161.0 |
| නුවරඑළිය | 5 | 12 | 243 | 115.0 |
| කළුතර | 10 | 10 | 220 | 8.29 |
| කොළඹ | 2 | 2 | 48 | 9.5 |
| රත්නපුර | 17 | 35 | 1,294 | 841.2 |
| මොණරාගල | 3 | 12 | 315 | 5.66 |
| මාතලේ | 8 | 23 | 704 | 680.0 |
| මහනුවර | 18 | 84 | 1,729 | 464.9 |
| ගම්පහ | 11 | 11 | 224 | 64.8 |
| එකතුව | 130 | 321 | 9,053 | 3,460.9 |

## 4.15 දිවි නැඟුම ජාතික සංවර්ධන වැඩසටහන – 2014

2014 වසරේ දී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍යාධාර යටතේ අපනයන කෘෂි භෝග ක්ෂේත්‍රයේ සමස්ත සංවර්ධනය අරමුණු කර ගනිමින් දිවි නැඟුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක කෙරිණි.

### 4.15.1 අපනයන කෘෂි භෝග ආශ්‍රිත ගෙවතු වගා ස්ථාපනය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන් වෙත කෘෂි අපනයන භෝග රෝපණ ද්‍රව්‍ය බෙදා හරින ලදී. වැඩසටහනෙහි ප්‍රගතිය 4.15.1.1 වගුවෙහි දැක්වේ.

**4.15.1.1** වගුව: **ගෙවතු වගාවලට රෝපණ ද්‍රව්‍ය ලබා දීම**

| දිස්ත්‍රික්කය | කුරුඳු | ගම්මිරිස් | කෝපි | පුවක් | ගොරකා | සාදික්කා | කරාබු |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 15,975 | 11,025 | - | 3,000 | - | - | - |
| ගම්පහ | 17,200 | 20,506 | 45 | 5,670 | - | - | |
| කළුතර | 18,230 | 30,040 | - | 3,450 | - | - | - |
| ගාල්ල | 69,092 | 9,453 | - | - | - | - | - |
| මාතර | 52,500 | 16,900 | - | 675 | - | - | - |
| හම්බන්තොට | 5,964 | 6,758 | 110 | 1,380 | - | - | - |
| මහනුවර | 26,840 | 8,100 | 3,200 | 400 | - | 460 | - |
| මාතලේ | 19,538 | 1,177 | - | 1,508 | 145 | - | - |
| නුවරඑළිය | 8,111 | 6,585 | 1,703 | 1,601 | 162 | 161 | 13 |
| කෑගල්ල | 29,950 | 20,150 | 2,500 | 400 | - | - | - |
| රත්නපුර | 40,000 | 33,550 | - | 4,950 | 175 | - | - |
| බදුල්ල | 825 | 9,795 | 1,500 | 1,600 | - | - | - |
| කුරුණෑගල | 19,250 | 15,214 | - | 100 | - | - | - |
| මොණරාගල | 12,990 | 6,670 | - | 2,450 | - | - | - |
| **එකතුව** | **336,465** | **195,923** | **9,058** | **27,184** | **482** | **621** | **13** |

### 4.15.2 වාණිජ වගා ඒකක පිහිටුවීම

විද්‍යානුකූල ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් අනුගමනය කිරීම තුළින් ඉහළ නිෂ්පාදනයක් ලබාගැනීම සහ වැවිලිකරුවන්ගේ ආදායම් උත්පාදනය නැංවීමේ අරමුණින් හෙක්. 0.2 සිට හෙක්. 1.0 දක්වා වගා බිම් ප්‍රමාණයක අපනයන කෘෂි භෝග වගා කිරීම මෙම වැඩසටහන යටතේ සිදු විය. මේ ඔස්සේ ගොවීන් වෙත තාක්ෂණික උපදෙස් ලබා දී මුදල් ආධාර හා මුදල් අය කිරීමකින් තොරව රෝපණ ද්‍රව්‍ය නිකුත් කරනු ලැබිණි. මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 45.4ක මුදලක් ආයෝජනය කරන ලද අතර වාණිජ වගා ඒකක වැඩසටහනේ භෞතික ප්‍රගතිය 4.15.2.1 වගුවෙන් දැක්වේ.

**4.15.2.1 වගුව: වාණිජ වගා ඒකක වැඩ සටහනේ භෞතික ප්‍රගතිය (හෙක්.)**

| දිස්ත්‍රික්කය | ඉලක්කය (ඒකක) | ප්‍රගතිය (ඒකක) | භෞතික ප්‍රගතිය (හෙක්) | | | | සමස්ත ප්‍රගතිය (හෙක්) |
|---|---|---|---|---|---|---|---|
| | | | කුරුඳු | ගම්මිරිස් | කොකෝවා | සාදික්කා | |
| කොළඹ | 15 | 13 | 6 | - | - | - | 6 |
| ගම්පහ | 65 | 62 | 7.4 | 10.6 | - | - | 18 |
| කළුතර | 80 | 65 | 27.7 | - | - | - | 27.7 |
| ගාල්ල | 90 | 81 | 32.9 | - | - | - | 32.9 |
| මාතර | 75 | 94 | 45.7 | - | - | - | 45.7 |
| හම්බන්තොට | 100 | 79 | 20.6 | 11.5 | - | - | 32.1 |
| මහනුවර | 95 | 70 | 2.8 | 21.7 | - | 4.4 | 28.9 |
| මාතලේ | 65 | 49 | 6 | 21.5 | - | 2.4 | 29.9 |
| නුවර එළිය | 60 | 25 | - | 8.6 | - | - | 8.6 |
| කෑගල්ල | 65 | 56 | 11 | 12.1 | - | - | 23.1 |
| රත්නපුර | 115 | 99 | 24.15 | 24.1 | - | - | 48.25 |
| මොණරාගල | 65 | 49 | - | 9.2 | 8.8 | - | 18 |
| බදුල්ල | 75 | 38 | - | 16.4 | - | - | 16.4 |
| කුරුණෑගල | 75 | 77 | 11 | 16.1 | - | - | 27.1 |
| **එකතුව** | **1040** | **857** | **195.25** | **151.8** | **8.8** | **6.8** | **362.65** |

### 4.15.3 අපනයන කෘෂි භෝග ආශ්‍රිත ගෘහස්ථ කර්මාන්ත සංවර්ධනය

ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම හා අපනයන කෘෂි භෝගවල අගය එකතු කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන දියත් කරන ලදී. ප්‍රතිලාභීන්ට නිර්දේශිත යන්ත්‍රසූත්‍ර මිල දී ගැනීම සඳහා ආධාර සපයන ලද අතර 4.15.3.1. වගුව මගින් මෙම වැඩසටහනෙහි 2014 වසරෙහි භෞතික ප්‍රගතිය නිරූපණය වේ.

#### 4.15.3.1 අපනයන කෘෂි භෝග ආශ්‍රිත ගෘහස්ථ වාණිජ ඒකකවල ප්‍රගතිය

| ගෘහස්ථ වාණිජ ඒකක | නිර්දේශිත යන්ත්‍රසූත්‍ර | ප්‍රමාණය |
|---|---|---|
| ඉහළ ගුණාත්මයකින් යුත් නිෂ්පාදනය | ගම්මිරිස් බීජ වෙන් කරන යන්ත්‍රය | 16 |
| සුදු ගම්මිරිස් නිෂ්පාදනය | සුදු ගම්මිරිස් සැකසුම් යන්ත්‍ර | 04 |
| ඉහළ ගුණාත්මයකින්යුත් කෝපි නිෂ්පාදනය | කෝපි පොතු ගැලවීමේ යන්ත්‍රය | 01 |
| කුළුබඩු පිරිසැකසුම්කරණය | වියළන | 02 |
| | කුළුබඩු ඇඹරුම් යන්ත්‍ර | 06 |
| **එකතුව** | | **29** |

### 4.15.4 අපනයන කෘෂි භෝග පැළ තවාන්වල පැළ ගෘහ ඉදි කිරීම

මෙම වැඩසටහන යටතේ තවාන්කරුවන්ට ඔවුන් විසින් සකස් කරනු ලබන පැළවල ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති කරනු පිණිස පැළ ගෘහ ඉදි කිරීම සඳහා 50%ක මූල්‍යාධාර ලබා දෙන ලදී. 2014 වර්ෂය තුළ රු. 1,260,000ක් වටිනා පැළ ගෘහ දහයක් ඉදි කරන ලදී.

| දිස්ත්‍රික්කය | පැළ ගෘහ ගණන | පිරිවිතර |
|---|---|---|
| ගම්පහ | 01 | 60’ x18’ |
| මහනුවර | 04 | 60’ x18’ |
| රත්නපුර | 01 | 60’ x18’ |
| කුරුණෑගල | 03 | 60’ x18’ |
| | 01 | 40’ x18’ |
| **එකතුව** | **10** | |

## 4.16 සන්නිවේදන අංශයේ ක්‍රියාකාරීත්ව

2014 වසර තුළ සන්නිවේදන අංශය විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 4.16.1 විද්‍යුත් මාධ්‍ය

- ‘සැඟවුණු කහවණු‘ වැඩසටහනේ කොටස් 20ක් ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශය විය. ‘මහින්ද චින්තන ඉදිරි දැක්ම‘ පිළිබඳ වාර්තාමය වැඩසටහන් දෙකක් ද නිෂ්පාදනය කරන ලදී.

- ‘රසජනනී‘ නමින් ගුවන් විදුලි වැඩසටහන් කොටස් අටක් කඳුරට සේවය, රුහුණු සේවය, වයඹ සේවය හා ස්වදේශීය සේවය ඔස්සේ විකාශය කරන ලද අතර ‘කහවණු තුරු‘ නම් වූ තවත් වැඩසටහනක් ද ඉහත නාලික ඔස්සේ විකාශය කරන්නට යෙදිණි. 2014 වසරේ දී මෙම වැඩසටහනේ කොටස් 02ක් විකාශය කරන ලදී.

### 4.16.2 මුද්‍රිත මාධ්‍ය

- අපනයන කෘෂි භෝග නිෂ්පාදිතයන්ගේ මිල තොරතුරු සතිපතා දිනමිණ පුවත්පතේ පළ වූ අතර 2014 වසර තුළ පල වූ මුළු ලිපි සංඛ්‍යාව 51ක් විය.
- කුළුබඩු ශ්‍රේණි පිළිබඳ පෝස්ටරයක් මුද්‍රණය කර එහි පිටපත් 2000ක් බෙදා හරින ලදී.
- කුරුඳු පුහුණු වැඩසටහන් හා ඌව වෙල්ලස්ස කොකෝවා ව්‍යාපෘතිය සඳහා අත්පොත් දෙකක් පළ කරන ලදී.
- ගම්මිරිස් සෙවණ ශාක කප්පාදු කිරීමේ සතිය වෙනුවෙන් පෝස්ටර පිටපත් 5000ක් ද අපනයන කෘෂි භෝග ආධාර හා එහි ප්‍රතිලාභ පිළිබඳ පෝස්ටර පිටපත් 2500ක් ද මුද්‍රණය කෙරිණි.
- 'සාදික්කා පත්‍ර හැළීමේ රෝගය' පිළිබඳ අත් පත්‍රිකා තිස් දහසක් ද දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා අත් පත්‍රිකා 5000ක් ද ගම්මිරිස් සෙවණ කප්පාදු කිරීමේ සතිය වෙනුවෙන් අත් පත්‍රිකා 10,000ක් ද ගොරකා පිළිබඳව අත් පත්‍රිකා 500ක් ද 'කිතුලක වරුණ'' ප්‍රදර්ශනය සඳහා අත් පත්‍රිකා 4000ක් ද මුද්‍රණය කර බෙදා හැරිණි.
- ගොරකා ව්‍යාපෘතිය සඳහා සටහන් පත්‍ර 2000 ක් ද , ''ගම්මිරිස් දිනය'' සඳහා සටහන් පත්‍ර 200ක් ද මුද්‍රණය කොට බෙදා හැරිණි.
- මහනුවර, මාතලේ, කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කවල පොදු ප්‍රවාහන සේවා ඉලක්ක කර ගනිමින් 'සාදික්කා පත්‍ර හැළීමේ රෝගය' පිළිබඳ ස්ටිකර් දහසක් මුද්‍රණය කරන ලදී.
- ඌව වෙල්ලස්ස කොකෝවා ව්‍යාපෘතිය සඳහා කඩදාසි පුවරු පහළොවක් ද 'සාදික්කා පත්‍ර හැළීමේ රෝගය' පිළිබඳ සංදර්ශක පුවරු හයක් ද සකස් කරන ලදී.
- 'සාරතී' පුවත් සංදේශය පළ කරන ලදී.

### 4.16.3 වෙනත් විශේෂ වැඩසටහන්

- **කුළුබඩු පූජා මංගල්‍යය**

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ප්‍රථම වරට ශ්‍රී දළදා සමිඳුන් උදෙසා කුළුබඩු පූජා මංගල්‍යයක් 2014 ජුනි 16 දින මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දී සිදු කෙරිණි. කිලෝ ග්‍රෑම් සියයකට අධික ප්‍රමාණයකින් යුත් කුරුඳු , සාදික්කා , වසාවාසි, කරාබුනැටි, ගම්මිරිස්, වැනිලා, ගොරකා, බුලත්, පුවත්, හා කුළුබඩු කත් 07 ක් එහිදී පූජා කරන ලදී.





# පර්යේෂණ

## ஆராய்ச்சி

## RESEARCH











## පර්යේෂණ අංශයේ විශේෂ ක්‍රියාකාරකම්

- දිරාපත් වූ කුරුඳු කොළ පදනම්ව සාදන ලද කොම්පෝස්ට් පොහොර හෙක්ටයාරයකට ටොන් 10 ක් සමග නිර්දේශිත අකාබනික පොහොර ප්‍රමාණයෙන් හරි අඩක් (වර්ෂයකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 450ක්)යෙදීමෙන් වැඩි කුරුඳු අස්වැන්නක් ලබා ගත හැකිය.
- යූරියා යෙදීමෙන් කුරුඳු තැළීමේ හැකියාව සම්බන්ධයෙන් කිසිදු යහපත් බලපෑමක් ඇති නොවේ.
- අඩු ඉඩක් අවශ්‍ය කෙරෙන අඩු වියදම් (රු. 15,000) කුරුඳු තැළීමේ මේසයක් නිර්මාණය කරන ලදී.
- අලුතින් හඳුන්වා දුන් දෙමුහුන් ගම්මිරිස් ප්‍රභේද පැළ (14/3, 27/1) ගොවි බිම්වල ව්‍යාප්ත කරන ලදී.
- *Trichoderma spp. P fluorescence* හා සිඵ දිලීරකමූල මගින් ගම්මිරිස්වල වැඩීම වර්ධනය පෙන්වූ අතර ජෛව පාලක කාරකයින් ලෙස මෙන්ම වර්ධන උපකාරකයන් ලෙස ක්‍රියා කිරීමේ හැකියාව ද පෙන්නුම් කරන ලදී.
- W5/5 කොකෝවා වගා දර්ශයෙන් 58%ක ඉහළම කොකෝවා බටර් අන්තර්ගතයක් ලබා දිණි.
- ශ්‍රී ලංකා පුවක් හා ඉන්දුනීසියානු පුවක් වෙන් කොට හඳුනාගැනීමේ ක්‍රමවේදය සොයා ගන්නා ලදී.
- අමු චීන ඉඟුරු භාවිතයෙන් ඉඟුරු රසැති ජෑම් නිෂ්පාදනය කිරීම සඳහා ආහාර වට්ටෝරු තුනක් පරීක්ෂණයට භාජනය කරන ලදී.
- දේශීය හා චීන ඉඟුරුවලට හානි කරන කොරපොතු කෘමියා හා පිටි මකුණා පාලනය කිරීම සඳහා රසායනික පාලන ක්‍රම දෙකක් සොයා ගන්නා ලදී.

### 5.1 පර්යේෂණ අංශයේ තාක්ෂණික ක්‍රියාකාරීත්වය හා සංවිධානය

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ අංශයට භෝග පිළිබඳව පර්යේෂණ ඒකකය, ආර්ථික පර්යේෂණ ඒකකය හා පැලෑටි සංරක්ෂණ ඒකකය යන ප්‍රධාන ඒකක තුනක් අයත් වේ. අපනයන කෘෂි භෝගවල නිෂ්පාදනය, ඵලදායීතාව හා ගුණාත්මකභාවය වැඩි දියුණු කරනු පිණිස ගොවීන්ගේ ගැටලු විසඳීම සඳහා මධ්‍යම පර්යේෂණ ස්ථානය හා උප පර්යේෂණ ස්ථාන හයක් යෝග්‍ය තාක්ෂණය සංවර්ධනය කිරීමෙහි ලා අඛණ්ඩව නියැළී සිටියි. පර්යේෂණ ස්ථාන පිහිටා ඇති ස්ථාන හා ඒවා මගින් සිදු කෙරෙන කාර්යයන් පහතින් දැක්වේ.

- මධ්‍යම පර්යේෂණ ස්ථානය, මාතලේ - කුරුඳු, පැඟිරි හා බුලත් හැර අනෙකුත් අපනයන කෘෂි භෝග පිළිබඳ බහු විෂයානුබද්ධ පර්යේෂණ
- කුරුඳු පර්යේෂණ ස්ථානය, පළොල්පිටිය, මාතර - කුරුඳු හා පැඟිරි පිළිබඳ බහුවිෂයානුබද්ධ පර්යේෂණ
- බුලත් හා අතුරුභෝග පර්යේෂණ ස්ථානය, නාරම්මල - පොල් හා බුලත් සමග අපනයන කෘෂි බෝග අතුරු වගා කිරීම
- පටක රෝපණ විද්‍යාගාරය හා පැළ නිෂ්පාදන තවාන, වල්පිට - පටක රෝපණ පර්යේෂණ හා ශාක අභිජනනය
- උප පර්යේෂණ ස්ථානය, කුණ්ඩසාලේ - ප්‍රධාන වශයෙන් කොකෝවා, කිතුල්, ඉඟුරු හා කහ පිළිබඳ බහු විෂයානුබද්ධ පර්යේෂණ
- උප පර්යේෂණ ස්ථානය, නිල්ලඹේ - කප්පාදු ක්‍රම
- උප පර්යේෂණ ස්ථානය දැල්පිටිය - කාබනික වගාව හා කුළුබඩු උද්‍යානය
- ආර්ථික පර්යේෂණ ඒකකය, ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය - ආර්ථික හා අලෙවි පර්යේෂණ පැවැත්වීම

මධ්‍යම පර්යේෂණ ස්ථානය හා ශාක ආරක්ෂණ ඒකකය මාතලේ අධ්‍යක්ෂ (පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වේ. කුරුඳු පර්යේෂණ මධ්‍යස්ථානය හා බුලත් හා අතුරුභෝග පර්යේෂණ මධ්‍යස්ථානය පර්යේෂණ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු යටතේ ද අනෙකුත් උප පර්යේෂණ මධ්‍යස්ථාන අදාළ සහකාර අධ්‍යක්ෂවරයා/ස්ථාන භාර පර්යේෂණ නිලධාරියා යටතේ ද ක්‍රියාත්මක වේ. 2014 වසරේ දී ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානයේ දී හා අනෙකුත් උප පර්යේෂණ මධ්‍යස්ථානවල දී පවත්වන ලද පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය භෝගය හා විෂය අනුව පහතින් විස්තර කොට දක්වා ඇත.

### 5.2 2014 වර්ෂය තුළ අපනයන කෘෂි භෝග සම්බන්ධ පර්යේෂණවල ප්‍රගතිය

#### 5.2.1 කුරුඳු

**ශෂ්‍ය විද්‍යාව**

- ලා දුඹුරු වර්ණයක් ඇති වීමේ මූලික පදනම සහ ආර්ථික නිෂ්පාදනය කෙරෙහි අදාළ තත්ත්වයෙහි බලපෑම හඳුනා ගැනීමට අධ්‍යයනයක් සිදු කරන ලදී. ප්‍රතිඵල අනුව මෙම තත්ත්වය වයස්ගත කඳන් සහිත ශාකවලින් 55%කට බලපෑම් කළ අතර පැළවලින් 15% කට අඩු ප්‍රමාණයක් සියලු වර්ධක මට්ටම්වල දී මෙම තත්ත්වයේ බලපෑමට ලක් වේ. විවෘත පරාගණයේ දී මෙම තත්ත්වය ජානමය වශයෙන් සම්ප්‍රේෂණය වීමට ඇති හැකියාව 4% කට අඩු අගයක් ගන්නා බව නිරීක්ෂණය කරන ලදී.

- ගබඩා කාලය මාස හයක් දක්වා දීර්ඝ කිරීමෙන් මහ කන්නය සඳහා ජීව්‍ය ගුණයෙන් යුත් බීජ ලබා ගැනීමට සහ ඇසුරුම් විශාලත්වය වැඩි කිරීමට ඇසුරුම්කරණ විශාලත්වය හා ඇසුරුම්කරණය සඳහා භාවිතා කරනු ලබන ද්‍රව්‍යය යන සාධක දෙක සැලකිල්ලට ගනිමින් කුරුඳු ඇසුරුම්කරණ ක්‍රමවේදය සුසර කිරීම සිදු කෙරිණි. බීජ නෙළාගත් වහාම ඒවායේ ඵලාවරණය ඉවත් කර හොඳින් සෝදා *folicur* මිශ්‍රණයෙන් 0.05%ක විනාඩි 45ක කාලයක් සඳහා පොඟවා තබා දින පහක් පවනේ වියළා ගැනීමෙන් පසු කිලෝ 1,3 හෝ 5 ප්‍රමාණයේ සෙලෝෆේන් මලුවල බහා මුද්‍රා තබනු ලැබේ. ඉහත ආකාරයෙන් සකස් කරන ලද බීජ 85% - 90% දක්වා ප්‍රරෝහතාවක් සහිතව කාමර උෂ්ණත්වයේ මාස 5ක කාලයක් තබා ගත හැක.
- කුරුඳුවල වර්ධනය, අස්වැන්න හා තැලීමේ හැකියාව කෙරෙහි පොහොර යොදනු ලබන කාලයෙන් වන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලදී. නිර්දේශිත පොහොර මිශ්‍රණය අස්වැන්න නෙළා ගැනීමට මාස පහකට, හතරකට, තුනකට (වර්තමාන නිර්දේශය), දෙකකට, මාසයකට හා සති දෙකකට පෙර යොදා බලන ලදී. පර්යේෂණ ප්‍රතිඵලවලින් අනාවරණය වූ පරිදි කුරුඳු ශාකයේ වර්ධනය, අස්වැන්න හෝ තැලීමේ හැකියාව කෙරෙහි පොහොර යෙදීමේ කාලයෙන් සැලකිය යුතු බලපෑමක් සිදු වන්නේ නැත. කෙසේ වුවද, අස්වැන්න නෙළීමට මාසයකට හෝ සති දෙකකට පෙර පොහොර යෙදීමෙන් පැයකට කි.ග්‍රෑ.1.6 ක වැඩිම කුරුඳු ප්‍රමාණයක් තළා ගැනීමේ හැකියාවක් පෙන්නුම් කරන ලද අතර අස්වැන්න නෙළීමට සති දෙකකට පෙර පොහොර යෙදීමෙන් මාස හයකට හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 669 ක වියළි පොතු අස්වැන්නක් පෙන්නුම් කරන ලදී. පඳුරකට ඇති වන නව අංකුර ගණන කෙරෙහි පොහොර යෙදීමේ කාලය වෙනස් වීමෙන් සැලකිය යුතු බලපෑමක් පෙන්නුම් කළේ නැත.

**පාංශු හා ශාක පෝෂණය**

- කුරුඳු වගා කරන පසෙහි ඇති ඇතැම් පාංශු ලක්ෂණ කුරුඳු පොතු අස්වැන්න කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන බව පැහැදිළිව දක්නා ලැබිණි. ගාල්ල දිස්ත්‍රික්කයේ පොතු අස්වනු මට්ටමේ විවිධතා සහිත කුරුඳු වගා කිහිපයකින් රැස් කර ගන්නා ලද පාංශු විශ්ලේෂණාත්මක දත්ත (ඉහළ මධ්‍යන්‍ය පොතු අස්වැන්න වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 986.0 ක් ද පහළ මධ්‍යන්‍ය පොතු අස්වැන්න වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 310.0 ක් ද) මගින් පැහැදිළි වූ පරිදි පසෙහි පාංශු pH අගය, විද්‍යුත් සන්නායකතාව, පාංශු නයිට්‍රජන් ප්‍රතිශතය, පොස්පරස් ප්‍රතිශතය, හුවමාරු කළ හැකි පොටෑසියම් ප්‍රතිශතය හා පසෙහි ඇති සල්ෆර් ප්‍රතිශතය කුරුඳු පොතු අස්වැන්න සමග සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. ඉහළ හා පහළ අස්වනු පංති සඳහා විවිධ පාංශු විචල්‍යයන්ගේ මධ්‍යන්‍ය pH අගයන් සඳහා 5.57 හා 5.10 ද විද්‍යුත් සන්නායකතාව සඳහා මීටරයට ඩෙසිසීමන් 0.034 හා මීටරයට ඩෙසිසීමන් 0.021 ද මුළු නයිට්‍රජන් ප්‍රතිශතය සඳහා 0.224 % හා 0.173 % ද පොස්පරස් ප්‍රතිශතය සඳහා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 4.73 හා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 3.58 ද හුවමාරු කළ හැකි පොටෑසියම් සඳහා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 46 හා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 30 ද සල්ෆර් සඳහා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 2.52 හා කි.ග්‍රෑමයට මි.ග්‍රෑ. 1.19 වශයෙන් ද විය. මෙම පාංශු ලක්ෂණ කුරුඳු වගා කරන පසෙහි අස්වනු විභවතාව අනුමාන කිරීම සඳහා යොදා ගනු ලැබිය හැක.

- රොක් පොස්ෆේට් යෙදූ කුරුඳු පත්‍ර දිරාපත් කිරීමෙන් තනාගත් කොම්පෝස්ට් පොහොර යෙදීමෙන් කුරුඳු සඳහා පවතින අකාබනික පොහොර නිර්දේශය ( වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ.900 ) අඩු කිරීමේ හැකියාව අධ්‍යයනය කිරීම සඳහා පවත්වන ලද අධ්‍යයනයෙන් පවතින පොහොර නිර්දේශයෙන් හරි අඩක් (වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ.450 ) කුරුඳු පත්‍ර දිරාපත් කිරීමෙන් තනාගත් කොම්පෝස්ට් ටොන් 10ක් සමග එක්ව යොදා ගැනීමෙන් තෙවැනි අස්වනු වාරයේ දී සමාන කුරුඳු පොතු අස්වැන්නක් ලබා ගත හැකි බව පැහැදිළිව පෙන්නුම් කෙරිණි. එමෙන්ම, දක්වා ඇති ලෙස වර්තමාන පොහොර නිර්දේශය 50%කට අඩු කර කොම්පෝස්ට් ටොන් 10ක් සමග යෙදීම මගින් කුරුඳු පොතු අස්වැන්න 7%කින් ඉහළ ගිය බව දක්නට ලැබිණි. වත්මන් පොහොර නිර්දේශයෙන් වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 3497 ක සමුච්චිත අස්වැන්නක් ලැබීමේ දී කොම්පෝස්ට් සංයෝග කොට තැනූ පොහොර නිර්දේශයෙන් වර්ෂයකට හෙක්ටයාරයකට කි.ග්‍රෑ.3735 ක සමුච්චිත අස්වැන්නක් ලැබුණු අතර මින් අකාබනික පොහොර යෙදීම අවම කිරීමේ ඉහළ සාධ්‍යතාවක් ඇති බව පෙන්නුම් කරන ලදී.
- කුරුඳු බීජපැළවල වර්ධනය කෙරෙහි යටිපසෙහි හා විවිධ කාබනික පොහොරවල බලපෑම පරීක්ෂා කිරීම සඳහා සිදු කරන ලද අධ්‍යයනය ඔස්සේ 1: 1: 1:1 බර අනුපාතයට ගොම පොහොර, වැලි හා කොහු බත් සමග යටිපස මිශ්‍ර කොට මතුපිට පස වෙනුවට යොදාගත හැකි බව අනාවරණය විණි. උක්ත බඳුන් මිශ්‍රණයේ ගොම වෙනුවට පණු පොහොර හෝ කුරුඳු පත්‍ර දිරාපත් කිරීමෙන් තනාගත් කොම්පෝස්ට් පොහොර ඉහත අනුපාතයටම යොදා ගත හැක.

**ප්‍රවේනි විද්‍යාව හා ශාක අභිජනනය**

කුරුඳු ප්‍රභේද 7කින් VP පැළ ක්ෂේත්‍රයේ ස්ථාපනය කරන ලදී. ශ්‍රී විජය (CRS 40) ප්‍රභේදය අනෙකුත් ප්‍රභේද 6ට වඩා වැඩි අස්වැන්නක් හා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. CRS 40, CRS 166 හා CRS 317 ඉහළම ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළ අතර CRS 184, CRS 201 හා CRS 351 අඩුම ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී. තෙල් නියැදි විශ්ලේෂණයට බඳුන් කළ ද ප්‍රතිඵලවලින් විශේෂ යමක් අනාවරණය වූයේ නැත. මේ වන විට අස්වනු දත්ත රැස් කරමින් පවතී.

**ශාක ආරක්ෂණය**

- කුරුඳු පත්‍රවල උඩු පෘෂ්ඨයේ ඇතිවන ගැටිති (*Trioza cinnamomi)* හා යටි පෘෂ්ඨයේ ඇති වන ගැටිතිවල (*Eriophyes Boise)* ආසාදන තත්ත්වයේ විවිධ මට්ටම් අනුව කුරුඳු තෙල්වල සිදුවන ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය වෙනස්කම් පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් පවත්වන ලදී. මෙම ගැටිති ආසාදන දෙකටම කුරුඳු පත්‍රවල තෙල් අන්තර්ගතය හා ගුණාත්මකභාවය සැලකිය යුතු මට්ටමකින් වෙනස් කිරීමට හැකියාවක් තිබෙන අතර ආසාදනයේ උග්‍රබව හා කුරුඳු පත්‍රවල තෙල් අන්තර්ගතය අතර දැඩි ඍණ සම්බන්ධතාවක් පෙන්නුම් කරන ලදී. තෙල්වල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් සලකා බලන කල්හි, ගැටිති ආසාදනයේ උග්‍රබව හා ඉයුජිනෝල් අන්තර්ගතය අතර නිශේධනීය සම්බන්ධතාවක් පෙන්නුම් කළ ද සිනැමල්ඩිහයිඩ් හා ඇසිටයිල් ඉයුජිනෝල් අන්තර්ගතය සම්බන්ධයෙන් සාධනීය සම්බන්ධතාවක් පෙන්නුම් කෙරිණි.

- සකස් කරන ලද කුරුඳු කුරුවල ඇති දිලීර ආසාදන වර්ග සහ ඒ සඳහා කුරුඳු කූරේ තෙතමන අන්තර්ගතය සහ පරිසරයේ උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාව වැනි පාරිසරික සාධකවල බලපෑම හඳුනා ගැනීම සඳහා පර්යේෂණ පවත්වන ලදී. කුරුඳු කුරුවල ඇතිවන සුලභම දිලීර ආසාදන වර්ග වනුයේ *Rhizopus sp., Penicillium sp., Aspergillus niger, Aspergillus flavus* යනාදිය යි. කෙසේ වුව ද, තෙතමන මට්ටම, සාපේක්ෂ ආර්ද්‍රතාව, ස්ථානීය සාධක හා මූලික ආමුකූලන තිබීම අනුව දිලීර ගහනය ඇති කරන ඒකකවල ඇති වීම හා ඒවායේ ප්‍රමාණය වෙනස් විය. සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි වීම, උෂ්ණත්වය හා පවතින තෙතමන අන්තර්ගතය අඩුවීමත් සමග දිලීර හා බැක්ටීරියා ගහනය ඇති කරන ඒකක ගණන වැඩි විය. ඇසුරුම් කාලය තුළ දින 20 - 40 කාල සීමාවේ දී 80 - 90% අතර සාපේක්ෂ ආර්ද්‍රතාවය, 15-20% අතර තෙතමනය 28-31$^0$C අතර උෂ්ණත්වය යටතේ දිලීර හා බැක්ටීරියා ගහනයේ උපරිම සංඛ්‍යාවක් නිරීක්ෂණය කළ හැකි විය.

**පසු අස්වනු තාක්ෂණය**

- කුරුඳු තැළීමේ හැකියාව කෙරෙහි යූරියා දියර පත්‍රවලට යෙදීමේ බලපෑම පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කෙරිණි. යූරියා නොයෙදීමේ (පාලිත) සිට ලීටරයකට ග්‍රෑම් 20 යෙදීම තෙක් යූරියා සාන්ද්‍රණ පහක් මේ සඳහා භාවිතා කරන ලදී. යූරියා යෙදීමේ සිට අස්වනු නෙළීම අතර විරාමය දළු ලෑමේ හා එල හට ගැනීමේ කාලය අතරතුර දින 3 සිට 14 දක්වා වෙනස් කරන ලදී. කුරුඳු තැළීමට දුෂ්කර කාලයේ දී යූරියා යෙදීමෙන් කුරුඳු තැළීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම මෙහි දී අවධානයට ගන්නා ලදී. කෙසේ වුව ද පර්යේෂණ ප්‍රතිඵලවලින් අනාවරණය වූ පරිදි යූරියා යෙදීමෙන් කුරුඳු තැළීමේ හැකියාව කෙරෙහි කිසිදු සාධනීය බලපෑමක් ඇති නොවන බව පෙන්නුම් කෙරිණි.
- නව කුරුඳු තැළීමේ මේසයක් නිර්මාණය කරන ලදී. මෙය පවතින කුරුඳු මේසයට වඩා විශාලත්වය අඩු වීම, අඩු ඉඩක භාවිතා කළ හැකි වීම හා වියදම් අඩු වීම අතින් වාසිදායක වේ. පවතින කුරුඳු තැළීමේ මේසය සඳහා රු.20,000ක පමණ මුදලක් වැය වන අතර නව මේසය සඳහා වැය වනුයේ රු 15,000ක පමණ මුදලකි. පවතින මේසය සඳහා සෙ.මී. 140 x සෙ.මී 155ක ඉඩක් අවශ්‍ය වන අතර නව මේසය සඳහා අවශ්‍ය වනුයේ සෙ.මී. 90 x සෙ.මී. 120 ක ඉඩකි. මූලික අත්හදා බැලීමේ පරීක්ෂණ සිදු කර ඇති අතර වැඩිදුර දියුණු කිරීම් සිදු කෙරෙමින් පවතී.

## 5.2.2 ගම්මිරිස්

**ශෂ්‍ය විද්‍යාව**

**පහත රට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) විවිධ ගම්මිරිස් වගා දර්ශවල තවාන් මට්ටමේ වර්ධනය කෙරෙහි ආර්ද්‍ර කුටි විවෘත කිරීමේ කාලයෙන් ඇතිවන බලපෑම**

- පහත රට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) විවිධ ගම්මිරිස් වගා දර්ශවල තවාන් මට්ටමේ වර්ධනය කෙරෙහි ආර්ද්‍ර කුටි විවෘත කිරීමේ කාලයෙන් වන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්විණි. මෙම අධ්‍යයනයේ දී සාධක දෙකක් සැලකිල්ලට ගන්නා ලදී. බඳුන්ගත කිරීමෙන් සති 3කට පසු, බඳුන්ගත කිරීමෙන් සති 4කට පසු, බඳුන්ගත කිරීමෙන් සති 5කට පසු ආදී වශයෙන් ආර්ද්‍ර

කුටි විවෘත කිරීමේ විවිධ මට්ටම් පළමු සාධකය වශයෙන් ද IW5, MB12, MW21, GK49 හා පැනියුර්-1 යන ගම්මිරිස් වගා දර්ශවල වර්ධනය දෙවැනි සාධකය වශයෙන් ද සලකන ලදී.

- සියලු ආර්ද්‍ර කුටි විවෘත කිරීමේ කාලයන් සම්බන්ධයෙන් ඉහළම ඔරොත්තු දීමේ මට්ටමක් පෙන්නුම් කරන ලද්දේ පැනියුර්-1 (99.26%) වගා දර්ශයයි. බඳුන්ගත කිරීමෙන් සති පහකට පසු විවෘත කිරීමේ දී MB12 වගා දර්ශය අඩුම ඔරොත්තු දීමේ මට්ටමක් (84%) පෙන්නුම් කරන ලදී.
- බඳුන්ගත කිරීමෙන් 11 වැනි සතිය වන තුරු මධ්‍යනය අංකුර හා මූල දිග මනින ලදී. සෑම සතියක දීම ඉහළම අංකුර දිගක් පැනියුර්-1 වගා දර්ශයෙන් ද අඩුම අංකුර දිගක් IW5 වගා දර්ශයෙන් ද නිරීක්ෂණය කරන ලදී. මුලේ වැඩිම දිග (සෙ.මී. 314.7 ) පැනියුර් 1 වගා දර්ශයෙන් ද අඩුම දිග MB12 ( සෙ.මී126.21 ) වගා දර්ශයෙන් ද නිරීක්ෂණය කෙරිණි.
- සිටුවීමෙන් සති පහකට පසු ආර්ද්‍ර කුටි විවෘත කිරීමෙන් MW21( මි.මී1.4), GK49( මි.මී 1.3) හා පැනියුර්-1 ( මි.මී 1.2) වගා දර්ශ මුල්වල ඉහළ මධ්‍යනය විෂ්කම්භයක් පෙන්නුම් කරන ලදී.
- IW5 වගා දර්ශයෙහි බඳුන්ගත කිරීමෙන් 4 වැනි හා 5 වැනි සතිවල, ආර්ද්‍ර කුටි විවෘත කිරීම මූලාග්‍ර අනුපාතයෙහි සැලකිය යුතු මට්ටමකින් ඉහළ අනුපාතයක් (R:S>1) පෙන්නුම් කරන ලදී. MB12 වගා දර්ශය ආර්ද්‍ර කුටි තුන සඳහාම සමස්ත මූලාග්‍ර අනුපාතයෙහි අඩුම අගයක් පෙන්නුම් කරන ලදී.

**හරස් අතුවලින් සාදන ලද පඳුරු ගම්මිරිස් පැළවල (GK 49) මල් හට ගැනීම හා ඵල දැරීම:**

මෙම පරීක්ෂණය 2009 වසරේ සිට සිදු කෙරෙමින් පවතින අතර පහතරට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) වසර පුරාම පඳුරු ගම්මිරිස්වල මල් හට ගන්නා බැව් නිරීක්ෂණය කිරීමට හැකි විය. එබැවින්, පඳුරු ගම්මිරිස්වල මල් හට ගැනීමේ අදියර 4ක් පමණ දැකිය හැක. කෙසේ වුවද, වැඩිම මල් හට ගැනීමක් වාර්තා වී ඇත්තේ ප්‍රධාන වැසි කාලවල දීය.

ක්ෂේත්‍රයේ සිටුවා වසර දෙකකට පසු වසරකට පඳුරු ගම්මිරිස් පැළයකින් අමු ගම්මිරිස් ග්‍රෑම් 1400 ක ගම්මිරිස් අස්වැන්නක් නෙළා ගත හැකි විය.

**පාංශු හා ශාක පෝෂණය**

**ගම්මිරිස්වල පාංශු ලක්ෂණ, වර්ධනය හා අස්වැන්න කෙරෙහි ආවරණ භෝගවල බලපෑම**

ගම්මිරිස් සමග ආවරණ භෝග ලෙස *Arachis pintoi* හා *Desmodium oval folium* වගා කිරීමෙන් අනෙකුත් ක්‍රමවලට වඩා ඉහළ වර්ධනයක් ලබා ගැනීමට හැකි විය. *Mucuna bracetaria*හි තෙතමනය රඳවා ගැනීම ඉහළ අගයක් පෙන්නුම් කළ ද ගම්මිරිස්වල වර්ධන වේගය අඩු වී ඇත.

**ගම්මිරිස්වල වර්ධනය හා අස්වැන්න කෙරෙහි මැග්නීසියම්වලින් ඇතිවන බලපෑම**

නිර්දේශිත පොහාර මාත්‍රාව කීසරයිට් ලෙස මැග්නීසියම් ලෙස මාත්‍රාවෙන් අඩක් සමග යෙදීමෙන් වැඩිම අස්වැන්නක් ලබා දෙන බව දක්නා ලැබිණි. කෙසේ වුවද, ඩොලමයිට් ලෙස මැග්නීසියම් මාත්‍රාවෙන් අඩක් සමඟ නිර්දේශිත පොහොර මාත්‍රාව යෙදීම මේ හා සමානම අඩු වියදම් ක්‍රමයක් වන නිසා කීසරයිට් වෙනුවට ඩොලමයිට් යොදා ගැනීම නිර්දේශිතයි.

**ශාක ආරක්ෂණය**

**ජෛව පෝෂක (Arbuscular Mycorriza-AM) හා ජෛව පාලක වාහක (*Trichoderma* spp. *Pseudomonas fluorescens*) සූදානම් කිරීම හා බහු රෝපණය**

තවාන් පරීක්ෂණවලින් ලැබුණු ප්‍රතිඵලවලට අනුව *Trichoderma* sp., *P. fluorescens* හා AM මගින් ශාක වර්ධනය වැඩි දියුණු කළ අතර ජෛව පාලක වාහක මෙන්ම වර්ධක සාධක ලෙස ද ක්‍රියා කිරීමේ හැකියාව පෙන්නුම් කරන ලදී. ජෛව පාලක වාහක හා ජෛව පෝෂක විවිධ සංයෝගවලින් යෙදීම තවදුරටත් අධ්‍යයනය කළ යුතු වේ. *Trichoderma* sp. බීජාණු ජීවාණුහරණය කළ ආසූත ජලය පුරවා පියන තදින් නොවසන ලද වීදුරු බෝතල් හෝ පරීක්ෂණ නළවල බහා කාමර උෂ්ණත්වයේ අවම වශයෙන් මාස 4ක පමණ කාලයක් තබා ගත හැකි විය. යටත් පිරිසෙයින්, තවාන් මට්ටමේ දී යෙදීම සඳහා *Trichoderma* sp.හි ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා තව දුරටත් පරීක්ෂණ කළ යුතු වේ. නිෂ්පාදනය වාණිජමය වශයෙන් සකස් කිරීම සඳහා ආසූත ජලයෙහි බීජාණු සංරක්ෂණය කිරීමේ තාක්ෂණය ප්‍රයෝජනවත් වේ.

**පසු අස්වනු තාක්ෂණය**

**දේශීය ගම්මිරිස් වගා දර්ශවල ඉදුණු බීජවල තෙල්, ඔලෙයොරෙසීන හා පයිපර් අන්තර්ගතය ප්‍රතිශය ඇගයීම**

පහතරට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) වගා කරන MW21, KW30, GK49, KW33, KW31, MB12, MW18 හා IW5 යන දේශීය ගම්මිරිස් වගා දර්ශවල ඉදුණු බීජවල තෙල්, ඔලෙයොරෙසීන හා පයිපරින් ප්‍රතිශතය නිර්ණය කරන ලදී. ඉහළම දළ තෙල් ප්‍රතිශතයක් ලබා දුන්නේ (වියළි, 2.88%) KW30 වගා දර්ශයෙන් වන අතර ඉහළම දළ ඔලෙයෙරෙසීන් අන්තර්ගතයක් (වියළි, 13.57%) GK49 වගා දර්ශයෙන් ද ඉහළම පයිපරින් අන්තර්ගතයක් (වියළි, 8.03%) IW5 වගා දර්ශයෙන් ද ලබා දෙන ලදී.

**දේශීය ගම්මිරිස් වගා දර්ශවල සව්වර ඝනත්වය තක්සේරු කිරීම:**

පහත රට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) වගා කරන MW21, KW30, GK49, KW33, KW31, MB12, MW18 හා IW5 යන දේශීය ගම්මිරිස් වගා දර්ශවල ඉදුණු බීජවල (මාස 8ක් වයසැති) සව්වර ඝනත්වය මනින ලදී. වැඩිම සව්වර ඝනත්වය වූ ලීටරයකට ග්‍රෑම් 577.67 KW31 වගා දර්ශයෙන් වාර්තා වූ අතර දෙවැනියට වැඩිම සව්වර ඝනත්වය ( ග්‍රෑම් 540.67 ) වාර්තා කළේ KW33 වගා දර්ශයයි.

**ප්‍රවේනි විද්‍යාව සහ හා ශාක අභිජනනය**

මෑත කාලීනව හඳුන්වා දුන් අලුතින් තෝරා ගත්/වර්ධනය කරන ලද ගම්මිරිස් ප්‍රභේද බෙදා හැරීම අරමුණු කර ගනිමින් වර්ධක ප්‍රචාරණ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. මව් ශාක උද්‍යාන මාතලේ ගොවීන්ගේ ක්ෂේත්‍ර කිහිපයක ආරම්භ කරන ලද අතර මේවායේ ඇගයීමට ලක්වන ප්‍රභේද වනුයේ Gk49, MB12, MN41 සහ නව දෙමුහුම් ප්‍රභේද වන 14/3,27/1 හා U/2 වේ.

පැනියුර් - 1 ඇතුළු දේශීය ගම්මිරිස් ප්‍රභේද හතක් කාබනික තත්ත්ව යටතේ දැල්පිටිය පර්යේෂණ මධ්‍යස්ථානයේ දී ඇගයීමට ලක් කරන ලදී. පැනියුර් -1, UD 21, TG 7 හා MB 12 යන ප්‍රභේද ඉහළම ඔරොත්තු

දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී. ලබා ගත් වර්ධක දත්තවලට අනුව, MB 12 අනෙකුත් ප්‍රභේදවලට වඩා ගුණත්වයෙන් ඉහළ බවක් පෙන්නුම් කරන ලදී. අස්වනු දත්ත රැස් කිරීම තවදුරටත් සිදු වෙයි.

**ශාක කායිකවිද්‍යාව හා පැළ නිෂ්පාදනය**

- 2009 වසරේ දී දේශීය වරණ දෙකක (GK 49 හා MB 12) උණ බම්බු ක්‍රමය යටතේ ලබාගත් සිරස් (අග්‍රස්ථ) හා තිරස් (පාර්ශ්වීය අතු) වශයෙන් මුල් ඇද්දවූ දඬු කැබලි සහ තනි පුරුක් වශයෙන් ලබා ගත් දඬු කැබලි ක්ෂේත්‍රයේ සිටුවන ලදී. උණ බම්බු ක්‍රමය යටතේ නිපදවූ තනි පුරුක් වශයෙන් ලබා ගත් දඬු කැබලිවලින් ඇති වන පාර්ශ්වීය අතු ගණන (19) හා තිරස් වශයෙන් කපා ගත් දඬු කැබලිවලින් ඇති වන පාර්ශ්වීය අතු ගණනට (8) වඩා සිරස් වශයෙන් කපා ගත් දඬු කැබලිවලින් ඇතිවන පාර්ශ්වීය අතු ගණන (27) ඉහළ අගයක් ගත්තේය. උණ බම්බු ක්‍රමය යටතේ ලබා ගත් තනි පුරුකේ දඬු කැබලිවලින් ලැබුණු කරල් ගණන (10) හෝ තිරස් දඬු කැබලිවලින් ලැබුණු කරල් ගණනට (16) වඩා, සිරස් දඬු කැබලිවලින් ඇති වූ පැළවල වැලකට හට ගන්නා කරල් ගණනෙහි සාමාන්‍යය (54) ඉහළ අගයක් පෙන්නුම් කරන ලදී.

- GK49, MB12, GM28, BD/MN41, TG7 හා DM 7 යන වැඩි අස්වැන්නක් ලබා දෙන දේශීය ගම්මිරිස් වරණ සඳහා නාලස්ථ ක්ලෝනීය ප්‍රචාරණය සිදු කරන ලදී. explants ලෙස අංකුර හා පුරුක් කොටස් (පාර්ශ්වීය දළු) යොදා ගන්නා ලදී. වැඩි අස්වැන්නක් ලබා දෙන දේශීය ගම්මිරිස් වරණ (GK49, MB12, GM28, BD/MN/41, UD21, DM7 හා PK11) හා දෙමුහුම් ප්‍රභේද (11/2, 14/3, 27/2) යොදාගෙන උණ බම්බු ක්‍රමය යටතේ පැළ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. 2014 වර්ෂයේ දී, උණ බම්බු ක්‍රමය හා පටක රෝපණ තාක්ෂණය භාවිතයෙන් පැළ 1500කට ආසන්න සංඛ්‍යාවක් නිෂ්පාදනය කරන ලද අතර පැළ 1000ක් බෙදා දෙන ලදී.

### 5.2.3 කොකෝවා

**ප්‍රවේනි විද්‍යාව හා ශාක අභිජනනය**

මෑතකාලීනව හඳුන්වා දෙනු ලැබූ අලුතින් තෝරාගත්/සංවර්ධනය කළ කොකෝවා වගා දර්ශ නිකුත් කිරීම අරමුණු කර ගනිමින් මහා පරිමාණ ප්‍රචාරණ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. පහත වගුවේ දැක්වෙන පරිදි ගොවීන්ගේ ක්ෂේත්‍ර කිහිපයක මව් වගාවන් ආරම්භ කරන ලදී.

| ස්ථානය | ප්‍රභේද/ය | පැළ ගණන |
|---|---|---|
| RS මාතලේ | W 5/5, WK-2, S-306, S-181 | එකකින් 50 බැගින් |
| IBRS, නාරම්මල | W 5/5, WK-2, S-306, | එකකින් 25 බැගින් |
| කුණ්ඩසාලේ පර්යේෂණ මධ්‍යස්ථානය | W 5/5, WK-2, S-306, | එකකින් 100 බැගින් |
| වයිකුඹුර වත්ත | W 5/5, WK-2, S-306, | එකකින් 100 බැගින් |

**පාංශු හා ශාක පෝෂණය**

2014 වසරේ දී මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානයෙහි පසෙහි අන්තර්ගත සාර්ව/ක්ෂුද්‍ර පෝෂක සහ කරල් වර්ධනය සම්බන්ධයෙන් cherrelle මැලවීමෙන් ඇති කරන බලපෑම අතර සම්බන්ධතාව සොයා ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ප්‍රතිඵලවලට අනුව කොකෝවාවල cherrelle මැලවීම කෙරෙහි පාංශු සාර්ව හා ක්ෂුද්‍ර පෝෂකවලින් (N,P,K,Mg, Ca, Zn හා B) සැලකිය යුතු බලපෑමක් සිදු නොවේ. අධ්‍යයන කාලය තුළ ඇති වූ cherrelle මැලවීමේ තත්ත්වය භෞතික සංකූලතාවන් හේතුවෙන් ඇති වූවක් බව පෙනෙන්නට තිබිණි.

**පසු අස්වනු තාක්ෂණය**

ශ්‍රී ලංකා කොකෝවාවල (*Theobroma cacao* l.) කොකෝවා බටර් අන්තර්ගතය කෙරෙහි පිරිසැකසුම් ක්‍රමවේද හා කොකෝවා ප්‍රභේදවල ඇති බලපෑම සොයා ගැනීම සඳහා අධ්‍යයනයක් පවත්වන ලදී. අලුතින් හඳුන්වා දුන් වගා දර්ශ පහ (WK1- 54.54%, WK2 – 52.45 %, WK7 - 55.23 %, SCA6* ICS 6 - 55.63 %, W5/5 – 58 %) අතුරින් වඩාත්ම ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේ W5/5 යන ප්‍රභේදයයි. අනෙකුත් වගා දර්ශ ද 50%කට වැඩි කොකෝවා බටර් අන්තර්ගතයක් පෙන්නුම් කර තිබේ. එබැවින් මෙකී සියලුම වගා දර්ශ ශ්‍රී ලංකාව තුළ වගා කිරීම සඳහා නිර්දේශ කළ හැකිය. මෙම අධ්‍යයනයේ දී පැසවීමෙන් පසුව, පිරිසැකසුම් ක්‍රමවේද හතරක් (සෝදා අව්වේ වියළා ගැනීම, නොසෝදා අව්වේ වියළා ගැනීම, සෝදා කෘත්‍රිමව වියළා ගැනීම, නොසෝදා කෘත්‍රිමව වියළා ගැනීම) ඇගයීමට ලක් කරන ලදී. සෝදා අව්වේ වියළා ගත් නියැදිවලින් අනෙකුත් ක්‍රමවලට වඩා වැඩි කොකෝවා බටර් අන්තර්ගතයක් (55.70%) පෙන්නුම් කෙරිණි. එබැවින්, යහපත් කාලගුණ තත්ත්ව යටතේ සෝදා අව්වේ වියළා ගැනීම කොකෝවා සඳහා යෝග්‍ය පිරිසැකසුම් ක්‍රමවේදයක් ලෙස හඳුන්වා දිය හැක.

**5.2.4 කෝපි**

**ප්‍රවේනි විද්‍යාව හා ශාක අභිජනනය**

මෑතකාලීනව හඳුන්වා දෙනු ලැබූ අලුතින් තෝරාගත්/සංවර්ධනය කළ ඇරබිකා කෝපි වගා දර්ශ නිකුත් කිරීම අරමුණු කර ගනිමින් මහා පරිමාණ ප්‍රචාරණ ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී. පහත වගුවේ දැක්වෙන පරිදි ගොවි ක්ෂේත්‍ර කිහිපයක මව් වගාවන් ආරම්භ කරන ලදී.

| ස්ථානය | ප්‍රභේද/ය | පැළ ගණන |
|---|---|---|
| කැලණිය වතුයාය, ගිනිගත්හේන | S 4711 | 1000 |
| වැලිඔය වතුයාය, ගිනිගත්හේන | S 4711 | 1000 |
| කබරගල වතුයාය, රිකිල්ලගස්කඩ | S 4711 | 900 |
| වේවැල්මඩ වතුයාය, රත්තොට | S 4711 | 500 |

*Coffea Arabica* ප්‍රභේද 8කින් පැවත එන දර්ශ ඇගයීමට ලක් කරන ලදී. මූලික ප්‍රතිඵලවලින් අනාවරණය වූ පරිදි මෙම ප්‍රභේද 8ටම 100 %ක ඔරොත්තු දීමේ හැකියාවක් තිබෙන අතර වර්ධන දත්ත අනුව, CAM/S42 හා CAM/S45 ඉහළම වර්ධනයක් පෙන්නුම් කරන ලදී. අස්වනු දත්ත තවදුරටත් රැස් කෙරෙනු ලැබේ.

**5.2.5 ඉඟුරු**

**ශෂ්‍ය විද්‍යාව**

**මහ කන්නයේ දී ඉඟුරු වගා කිරීමේ හැකියාව**

ඉඟුරු අස්වැන්න කෙරෙහි ඉඟුරු වගා කරන්නේ වසරේ කුමන කාල වකවානුවක ද යන්න මගින් කෙරෙන බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලද අතර ඉන් අනාවරණය වූ පරිදි පහතරට අන්තර්මධ්‍ය කලාපයේ ($IL_{1a}$) මහ කන්නය තුළ (අගෝස්තු, ඔක්තෝබර් හා නොවැම්බර්) ඉඟුරු වගා කිරීමෙන් චීන ඉඟුරු පැළයකට ග්‍රෑම් 763 ද රැන්ගුන් ඉඟුරු පැළයකට ග්‍රෑම් 398ක වැඩි සැලකිය යුතු මට්ටමේ අස්වැන්නක් ලබා ගත හැක. එබැවින්, සාමාන්‍ය යල කන්නයට අමතරව, ඉඟුරු බීජ රයිසෝම ලබා ගත හැකි නම් මහ කන්නයේ දී ද ඉඟුරු වගා කළ හැක.

**$IL_{1a}$ කලාපයේ ඉඟුරු වගා කිරීම සඳහා වාරි සම්පාදන අවශ්‍යතා**

ඉඟුරුවල මූල කලාපය සඳහා පවතින ජල සංචිත ධාරිතාව පාංශු ජලයෙන් මි.මී. 11 ලෙස ගණනය කරන ලදී. අතිරේක ජල සම්පාදන අවශ්‍යතාව මි.මී 720 උසට තිබිය යුතු අතර දින 4කට වඩා එක දිගට පවතින වියළි කාලයක දී 5 වැනි දිනයේ සිට වැසි වසින තෙක් අඛණ්ඩව මි.මී 12 උසට ජලය සම්පාදනය කිරීම ආරම්භ කිරීමෙන් $IL_{1a}$ කලාපය තුළ ජල ප්‍රශ්නය විසඳා ගත හැකිය.

**භෝග වර්ධනය හා අස්වැන්න කෙරෙහි බීජ රයිසෝමවල බරෙහි බලපෑම**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කර ඇති නිර්දේශයන් යටතේ රැන්ගුන් ප්‍රභේදයේ විවිධ ප්‍රමාණ පහක ඉඟුරු බීම ( ග්‍රෑම්15, ග්‍රෑම් 25, ග්‍රෑම් 35, ග්‍රෑම් 45 සහ ග්‍රෑම් 55) වර්ධනය හා අස්වැන්න සඳහා පරීක්ෂාවට ලක් කරන ලදී. බීජ ප්‍රරෝහණය සඳහා ගත වන දින ගණන (23), සමස්ත පත්‍ර ක්ෂේත්‍රය, පැළයේ අමු බර හා වියළි බර ආදී වර්ධන ලක්ෂණවලට ප්‍රතිකාරක ක්‍රමවලින් බලපෑමක් සිදු නොවූ අතර T5 (ග්‍රෑම් 55ක් බර බීජ) දළු හට ගැනීමට ගන්නා අඩුම කාලය, වැඩිම පත්‍ර ගණන (80) හා වැඩිම මොරෙයියන් ගණන (09) වාර්තා කළේය. ඉහළම අමු හා වියළි රයිසෝම බරක් වාර්තා වූයේ ක්ෂේත්‍රයේ සිටුවා මාස 4කට පසු T4 (ග්‍රෑම් 45ක් බර බීජ) වෙතිනි.

**බීජ ඉඟුරුවල ඇසුරුම් කාලය දීර්ඝ කිරීම සඳහා වර්ධන නිශේෂධකයන් භාවිතය**

- බීජ ඉඟුරුවල අංකුර හට ගැනීම පමා කිරීම සඳහා 1-methylcyclopropene -1MCPහි විවිධ සාන්ද්‍රණ (0ppm, 1ppm හා 5ppm) පරීක්ෂාවට ලක් කරන ලදී. ඉඟුරු බීජ පැය 24ක් පුරා ප්‍රතිකාරක ක්‍රමවලට නිරාවරණය කර 27 $C^{o}$ක උෂ්ණත්වය හා 75-76 % අතර සාපේක්ෂ ආර්ද්‍රතාවක් යටතේ සති 8ක් සඳහා වියළි පිදුරුවල අසුරා තබන ලදී. ප්‍රතිකාරක ක්‍රමවලට ලක් කරන ලද බීජ නියැදි ප්‍රරෝහ්‍යතාව සඳහා පරීක්ෂාවට බඳුන් කරන ලද අතර සියලු ප්‍රතිකාරක ක්‍රමවලින් 100%ක බීජ ප්‍රරෝහ්‍යතාවක් නිරීක්ෂණය කළ හැකි විය. පරීක්ෂණයට ලක් කරන ලද 1MCP සාන්ද්‍රතාව බීජ ඉඟුරුවල අංකුර හට හැනීම ප්‍රමාද කිරීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදු කළේ නැත.

**පාංශු හා ශාක පෝෂණය**

ඉඟුරු සඳහා පාංශුජ රෝගකාරකයන් මර්දනය හෝ ධාරක ශාඛවලට ප්‍රතිරෝධතාව දැක්වීම සඳහා කාබනික පොහොර ජල නිස්සාරවලින් ඇතිවන බලපෑම අධ්‍යයනයට ලක් කරන ලදී. මෙම අධ්‍යයනය තුළ කරන ලද නිරීක්ෂණවලින් ඇගයීමට ලක් කරන ලද පාංශු රෝග ඇති වීම, ඉඟුරුවල වර්ධනය හා අස්වැන්න කෙරෙහි මෙම ප්‍රතිකාරක ක්‍රමවලින් වන බලපෑමෙහි සැලකිය යුතු වෙනස්කමක් දක්නට නොලැබිණි.

**ශාක ආරක්ෂණය**

පොතු කෘමියා හා පිටි මකුණාගේ ආසාදනයට ලක් වූ දේශීය හා චීන ඉඟුරු රසායනික ප්‍රතිකාර ක්‍රමවලට බඳුන් කොට ක්ෂේත්‍රයේ ඇගැයීමට ලක් කරන ලදී. ප්‍රතිඵලවලට අනුව Thiamethoxam 25% (වගා දර්ශ දෙකෙහිම W/WG ප්‍රතිකාර කරන ලද රයිසෝම) පාත්තියකට ඉහළ ප්‍රරෝහායතා අගයක් ද පඳුරකට වැඩි අංකුර ගණනක් ද පෙන්නුම් කරන ලදී.

**පසු අස්වනු තාක්ෂණය**

**විවිධ ඉඟුරු වර්ගවල වාෂ්පශීලීතා ප්‍රතිශතය ඇගයීම**

පහත රට අන්තර්මධ්‍ය කලාපයේ වගා කරන ලද දේශීය, චීන හා රන්ගුන් ඉඟුරුවල වාෂ්පශීලී තෙල් ප්‍රතිශතය වෙන වෙනම මනින ලදී. සාමාන්‍ය වාෂ්පශීලී තෙල් ප්‍රතිශයන් ක්ෂේත්‍රයේ සිටුවා මාස 9 ට පසු ලබා ගත් ඉඟුරු සඳහා (වියලළාගත් පසු) පිළිවෙළින් 1.74, 1.48 හා 1.055 බැගින් විය.

**ඉඟුරු ජෑම් හා ඉඟුරු මිශ්‍ර පළතුරු ජෑම් නිෂ්පාදනය**

ජෑම් නිෂ්පාදනය සඳහා චීන අමු ඉඟුරු යොදා ගන්නා ලදී. ඉඟුරු රසැති ජෑම් නිෂ්පාදනය කිරීම සඳහා ආහාර වට්ටෝරු තුනක් පරීක්ෂාවට ලක් කරන ලදී. මෙම ආහාර වට්ටෝරු චීන ඉඟුරු භාවිතා කරමින් සකස් කරන ලදී. ‘දැයට කිරුළ 2014‘ ජාතික ප්‍රදර්ශනයේ දී විශේෂිත ප්‍රශ්නාවලි භාවිතා කරමින් රස සංවේදතා ඇගයීම සිදු කරන ලදී. මෙම රස සංවේදතා ඇගයීම සඳහා යොදා ගන්නා ලද්දේ නුපුහුණු රස සංවේදන මඩුල්ලකි. රස සංවේදතා ඇගයීමට අනුව ඉඟුරු ජෑම්වල සමස්ත පිළිගැනීම 80%ක් වූ අතර ඉඟුරු මිශ්‍ර අන්නාසි ජෑම් සඳහා එය 78%ක් ද ඉඟුරු මිශ්‍ර කොමඩු ජෑම් සඳහා 70%ක් ද විය. මේ අනුව, අගය එකතු කළ ඉඟුරු නිෂ්පාදන ලෙස ඉඟුරු ජෑම් හා ඉඟුරු මිශ්‍ර අන්නාසි ජෑම් ප්‍රජාව සඳහා නිර්දේශ කළ හැක.

**5.2.6 කහ**

**ශෂ්‍ය විද්‍යාව**

**කහ පටකරෝපණ ප්‍රචාරණය සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් තෝරා ගැනීම**

විනාඩි විස්සක් සඳහා 0.1% Mercuric chloride වල ගිල්වා තැබීමෙන් ජීවාණුහරණය කිරීම මගින් වැඩිම ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී. ඉහළම ප්‍රගුණන අනුපාතයක් වාර්තා වූයේ ලීටරයට මි.ග්‍රෑ. 3.0 BAP යොදන ලද මාධ්‍යයෙන් වන අතර ලීටරයට මි.ග්‍රෑ. 1.0 BAP යොදන ලද MS මාධ්‍යයෙන් පැළැටි දික් වීම නිරීක්ෂණය කරන ලදී. ලීටරයට මි.ග්‍රෑ. 3.0 BAP යොදන ලද MS මාධ්‍යයෙන් දින 80කට පසු අංකුර හා මුල් ගණනාවක් පැන නැඟීම නිරීක්ෂණය කළ හැකි විය.

**ශාක හා පාංශු පෝෂණය**

කහ ශාකයට පොහොර යෙදීම පිළිබඳ වසර හතරක් තිස්සේ කරන ලද අධ්‍යයනය ඔස්සේ හෙක්ටාරයකට කොම්පෝස්ට් ටොන් 20ක් හා ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP) කි.ග්‍රෑ. 104 පාදස්ථයට යෙදීම සමග සිටුවීමෙන් සෑම දින 45කටම හා 90කට පසුව TSP කි.ග්‍රෑ. 104, යූරියා කි.ග්‍රෑ. 65 හා මියුරියට් ඔෆ් පොටෑෂ් ( MOP) කි.ග්‍රෑ.100 යෙදීමෙන් හෙක්ටයාරයකට ටොන් 23.3 ක දළ අස්වැන්නක් ලබා ගත හැකි බව අනාවරණය විය. අකාබනික නිර්දේශවලට අමතරව, පාදස්ථයට හෙක්ටයාරයකට ටොන් 20 කොම්පෝස්ට් යෙදීම සමගින් හෙක්ටයාරයට ග්ලිරිසීඩියා ටොන් 10 බැගින් වාර 5ක් (සමාන විරාමයන් සහිතව) යෙදීමෙන් සමාන අස්වැන්නක් ලබා ගත හැකි විය.

**පසු අස්වනු තාක්ෂණය**

ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් කහ (කර්කියුමින් අන්තර්ගතය හා පැහැය) පිරිසැකසුම් කිරීම සඳහා උණු දිය ප්‍රතිකාරක ක්‍රමයට ලක් කළ යුතු කාලය නිර්ණය කර ගැනීමට කහ කුඩුවල වියළීම හා පැහැය කෙරෙහි රත් කිරීමට ගත කරන කාලයෙන් වන බලපෑම පරීක්ෂාවට ලක් කරන ලදී. විනාඩි 45ක් උණු දිය ප්‍රතිකාරයට ලක් කිරීමෙන් අඩුම වියළීමේ කාලයක් (මව්බීජ සඳහා පැය 56කුත් අංගුලිකා සඳහා පැය 48කුත්) සහ වැඩිම කර්ක්‍යුමින් අත්ර්ගතයක් (මව්බීජ සඳහා 6.4%කුත් අංගුලිකා සඳහා 5.0%කුත්) නිරීක්ෂණය කළ හැකි විය. විනාඩි 30ක් උණු දිය ප්‍රතිකාරක ක්‍රමයට ලක් කිරීමෙන් පසු වියළීමට ගත වන කාලය කඳන් සඳහා පැය 60ක් ද අංගුලිකා සඳහා පැය 50ක් ද වූ අතර හා කර්ක්‍යුමින් අන්තර්ගතය පිළිවෙළින් 6.4%ක් සහ 4.7%ක් විය. උණු දිය ප්‍රතිකාර ක්‍රමයට ලක් කිරීමේ කාලය දීර්ඝ වීමත් සමග ලා පැහැය හා b අගය (කොළ සිට කහ පැහැය තෙක්) වැඩි වූ නමුත් විනාඩි 30ක හා 45ක රත් කිරීමේ කාල සීමාව අතර සැලකිය යුතු වෙනසක් ($p>0.05$) දක්නට නොලැබිණි. ඊට අමතරව කඳන් මෙන්ම ඇඟිලිවල මධ්‍යනා‍ය කර්ක්‍යුමින් අන්තර්ගතය සම්බන්ධයෙන් ද මෙම රත් කිරීමේ කාල සීමාවන් දෙක අතර සැලකිය යුතු වෙනසක් ($p>0.05$) දක්නට නොලැබිණි. එබැවින්, ඉහළ ගුණත්වයෙන් යුතු කහ කුඩු ලබා ගැනීම සඳහා ඉඟුරු කඳන් සහ අංගුලිකා උණු දිය ප්‍රතිකාරක ක්‍රමයට ලක් කළ යුතු ප්‍රශස්ත කාලය විනාඩි 30ක් ලෙස නිර්දේශ කළ හැක.

.

## 5.2.7 බුලත්

**පසු අස්වනු තාක්ෂණය**

බුලත්වල තෙල් හා පල්පය භාවිතයෙන් විවිධ නිෂ්පාදන සැකසීම සඳහා මූලික අධ්‍යයනයන් සිදු කරන ලදී. මේ යටතේ බුලත් රසැති ටොෆී හා බුලත් සුවඳ කැවූ හඳුන්කූරු නිෂ්පාදනය කරන ලදී. කෙසේ වුවත් මෙම නිෂ්පාදන අමු ද්‍රව්‍ය විවිධ අනුපාතයන්ගෙන් යොදා තවදුරටත් සංවර්ධනය කළ යුතු වේ.

## 5.2.8 පුවක්

**පසු අස්වනු තාක්ෂණය**

**ශ්‍රී ලංකා හා ඉන්දුනීසියානු පුවක් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනය**

අපනයනය සඳහා වියළි පුවක්වල යෝග්‍යතාව, ශ්‍රී ලංකා වියළි පුවක් හා ඉන්දුනීසියානු වියළි පුවක් අතර තුලනාත්මක රූපමය ලක්ෂණ, රසායනික සංයුතිය හා භෞතික ගුණාංග පරීක්ෂා කිරීම සඳහා මෙම අධ්‍යයනය

සිදු කරන ලදී. බීජවල රූපමය ලක්ෂණ අනුව ශ්‍රී ලංකා පුවක්වල වඩා සුදු පැහැති මධ්‍යයක් හා නොපැහැදිළි ලා දුඹුරු පැහැති වර්ණ නාලිකා දක්නට ලැබෙන අතර ඉන්දුනීසියානු පුවක්වල මද සුදු පැහැති මධ්‍යයක් හා පැහැදිළි තද පැහැති වර්ණ නාලිකා දක්නා ලැබේ. මදයේ හැඩය අණ්ඩාකාර ලෙස සැලකීමෙන් ශ්‍රී ලංකා හා ඉන්දුනීසියානු පුවක්වල භෞතික ගුණාංග නිර්ණය කරන ලදී. ඉන්දුනීසියානු පුවක්වල ගෙඩියකට වැඩි විෂ්කම්භයක්, දළ පරිමාවක්, ප්‍රක්ෂිප්ත ක්ෂේත්‍රක් හා බරක් ද ශ්‍රී ලංකා පුවක්වලට සාපේක්ෂව ප්‍රමත ප්‍රධාන අක්ෂයේ දී වැඩි වටකුරු හා ගෝලාකාර බවක් පෙන්නුම් කරන ලදී. ශ්‍රී ලංකා පුවක්වල වැඩි සත්‍ය ඝනත්වයක්, බහු ඝනත්වයක් හා සවිවරතා ගුණයන් පෙන්නුම් කරන ලදී.ගුණාත්මක විශ්ලේෂණයේදී ඉන්දුනීසියානු පුවක් වල ශ්‍රී ලංකා පුවක්වලට සාපේක්ෂව දළ කෙදි,අළු (Ash), වාෂ්පශීලී තෙල් ප්‍රමාණයක් ඇතිබව සොයාගන්නා ලදී. එසේම ශ්‍රී ලංකා පුවක්වල වැඩි කාබෝහයිඩ්රේට් ප්‍රමාණයක් නිරීක්ෂණය කරන ලදී. එසේ පුවක් දෙවර්ගයේම මිරිස්ටික්, පාමිස්ටික්,ලිනෝලෙයික් හා ලිනෝලෙයික් මේද අම්ල බහුල බව සොයා ගන්නා ලදී.

### 5.2.9 සාදික්කා

**ශාක කායිකවිද්‍යාව හා ශාක නිෂ්පාදනය**

මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානයේ (වරණ 10ක්) හා ගස්නාව මධ්‍යම පැළ තවානේ (වරණ 8ක්) බද්ධ කරන ලද සාදික්කා ක්ෂේත්‍ර ඇගයීමට ලක් කිරීම 2005 වසරේ සිට සිදු කරන ලදී. ක්ෂේත්‍රයේ සිටුවා වසර දෙකකට පසු පළමු වරට මල් හට ගැනීම හා එල දැරීම සිදු විය. ගස්නාව (72) මෙන්ම මාතලේ (32) පර්යේෂණ ස්ථානයේ දී ද ගසක හට ගන්නා ගෙඩි ගණනෙහි වැඩිම අගයක් පෙන්නුම් කරන ලද්දේ B (72) (දැල්පිටිය වරණය) මගිනි.

**ශාක ව්‍යාධිවේදය**

**සාදික්කා (*Myristica fragrance*) පත්‍ර හැලීමේ රෝගය පාලනය කිරීම**

මෙම රෝගය සඳහා දැනට දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇති ප්‍රතිකාර ක්‍රමය සමග වාණිජව ලබා ගත හැකි විවිධ දිලීර නාශක තුනක් (Copper oxychloride 50 % WP, Thiophanate methyl 70% හා Carbendazim 50% WP) සහ බෝර්ඩෝ මිශ්‍රණය 1% සංසන්දනය කරන ලදී. ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් ලැබුණු ප්‍රතිඵලවලට අනුව කාබනික වගාව සඳහා සහතිකකරණය කරන ලද වගාවන්වල රෝග පාලනය සඳහා බෝර්ඩෝ මිශ්‍රණය 1% තාවකාලිකව නිර්දේශ කළ හැක.

රූප විද්‍යාත්මක වශයෙන් *Colletotrichum* spp හා සමානකම් දක්වන විවිධ දිලීර වර්ග හතරක් විවිධ ස්ථාන පහකින් රැස් කර ගත් ආසාදිත පත්‍ර නියැදිවලින් ඒකලනය කර ගන්නා ලදී. මෙකී දිලීර ඒකලන හතරෙන් එකක් DNA සමප්‍රභවතා පරීක්ෂාවේ දී *Neofusicoccom* spp හා 77%ක සමරූපීතාවක් දක්වන ලදී.

වෙන් කරන ලද දිලීර වර්ග හතර සඳහා වත්මන් නිර්දේශිත දිලීර නාශක (Mancozeb හා COC) යොදාගෙන නාලස්ථ දිලීර නාශක පරීක්ෂණය සිදු කරන ලදී. නිර්දේශිත දිලීර නාශක දෙකක් මෙම දිලීර ඒකක හතර සම්බන්ධයෙන් වෙනස් අන්දමින් ක්‍රියා කරන ලදී.

**පසු අස්වනු තාක්ෂණය**

සාදික්කාවල තුනී ආස්තරණ වියළීමේ ලක්ෂණ හිරු එළියේ වියළීම හා යන්ත්‍රානුසාරයෙන් වියළීම යන ක්‍රම දෙකක් මගින් නිර්ණය කරණ ලදී. යන්ත්‍රානුසාරයෙන් වියළීම උෂ්ණත්ව මට්ටම් තුනක් යටතේ ($40^oC$, $50^oC$

හා 60$^{o}$C) සිදු කරන ලදී. අමු සාදික්කාවල මුල් තෙතමන ප්‍රතිශතය 68%ක් පමණ වේ. හිරු එළියේ වියළා ගැනීම මගින් තෙතමන ප්‍රතිශතය 10%ක් දක්වා අඩු කර ගැනීමට පැය 48ක කාලයක් ගත විය. යන්ත්‍ර මගින් වියළා ගැනීමේ දී 10%ක තෙතමන මට්ටමක් කරා ළඟා වීමට උෂ්ණත්ව මට්ටම 60$^{o}$C යටතේ පැය 23ක ද උෂ්ණත්ව මට්ටම 50$^{o}$C යටතේ පැය 26ක ද කාලයක් ගත විය. අඩුම වියළීමේ සීඝ්‍රතාවයක් පෙන්නුම් කරන ලද්දේ 40$^{o}$Cක උෂ්ණත්ව මට්ටමක් යටතේ වියළා ගැනීමේ දී වන අතර එහි දී 15%ක තෙතමන ප්‍රතිශතයක් කරා ළඟා වීමට පැය 28ක් ගත විය. 40$^{o}$C හෝ 50$^{o}$C උෂ්ණත්වය යටතේ යන්ත්‍ර මගින් වියළා ගැනීමේ දී සැලකිය යුතු ලෙස තෙල් හානි වීමක් වාර්තා නොවිණි. හිරු එළියේ වියළා ගත් නියැදියේ සමස්ත ක්ෂුද්‍ර ජීවී ගහනය ඒකක මිලිලීටරයට ග්‍රෑම් 72 x 10$^{3}$ (cfu) වූ අතර 40$^{o}$C, 50$^{o}$C හා 60$^{o}$C උෂ්ණත්ව මට්ටම් යටතේ යන්ත්‍රානුසාරීව වියළා ගැනීමේ දී සමස්ත ක්ෂුද්‍ර ජීවී ගහනය පිළිවෙළින් මිලි ලීටරයට ග්‍රෑම් 40, 32 හා 25 x 10$^{3}$ (cfu g) බැගින් විය. ඉහත ප්‍රතිඵලවලට අනුව 50 $^{0}$C උෂ්ණත්වය යටතේ යන්ත්‍රානුසාරීව වියළා ගත් සාදික්කා අනිකුත් ක්‍රම යටතේ වියළා ගත් සාදික්කාවලට වඩා ඉහළම ගුණාත්මකභාවයක් පෙන්නුම් කරන ලදී.

### 5.2.10 ගොරකා

**කීට විද්‍යාව**

ගොරකා ශාකයේ (*Garcinia questitia* Pierre.) මෘදු ඉටි කොරපොතු කෘමියාට (*Ceroplastes* sp.) එරෙහිව කාබනික හා රසායනික කෘමිනාශක ( Actara® 25WG (Thiamethoxam 25% WG), Regent® 50 SC (Fipronil), Provado®(Imidacloprid WG) හා කලණි ශාක සාරය®) ගැල්වීමෙන් ඇති වන ප්‍රතිඵල පරීක්ෂාවට ලක් කරන ලදී. Actara® 25WG (Thiamethoxam 25% WG) ගැල්වීමෙන් *Ceroplastes* sp. ගහනය අඩු කර ගත හැකි විය.

### 5.2.11 පැඟිරි

පැඟිරි තෙල් අස්වැන්න කෙරෙහි පැඟිරි පත්‍ර, ක්ෂේත්‍රයේ වියළා ගන්නා කාලය හා ආසවන කාලය මගින් ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පර්යේෂණයක් සිදු කරන ලදී. වියළි පත්‍ර බරට අනුව තෙල් අන්තර්ගතය ගණනය කළ විට සති දෙකක් වන තෙක් ක්ෂේත්‍රයේ වියළීමේ කාල සීමාව සහ තෙල් අස්වැන්න අතර සැලකිය යුතු සම්බන්ධතාවක් නොමැති බව පූර්ව පර්යේෂණයක දී අනාවරණය විය. ආසවන කාලය පැය 6ක් තෙක් ඉහළ නැංවූ විට තෙල් අස්වැන්න වැඩි කර ගත හැක. තව ද පැය 6ක් ආසවනය කිරීමෙන් පසු තෙල් අස්වැන්න සැලකිය යුතු මට්ටමකින් නැවත ඉහළ නොනඟින බව ද නිරීක්ෂණය කළ හැකි විය. එබැවින් පැය 6ක් ආසවනයට ලක් කිරීම වඩා පිරිමැසුම්දායී වන අතර මෙම ප්‍රතිඵලය වාණිජ තෙල් නිස්සාරක භාවිතයෙන් ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ තහවුරු කර ගත යුතුය.

## 5.3. 2014 වසර තුළ සිදු කෙරෙමින් පවතින පරීක්ෂණ

### 5.3.1 කුරුඳු

- කුරුඳු වගා ක්ෂේත්‍ර වල අපෘෂ්ඨවංශිකයින්ගේ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම
- කුරුඳුවල වර්ධනය හා අස්වැන්න කෙරෙහි කොම්පෝස්ට් හා අකාබනික පොහොර හා ඒවායේ සංයෝගයන් යෙදීමෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය

- කුරුඳු කඳ විදින සළඹයා (*Ichneumoniptera cinnamomumi*) සඳහා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- ආම්ලික පසෙහි වගා කරන කුරුඳු භෝගයේ වර්ධනය හා අස්වැන්න කෙරෙහි ඩොලමයිට් යෙදීමෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය
- කුරුඳුවල වර්ධනය, අස්වැන්න හා පසෙහි සාරවත්භාවය කෙරෙහි ග්ලිරිසීඩියා හා රනිල කුලයේ ආවරණ භෝග වගා කිරීමෙන් ඇති වන බලපෑම අධ්‍යයනය
- කුරුඳුවල ප්‍රධාන පළිබෝධකයින් පාලනය සඳහා භෝග සුවතා ප්‍රමුඛ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම
- කුරුඳු බීජපැළ සඳහා බඳුන් මිශ්‍රණයක් ලෙස පණු පොහොර හා ක්ෂුද්‍රජීවී කොම්පෝසට් පොහොර යෙදීමෙන් යටිපස වැඩි දියුණු කිරීම
- කුරුඳු සඳහා බඳුන් මිශ්‍රණය සැකසීමට විවිධ කාබනික/අකාබනික පොහොර හා ජෛව පෝෂක සමග යටිපස යොදා ගැනීමේ හැකියාව පරීක්ෂාවට ලක් කිරීම
- ප්‍රධාන කුරුඳු වගා ප්‍රදේශවල තෝරා ගත් පස් හා භෝග ඵලදායීතා සම්බන්ධතාවන්හි පාංශු පෝෂක තත්ත්වයන් වර්ගීකරණය හා ඇගයීම
- කුරුඳු පිළිබඳ තවාන් අධ්‍යයන: කුරුඳු බීජපැළවල වර්ධනය කෙරෙහි කුරුඳු ලීවලින් ලබා ගන්නා අඟුරු හා කුරුඳු කුඩුවලින් ලබා ගන්නා අඟුරුවලින් ඇති වන බලපෑම
- කුරුඳු වගාවේ මුල් අවධියේ දී ඉඟුරු හා කහ අතුරුභෝග ලෙස වගා කිරීම
- කුරුඳු පොතු පටක වල වැලි සහිත ගුණාත්මය ඇති වීම අධ්‍යයනය
- කුරුඳු පැළ තවාන් සඳහා පළිබෝධ හා රෝග කළමනාකරණ ක්‍රමවේදය සංවර්ධනය කිරීම.
- කුරුඳු වගාබිම්වල පාංශු අපෘෂ්ඨවංශිකයින්ගේ ක්‍රියාකාරකම් අධ්‍යයනය
- තෝරාගත් කුරුඳු ප්‍රභේද (ශ්‍රී විජය හා ශ්‍රී ගැමුණු) හා පීරිස් කුරුඳුවල ඉහළ ගුණාත්මකභාවයේ ලක්ෂණ ඇගයීම හා සංසන්දනය
- කුරුඳු වර්ධනය හා අස්වැන්න කෙරෙහි පොහොර යෙදීමේ කාල සීමාවෙන් ඇති වන බලපෑම අධ්‍යයනය
- ගුණාත්මකභාවය, වර්ධනය හා අස්වනු ක්‍රියාකාරීත්වය සඳහා තෝරාගත් දෙමුහුම් කුරුඳු ප්‍රභේද පරීක්ෂාවට ලක් කිරීම හා ඇගයීම
- පෘෂ්ඨවංශික පළිබෝධකයින්ට එරෙහි ආරක්ෂණ ක්‍රමවල කාර්යක්ෂමතාව අධ්‍යයනය හා හානි ඇගයුම
- කුරුඳු කඳ විදින සළඹයා ආකර්ෂණය කරන රසායනික සංසටකය හඳුනා ගැනීම හා වෙන් කර ගැනීම
- කුරුඳු පැළ මැක්කන් විශේෂයන්ගේ රසායනය, ඔවුන්ගේ ජෛව විද්‍යාත්මක ලක්ෂණ සහ පැළ මැක්කන් පාලනය සඳහා යෝග්‍ය ආකර්ෂණය කර ගැනීමේ සංසටක පෙරමෝන හඳුනා ගැනීම
- කුරුඳුවල මුල් සුදු වීමේ රෝගය පාලනය කිරීම සඳහා යෝග්‍ය පාලන ක්‍රමයක කාර්යක්ෂමතාව ඇගයීම
- කුරුඳු තැළීමේ හැකියාව කෙරෙහි නයිට්‍රජන් අඩංගු පොහොර යෙදීමෙන් වන බලපෑම අධ්‍යයනය
- වැඩිදුර නවීකරණය කරන ලද කුරුඳු තැලීමේ මේසයක් නිර්මාණය කොට ඇගයීම
- අධි ශීතකරණයට ලක් කිරීම ඔස්සේ කුරුඳු තැලීමේ පිරිමැසුම්දායීබව ඇගයීම

- නීරෝගී අංකුර ලබා ගැනීම සඳහා කැපුම් පෘෂ්ඨය ආවරණය කිරීම හා කුරුඳු පඳුරේ කැපුම් පෘෂ්ඨයෙන් යුෂ වහනය වැළැක්වීම සඳහා යොදා ගන්නා විවිධ ක්‍රමවල බලපෑම අධ්‍යයනය.
- කුරුඳුවල ප්‍රධාන පත්‍ර ආකාර තුන පිළිබඳ අධ්‍යයනය

**5.3.2 ගම්මිරිස් (*Piper nigrum* L)**

- බහු මුඛ්‍යාංග ගම්මිරිස් සංවර්ධන වැඩසටහන (NARP ව්‍යාපෘතිය) (පහතරට අන්තර්මධ්‍ය කලාපයේ පොල් යටතේ)
- පහතරට අන්තර්මධ්‍ය කලාපය සඳහා තෝරාගත් ගම්මිරිස් වගා දර්ශ දෙමුහුම් කිරීම.
- ගම්මිරිස්වල තිරස් හා හරස් වශයෙන් ලබා ගත් දඬු කැබලිවලින් සකසා ගත් පැළවලින් (GK 49) ඒකක වපසරියකට ලැබෙන අස්වැන්න සංසන්දනය
- විවිධ කෘෂි පාරිසරික කලාපයන් යටතේ ගම්මිරිස්වල මල් හට ගැනීම, ඵල දැරීම හා අස්වැන්න පිළිබඳ අධ්‍යයනයන් (පොල් යටතේ අතුරු වගාවක් ලෙස)
- ගම්මිරිස් සඳහා ජෛව ආධාරකයක් ලෙස පොල් ශාකය භාවිතා කිරීමේ හැකියාව අධ්‍යයනය
- අර්ධ වශයෙන් දැවුණු පිදුරු, පොස්ෆරස් හා දිලීරකමූල සංයෝගයෙන් ගම්මිරිස් ප්‍රරෝහණය සඳහා වන බඳුන් මිශ්‍රණය වැඩි දියුණු කිරීම
- ගම්මිරිස්වල වියනේ වර්ධනය හා අස්වැන්න කෙරෙහි විවිධ කප්පාදු මට්ටම්වලින් ඇතිවන බලපෑම
- විවිධ කෘෂි පාරිසරික කලාපයන් යටතේ ගම්මිරිස්වල වර්ධක ප්‍රචාරණය, මල් හට ගැනීම, ඵල දැරීම හා අස්වැන්නේ විවිධතා පිළිබඳ අධ්‍යයනය.
- ආධාරක ශාක යොදා ගැනීම ඔස්සේ අස්වැන්න වැඩි කර ගැනීම සඳහා ගම්මිරිස්වල සම්පත් උපයෝජන කාර්යක්ෂමතාව වර්ධනය කිරීම
- ගම්මිරිස්වල පැළය හොඳින් වගා බිමෙහි ස්ථාපනය වීම, වර්ධනය හා අස්වැන්න කෙරෙහි ක්ෂුද්‍ර ජල සම්පාදනයේ බලපෑම
- ගම්මිරිස්වල වියනේ වර්ධනය හා අස්වැන්න කෙරෙහි විවිධ කැපුම් ක්‍රමවලින් ලබාගත් රෝපණ ද්‍රව්‍යවලින් වන බලපෑම
- ගම්මිරිස්වල මල් හට ගැනීමේ හා ඵල දැරීමේ පුරුදු සඳහා පසෙහි තෙත්බව මගින් ඇති කරන බලපෑම
- තිරස් හා සිරස් කැපුම් හා තනි පුරුක් කැපුම් ඔස්සේ ලබා ගත් ගම්මිරිස් පැළවල වර්ධනය හා අස්වැන්න සංසන්දනය.
- පටක රෝපිත පැළ හා තනි පුරුක් කැපුම් ඔස්සේ ලබා ගත් පැළවල වර්ධනය හා අස්වැන්න සංසන්දනය.
- අපනයන කෘෂි භෝග (විශේෂයෙන්ම ගම්මිරිස්) සම්බන්ධ පසු අස්වනු ක්‍රියාකාරකම්ල විවිධ මට්ටම්වල දී සිදු වන ක්ෂුද්‍ර ජීවී ආසාදනයන් හඳුනා ගැනීම හා පාලනය
- ගම්මිරිස්වල වර්ධනය හා අස්වැන්න කෙරෙහි නයිට්‍රජන් මූලාශ්‍රයෙන් වන බලපෑම අධ්‍යයනය
- ගම්මිරිස්වල පාංශු ගුණාංග, වර්ධනය හා අස්වැන්න කෙරෙහි ආවරණ භෝගවලින් වන බලපෑම
- ගම්මිරිස්වල ක්ෂේත්‍ර ස්ථාපනය අනුපාතයට පස සකස් කිරීමේ බලපෑම අධ්‍යයනය

- ගම්මිරිස් කහ වීම සඳහා බලපාන පාංශු තත්ත්වයන් අධීක්ෂණය සඳහා යෝග්‍ය ජෛව දර්ශක හඳුනා ගැනීම
- ගම්මිරිස් වැල් ගුල්ලා (*Pterolophia annulata*), ජෛවීය ලක්ෂණ, හානි හා පාලනය අධ්‍යයනය
- කාබනික තත්ත්වයන් යටතේ දේශීය ගම්මිරිස් ප්‍රභේද ඇගයීම
- ගම්මිරිස්වල තෝරා ගත් ආබද්ධයන් ඇගයීම

**5.3.3 කොකෝවා** (*Theobroma cacao*)

- කොකෝවා බීජ උද්‍යානය/සංරක්ෂණ ක්ෂේත්‍රය ස්ථාපනය
- අංකුර බද්ධය හා මුල් අද්දවන ලද දඬු කැබලි භාවිතයෙන් වර්ධක ප්‍රචාරණය වැඩිදුර දියුණු කිරීම හා මිශ්‍ර වගාව සඳහා කොකෝවා මව් ශාක තෝරා ගැනීම.
- පොල් හා රබර් යටතේ යහපත් කළමනාකරණ පිළිවෙත් ඇතුළුව ඒකාබද්ධ පාංශු හා ශාක පෝෂක කළමනාකරණ පද්ධතියක් ඔස්සේ කොකෝවාවල ඵලදායිතා වර්ධනය (පොල් සංරචකය) (NARP ව්‍යාපෘතිය), 2012-2014.
- කොකෝවාවල රේන්ද මකුණාට (*Helopeltis ceylonensis* (ද සිල්වා) ඔරොත්තු දෙන වගා දර්ශ හඳුනා ගැනීම
- රබර් හා පොල් යටතේ ඒකාබද්ධ පාංශු හා ශාක පෝෂක කළමනාකරණය ඔස්සේ කොකෝවාවල ඵලදායිතා වර්ධනය
- දුර්වල තත්ත්වයේ කොකෝවා වගා බිමක් සඳහා කොකෝවා ලෙලි භාවිතයෙන් පාංශු තත්ත්වකාරකයක් සකස් කිරීම
- මුල් අද්දවන ලද කොකෝවාවල ක්ෂේත්‍ර ක්‍රියාකාරීත්වය ඇගයීම

**5.3.4 කෝපි** (*Coffia* sp.)

- පහත රට අන්තර්මධ්‍ය කලාපයේ පොල් යටතේ තෝරාගත් කෝපි වගා දර්ශ වල ක්‍රියාකාරීත්වය ඇගයීම
- කෝපි ගුල්ලා පාලනය සඳහා *Beauveria brassiana* දිලීරය භාවිතය
- කෝපි ගුල්ලාගේ ජෛව පාලන කාරකයින් පිළිබඳ පරීක්ෂණ
- කෝපි ගුල්ලා ආකර්ෂණය කර ගැනීමේ උගුලක් නිර්මාණය කිරීම
- ඇරබිකා කෝපි කාබනික ලෙස වගා කිරීමේ උපක්‍රම
- තෝරාගත් ඇරබිකා කෝපි පෙළපත් ඇගයීම

**5.3.5 කරදමුංගු**

- කරදමුංගු පැළ මැක්කා (*Sciothrips cardamomi*) සඳහා පාලන ක්‍රමවේදයන් සංවර්ධනය
- පැළ මැක්කන්ට එරෙහිව කරදමුංගුවල වන දර්ශ පරීක්ෂාවට ලක් කිරීම

**5.3.6** කරාබු (*Euginia caryophyllus*)

- මැද රට කරාබුවලට වැළඳෙන කොළ හැළිමේ රෝගය (පත්‍ර මැලවීම හා පත්‍ර මත ලප ඇති වීම) පාලනය
- කරාබුවල මල් හට ගැනීම උත්තේජනය කිරීම සඳහා ශාක වර්ධක පාලකයන් (Paclobutrazol) යෙදීම

**5.3.7** සාදික්කා (*Myristica fragrans*)

- බද්ධ කරන ලද සාදික්කා වරණ ක්ෂේත්‍ර ඇගයීමට ලක් කිරීම
- සාදික්කා පත්‍ර පතන රෝගය පාලනය කිරීමේ ක්‍රමවේදයන්

**5.3.8** ගොරකා (*Garcinia quaesita*)

- බද්ධ කරන ලද ගොරකා වරණ ක්ෂේත්‍ර ඇගයීමට ලක් කිරීම.
- ගොරකා ශාකයට හානි කරන මෘදු ඉටි කොරපොතු කෘමියා (*Ceroplastes* sp) මර්දනය සඳහා යොදා ගන්නා රසායන කෘමිනාශකවල කාර්යක්ෂමතාව ඇගයීම හා එහි පරපෝෂිතයින් හඳුනා ගැනීම

**5.3.9** බුලත් (*Piper betle*)

- ශ්‍රී ලංකාවේ බුලත් ජාන ප්ලාස්ම රැස් කිරීම, ස්ථාපනය, ඇගයීම හා සංරක්ෂණය
- බුලත්වල වර්ධනය හා අස්වැන්න සඳහා විකල්ප පෝෂණ මාධ්‍යයක් ලෙස අර්ධ වශයෙන් දැවුණු පිදුරුවල බලපෑම අධ්‍යයනය
- මනේරු (*Piper betle* L.) හා මල බුලත් (*Piper chuvya*) රටදළු (*Piper betle* L.) සමග අභිජනනය හා ඒවායේ පසු පරම්පරාවන්හි අස්වනු පරාමිතීන් රටදළු සමග සංසන්දනය
- බුලත් වගාවේ ඒකල ආධාර පද්ධතියක් සඳහා දෙපාර්තමේන්තු පොහොර මිශ්‍රණය ඇගයීම
- බුලත්වල බැක්ටීරියාමය පත්‍ර මැලවීමේ රෝගය පාලනය සඳහා දේශීය ක්‍රම අනුගමනය පිළිබඳ පරීක්ෂාව
- පොල් යටතේ වගා කරන බුලත් සඳහා දිළීරකමූල සහ වාණිජමය සල්ෆර් කුඩු භාවිතයෙන් රොක් පොස්පේට් ද්‍රාව්‍යතාව වැඩි දියුණු කිරීම

**5.3.10** ඉඟුරු (*Zingibar officinale*)

- පොල් යටතේ ඉඟුරු ජාන ප්ලාස්මය ඇගයීම
- ඉඟුරුවල අස්වැන්න හා ගුණාත්මකභාවය කෙරෙහි රෝපණ ද්‍රව්‍යයේ විශාලත්වයෙන් වන බලපෑම
- දේශීය ඉඟුරුවල (*Zingiber officinale* L.) වර්ධනය හා අස්වැන්න කෙරෙහි සිටුවන පරතරය හා වගා කරන කාලයන්හි වෙනස්වීම අනුව වන බලපෑම
- බීජ රයිසෝම ලෙස ඉඟුරුවල ප්‍රරෝහ්‍යතාව සඳහා විවිධ ඇසුරුම් තත්ත්වයන්ගෙන් වන බලපෑම අධ්‍යයනය.
- ඉඟුරුවල ප්‍රධාන රෝග පිළිබඳ අධ්‍යයනයක්
- ඉඟුරු ප්‍රරෝහණය හා අස්වැන්න කෙරෙහි රයිසෝම මත සිටින ඉටි කොරපොතු කෘමියාගේන් වන බලපෑම

- විවිධ කෘෂි පාරිසරික කලාප යටතේ ඉඟුරුවල වර්ධනය හා අස්වැන්න කෙරෙහි පැළ සිටුවන කාලයෙන් හා පැළ අතර පරතර තැබීමෙන් ඇති වන බලපෑම

**5.3.11** කහ (*Curcuma longa*

- කහවල අස්වැන්න හා ගුණාත්මකභාවය කෙරෙහි රෝපණ ද්‍රව්‍යයේ විශාලත්වයෙන් ඇතිවන බලපෑම

**5.3.12 වෙනත්**

- ජෛව පෝෂක (Arbuscular Mycorriza-AM), ජෛව පාලන කාරක (*Trichoderma* spp. *Pseudomonas fluorescens*) හා බහු රෝපණය
- අපනයන කෘෂි භෝග ගබඩා කර තැබීමේ දී පළිබෝධකයන්ගෙන් වන හානි ඇගයීම
- ක්ෂීරපායී පළිබෝධකයින් හා ඔවුන් පාලනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයන
- මාතලේ අපනයන කෘෂි භෝග ආදර්ශ ගෙවතු වගාව

**5.4 පර්යේෂණ අංශයේ වෙනත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

**5.4.1 මාතලේ පර්යේෂණ ගොවිපළෙන් නිකුත් කළ වැඩි දියුණු කළ රෝපණ ද්‍රව්‍ය**

ජාන හා ශාක අභිජනන අංශය මගින් පවත්වාගෙන යන බීජ උද්‍යාන ඔස්සේ කෝපි බීජ කි.ග්‍රෑ. 9.5, බීජ කොකෝවා ගෙඩි 2065ක් හා බීජ පුවක් 30,650ක් බෙදා හරින ලදී.

නිල්ලඹේ උප පර්යේෂණ මධ්‍යස්ථානයේ වී වගාව අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන අතර මහ කන්නය සඳහා දේශීය සහල් ප්‍රභේද වගා කරන ලදී.

**5.4.2 සංවර්ධන ක්‍රියාකාරකම්**

2014 වසරේ සිට අතුරුභෝග හා බුලත් පර්යේෂණ පිළිබඳ නව සංවර්ධන සැලැස්මක් ආරම්භ කෙරුණු අතර එමගින් ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් අරමුණු සපුරා ගැනීම ඉලක්ක කරන ලදී.

- අක්කර 2ක පොල් වගාවක යටි වගාව සිටුවා නිම කරන ලද අතර එම වගා බිමෙහි අතුරුවගාවක් ලෙස සිටුවීම සඳහා වළවල් සකසා ඊළඟ මෝසම් වැසි ලැබෙන සමයේ සිටවනු පිණිස පොලිතීන් මලුවල පැළ සිටුවා සකස් කර ගන්නා ලදී. කෝපි, බුලත්, ගොරකා, සාදික්කා, කරාබු, කොකෝවා, පුවක්, කරදමුංගු, කිතුල් හා ගම්මිරිස් අතුරුවගා ලෙස සිටවනු ලැබේ.
- අතුරුවගා කරන ලද භූමිය හා අනෙකුත් සියලු පර්යේෂණ ක්ෂේත්‍ර ආවරණය කරමින් අතිරේක ජල සම්පාදන පද්ධතිය ආරම්භ කරන ලදී. මේ සඳහා ලීටර් 2000 බැගින් ධාරිතාව සහිත ජල ටැංකි දෙකක් හා අඩි 32,000ක් දිග නළ මාර්ගයක් යොදා ගන්නා ලදී.
- තෝරාගත් IBRS 1 and IBRS 2 බුලත් පෙළපත් හා සාමාන්‍ය ලෙස වැවුණු බුලත් ශාකයන්ගේ අතු කැබලි යොදා ගනිමින් මහා පරිමාණයෙන් බුලත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කරන ලදී. මෙම අතු කැබලි පාත්ති පද්ධතියක් ලෙස සිටුවා ඇති අතර, මේ වන විට වගා බිමෙහි ආධාරක කෝටු 600ක් පමණ ඇත.

### 5.4.3 ජාතික ප්‍රදර්ශන හා වැඩමුළු

- දැයට කිරුළ ප්‍රදර්ශන භූමිය සංවර්ධනය හා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය සඳහා ප්‍රදර්ශන පැවැත්වීම.
- ගොවි සතිය, කුරුඳු මංගල්‍යය, ජාතික කුළුබඩු පූජා මංගල්‍යය ආදී ප්‍රදර්ශන සඳහා සම්පත් ආධාරක හා ප්‍රවීණත්වය සැපයීම.
- ජාත්‍යන්තර ගම්මිරිස් දිනය සැමරීම සඳහා සංවර්ධන අංශය සමග එක් වී එක් දින තාක්ෂණික වැඩමුළුවක් සංවිධානය කර පවත්වන ලදී.
- අපනයන සංවර්ධන මණ්ඩල වැඩමුළු, ජාතික විද්‍යා පදනමේ වැඩමුළු හා CARP වැඩමුළු වැනි දේශීය වැඩමුළු හා පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම.

### 5.4.4. මාතලේ හා දැල්පිටිය පර්යේෂණ ආයතනවල ජාතික කුළුබඩු උද්‍යානයක් පිහිටුවීම

- ජාතික කුළුබඩු උද්‍යානය මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානයට අනුයුක්තව විශේෂඥ තාක්ෂණ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරනු ඇත. ක්ෂේත්‍ර ස්ථාපන කටයුතුවලින් 90 % කට වැඩි ප්‍රමාණයක් මේ වන විටත් අවසන් කර ඇත. මාර්ග, පටුමං, ගේට්ටු, දැල් ආවරණ, ගම ගෙදර, පොකුණු ආදී අනෙකුත් යටිතල පහසුකම් ද බොහෝ දුරට සම්පූර්ණ කොට තිබේ. ඇතැම් ගොඩ නැඟීම් තවදුරටත් සිදු වෙමින් පවතී.
- දැල්පිටිය උප පර්යේෂණ ආයතනයේ "මැදරට කුළුබඩු අරණ"නමින් කුළුබඩු උයන් සංවර්ධන වැඩසටහනක් ආරම්භ කෙරිණි. ඖෂධමය ශාක එකතුව සිටුවා අවසන් කරන ලද අතර සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු වේ.

### 5.4.5. පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් සිදු වූ පැළ සහතිකකරණ වැඩසටහන්

මාතලේ ව්‍යාප්ති නිලධාරී කොට්ඨාසයේ පැළ තවාන් විස්සක් පරීක්ෂා කොට සහතික ලබා දෙන ලදී.

### 5.4.6. වැවිලි උපදේශන සේවා සඳහා වගා බිම් වෙත යාම

- ➢ රාජ්‍ය අංශයේ ඉල්ලීම් අනුව විශේෂඥ සේවා සැපයීම සඳහා පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් වගා බිම් නවයක් වෙත ගිය අතර අදාළ ඉල්ලීම් සඳහා නිර්දේශ ලබා දී ඇත. නියෝජිත පාංශු නියැදිකරණය හා භූමියට විශේෂිත වූ නිර්දේශ ද යෝග්‍ය පරිදි ලබා දෙන ලදී.

- ➢ කුරුණෑගල, බදුල්ල, රත්නපුර, කෑගල්ල, මහනුවර හා මාතලේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පැවැත්වුණු තවාන් කළමනාකරණ හා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් හයකට සහභාගි විණි.

- කොත්මලේ ප්‍රජා හා වෘත්තිය සංවර්ධන ව්‍යාපෘතියේ ගොවීන් සඳහා වැඩසටහන් තුනක් පවත්වන ලදී.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සන්නිවේදන අංශය මගින් පවත්වන ලද විවිධ මහා පරිමාණ සන්නිවේදන වැඩසටහන් සඳහා සම්පත්දායකයින් හා ප්‍රදර්ශන භාණ්ඩ ලබා දීම.

- අවශ්‍ය කල්හි අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාස්ථ පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයන් හා තාක්ෂණ සම්ප්‍රේෂණ පහසුකම් ලබා දී ඇත.

- ගම්පහ දිස්ත්‍රික්කයේ පුවක් කුඩා වීම සම්බන්ධ ගැටලුව විසඳීම සඳහා පරීක්ෂණ පවත්වන ලදී.

**5.4.7 පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලද පුහුණු වැඩසටහන්**

**ගොවීන්, සිසුන්, ගුරුවරුන් හා නිෂ්පාදකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම**

ස්වකීය ක්ෂේත්‍ර පුහුණු අවශ්‍යතා සපුරා ගනු පිණිස පහත සඳහන් කණ්ඩායම් මධ්‍යම පර්යේෂණ ආයතනය වෙත පැමිණි අතර අපගේ පර්යේෂක මඬුල්ල විසින් ඔවුන්ට අපනයන කෘෂි භෝග පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුව සපයන ලදී.

- විශ්ව විද්‍යාල සිසුන් 385
- පාසැල් සිසුන් 358
- පාසැල් ගුරුවරුන් 110
- ගොවීන් 235
- කෘෂි පාසැල්වල සිසුන් 78
- පාර්ශ්වකරුවන් 7 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන්
- නාරම්මල, අතුරුභෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ දී ගොවි පුහුණු පංති 16ක් පවත්වන ලද අතර ඒ සඳහා ගොවීන් 481 දෙනෙකු සහභාගි කරවා ගන්නා ලදී. වගා ගැටලු විසඳා ගැනීම සඳහා බුලත් වගා කරන්නන් 150ක් පර්යේෂණ මධ්‍යස්ථානය වෙත පැමිණි අතර මධ්‍යස්ථානයට ඇමතුම් ලබා ගත් බුලත් වගා කරන්නන් 161 දෙනෙකුට ද අවශ්‍ය උපදෙස් හා විසඳුම් ලබා දෙන ලදී.

**5.4.8. පළිබෝධ හා රෝග මර්දනය**

**පැළෑටි ආරක්ෂණ සේවාව**

ශාක ආරක්ෂණ සේවාව යටතේ මතු සඳහන් පුහුණු, ක්ෂේත්‍ර දින හා ක්ෂේත්‍ර චාරිකා පැවැත්වුණු අතර අදාළ රෝග සඳහා විසඳුම් ලබා දෙන ලදී. ක්ෂේත්‍ර දින හා ක්ෂේත්‍ර චාරිකාවලට අමතරව අපගේ ප්‍රධාන දුරකථන අංකය වෙතට හා 1920 ඔස්සේ පවත්වාගෙන යන ''ගොවි සහන සරණ සේවය'' වෙත ලැබුණු ශාක ආරක්ෂණ ගැටලු සඳහා උපදෙස් ලබා දෙන ලදී.

**5.4.8.1 ශාක ආරක්ෂණ සේවය සම්බන්ධ තාක්ෂණ සම්ප්‍රේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර**

| භෝගය | රෝගය/පළිබෝධ | පුහුණු වැඩසටහන් | ක්ෂේත්‍ර දින ගණන | ක්ෂේත්‍ර චාරිකා |
|---|---|---|---|---|
| සාදික්කා | පත්‍ර හැලීමේ රෝගය | 02 | 05 | 03 |
| | මුල් සුදු වීමේ රෝගය | - | - | 03 |
| ගම්මිරිස් | පත්‍ර කුඩා වීමේ රෝගය | 01 | - | 01 |
| | මන්දගාමී මැලවීම | | - | 01 |
| | ශීඝ්‍ර මැලවීම | | - | 01 |
| | කොළ අංගමාරය | | - | 01 |
| | වෙනත් | | - | 02 |
| කරාබු | කොළ අංගමාරය/හැලීම | - | - | 01 |
| | මුල් කුණු වීම | - | - | 01 |
| | කඳ විදින ගුල්ලා | - | - | 01 |
| පුවක් | පුෂ්ප මංජරිය මැරී යාම | - | - | 01 |
| ඉඟුරු | රයිසෝම කුණු වීම/ පත්‍ර ලප | 01 | - | 02 |
| කුරුඳු | මුල් දුඹුරු පැහැ ගැන්වීම | - | - | 01 |
| | වෙනත් | - | - | 01 |
| කහ | කහ රෝග | 01 | - | - |
| කොකෝවා | කොකෝවා පළිබෝධ හා | 01 | - | - |
| ග්ලිරිසීඩියා | මුල් කුණු වීම | - | - | 01 |
| | අතු විදින ගුල්ලා | - | - | 01 |
| සියලු අපනයන කෘෂි භෝග | තවාන් රෝග | 03 | - | - |
| සියලු අපනයන කෘෂි භෝග | ශාක ආරක්ෂණය | 01 | - | - |
| එකතුව | | **10 (සහභාගිවූවන් සං. 200)** | **05 (සහභාගිවූවන් සං. 100)** | **22** |

**5.4.9 පර්යේෂණ අංශයෙන් නිකුත් කළ රෝපණ ද්‍රව්‍ය**

| භෝග | පැළ(සංඛ්‍යාව) |
|---|---|
| කුරුඳු | 219,075 |
| ගම්මිරිස් | 73,312 |
| පඳුරු ගම්මිරිස් | 1080 |
| කෝපි | 1339 |
| කරදමුංගු | 20 |
| කොකෝවා | 1070 |
| සාදික්කා<br>බද්ධ කළ බීජ පැළ | 65<br>951 |
| කිතුල් | 1163 |
| පුවක් | 13,060 |
| කරාබු | 218 |
| ගොරකා | 07 |
| බුලත් | 389 |

**5.4.10. සාමූහික පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිය**

2014 වර්ෂය තුළ පහත සඳහන් සාමූහික පර්යේෂණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මකව පැවතිණි.

**1. ෆොස්ෆේට් පොහොරවල ද්‍රාව්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා ක්ෂුද්‍ර ජීවීන් භාවිතය - Grant No: RG/2011/AG/06**

මෙම පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂකවරයා වශයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය සී.එම්. නානායක්කාර ද සහාය පර්යේෂකවරු ලෙස ආචාර්ය එච්.ඒ. සුමනසේන හා ආචාර්ය ඩී.එන්. සමරවීර කටයුතු කරන ලදී. පර්යේෂණ කටයුතු කොළඹ විශ්ව විද්‍යාලයේ ශාක විද්‍යා පර්යේෂණාගාරයේ හා මාතලේ මධ්‍යම පර්යේෂණ ආයතනයේ සිදු වෙයි.

2. **ජීවනෝපාය සහ දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රචලිත කිරීම සහ එය ශ්‍රී ලාංකීය කෘෂි පාරිසරික පද්ධතිය තුළ භාවිතය**

මෙම ව්‍යාපෘතිය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන GEF/UNEP ආධාර ලබන ව්‍යාපෘතියකි. 2014 නොවැම්බර් මාසයේ සිට මෙම ව්‍යාපෘතියේ පහත සඳහන් සංරචක තුන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මධ්‍යම පර්යේෂණ ආයතනය යටතට පවරා ඇත.

**2.1)** භූගත පාංශු ජෛව විවිධත්වය සඳහා ස්ථානීය, කලාපීය හා ජාතික මට්ටමින් අධීක්ෂණ ක්‍රියාදාම හා පරිචයන් නිර්මාණය, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**2.2)** කෘෂි-ජෛව විවිධත්වය පවත්වා ගැනීම හා භාවිතය පිළිබඳ ගොවීන්ට මූලික ආධාර සැපයීමට අදාළ ප්‍රධාන පියවර/කාර්යයන් සමාලෝචනය සහ සහභාගීත්වය හා ගොවි ප්‍රමුඛ ප්‍රවේශයක් ඔස්සේ නව ද්‍රව්‍ය හඳුන්වා දීම.

**2.3)** කෘෂි-ජෛව විවිධත්වය පවත්වා ගැනීම හා නව ද්‍රව්‍ය භාවිතය හා හඳුන්වා දීම සම්බන්ධයෙන් ක්‍රියාකාරීන්ගේ භූමිකාව විශ්ලේෂණය

**5.5 අපනයන කෘෂි භෝග පිළිබඳ ආර්ථික හා වෙළෙඳ පර්යේෂණ**

**5.5.1 අධ්‍යයන හා පර්යේෂණ**

**5.5.1.1 නිෂ්පාදන පුරෝකථන වැඩසටහන**

අපනයන කෘෂි භෝග ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික්ක 14ක වගා කෙරෙන අතර මේවායින් බොහෝ වගාවන් කුඩා ප්‍රමාණයේ වතු හෝ ගෙවතුවල තැනින් තැන වගා කර ඇති ඒවාය. විශේෂයෙන්ම මැදරට කලාපයේ ග්‍රාමීය ප්‍රදේශවල සෑම ගෙවත්තකම පාහේ ගම්මිරිස්, කරාබු, සාදික්කා, පුවක්, වැනිලා ආදී බොහෝ අපනයන කෘෂි භෝග මිශ්‍ර භෝග ලෙස වගා කරනු දක්නට ලැබේ. ක්ෂේත්‍ර දත්ත ඔස්සේ වාර්ෂික අපනයන කෘෂි භෝග නිෂ්පාදනය ඇගයීම පහසු කාර්යයක් නොවන අතර වාර්ෂික අපනයන හා දේශීය පරිභෝජනය පදනම් කර ගනිමින් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම කරනු ලබයි. කෙසේ වුවද, මෙම ක්‍රමය අර්ධ වාර්ෂික හෝ කාර්තුමය ගණනය කිරීම් සඳහා යොදා ගත නොහැකි අතර වැඩි වන අපනයන හමුවේ

ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් සංකීර්ණ බවට පත්ව ඇත. එබැවින්, වාර්ෂික අපනයන කෘෂි භෝග නිෂ්පාදනය ක්ෂේත්‍ර මට්ටමින් පුරෝකථනය කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලද අතර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් විසින් ප්‍රධාන කෘෂි අපනයන භෝගවල මල් හට ගැනීමේ හා අස්වනු නෙළීමේ කාලයන් පිළිබඳව ද 2014 වසර සඳහා අපනයන කෘෂි භෝග නිෂ්පාදන පුරෝකථනයන් පිළිබඳ දත්ත රැස් කරන ලදී. ගම්මිරිස්, කුරුඳු, කෝපි, කරාබු, කරදමුංගු හා කොකෝවා සඳහා පුරෝකථනය කරන ලද ඇස්තමේන්තු පිළිවෙළින් මෙ.ටො. 2228, මෙ.ටො. 19620, මෙ.ටො.2992, මෙ.ටො. 5984, මෙ.ටො.1545 හා මෙ.ටො. 1066 විය. කෙසේ වුවද, විවිධ හේතූන් පාදක කොටගෙන පුරෝකථ මුළු අස්වැන්න ලබා ගත නොහැකි වූ නිසා සත්‍ය නිෂ්පාදන ගණනය කිරීම් පුරෝකථ අගයන්ට වඩා තරමක් අඩු අගයක් ගන්නා ලදී.

### 5.5.2 අපනයන කෘෂි භෝග වගා බිම් වපසරිය

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි භෝග අලුතින් සිටුවීමේ කාර්යයන්ගෙන් 95 % ක්ම සිදු කෙරෙනුයේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ඇතිවය. එබැවින්, 2014 වසරේ දී අලුතින් වගා කරන ලද අපනයන කෘෂි භෝග වගා වපසරිය ගණනය කරන ලද්දේ දෙපාර්තමේන්තුවේ නව වගා ආධාර යෝජනා ක්‍රමය යටතේ සාර්ථක තෙවැනි පරීක්ෂණයට මුහුණ දුන් බිම් ප්‍රමාණය මත පදනම්වය. (5.5.2.1 වගුව).

**5.5.2.1 වගුව: අපනයන කෘෂි භෝග ආධාර යෝජනා ක්‍රමය යටතේ අලුතින් සිටුවන ලද වගා බිම් ප්‍රමාණය - 2014**

| දිස්ත්‍රික්කය | කොකෝවා | කෝපි | කුරුඳු | කරදමුංගු | ගම්මිරිස් | කරාබු | සාදික්කා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| මහනුවර | 10.4 | 5.5 | 12.4 | 0.3 | 68.3 | 3.6 | 14.3 | 114.8 |
| මාතලේ | 1.0 | 1.5 | 67.2 | 0.2 | 118.1 | - | 4.8 | 192.8 |
| නුවරඑළිය | - | 8.1 | - | - | 5.8 | - | - | 13.9 |
| කුරුණෑගල | - | - | 1.0 | - | 13.0 | - | - | 14.0 |
| බදුල්ල | - | 0.4 | 2.0 | - | 29.9 | - | -- | 32.3 |
| මොණරාගල | - | - | 0.8 | - | - | - | - | 0.8 |
| කෑගල්ල | - | 0.4 | 14.6 | - | 7.9 | 1.1 | 2.0 | 26.0 |
| රත්නපුර | - | - | 33.5 | - | 24.3 | - | - | 57.8 |
| කොළඹ | - | - | 11.9 | - | 1.7 | - | - | 13.6 |
| කළුතර | - | - | 23.1 | -- | 1.1 | - | - | 24.2 |
| ගම්පහ | - | - | 15.6 | - | 18.5 | - | - | 34.1 |
| ගාල්ල | - | - | 32.4 | - | - | - | - | 32.4 |
| මාතර | - | - | 72.4 | - | 0.6 | - | - | 73.0 |
| හම්බන්තොට | - | - | 27.1 | - | - | -- | - | 27.1 |
| වෙනත් | - | - | - | - | - | - | - | - |
| එකතුව | 11.4 | 15.9 | 314.0 | 0.5 | 289.2 | 4.7 | 21.1 | 656.8 |

මූලාශ්‍රය: සංවර්ධන අංශයේ මාසික ප්‍රගති වාර්තා

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආධාර යෝජනා ක්‍රමය යටතේ 2014 වසරේ දී ප්‍රධාන වගා දිස්ත්‍රික්කවල අපනයන කෘෂි භෝග වගා හෙක්. 656.8ක ප්‍රමාණයක් වගා කර ඇත. කෙසේ වුවද, 2014 වසරේ දී

“දිවි නැඟුම” වැඩසටහන යටතේ ද හෙක් 365 කට අධික බිම් ප්‍රමාණයක අපනයන කෘෂි භෝග වගා කළ ද ඉහත ගණනය කිරීමට එම අගය ඇතුළත් නොවේ.
5.1 වගුවෙහි කාර්යසාධනය සැලකිල්ලට ගනිමින් සහ ‘2002 කෘෂිකර්ම සංගණනය‘ පදනම් කරගනිමින් 2014 වසරේ දිස්ත්‍රික්ක අනුව සිටුවා ඇති බිම් ප්‍රමාණය හා මුළු වගා වපසරිය ගණනය කරන ලදී (ඇමුණුම 1).

**5.5.3 2014 වසරේ දී තක්සේරු කළ අපනයන කෘෂිභෝග නිෂ්පාදනය**

ප්‍රධාන අපනයන කෘෂි භෝගවල වාර්ෂික නිෂ්පාදනය සාමාන්‍යයෙන් ගණනය කරනු ලබනුයේ ආර්ථිකයේ විවිධ අංශවල අපනයනය, දේශීය පරිභෝජනය (ජන සංගණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් වාර්තා කරන ඒක පුද්ගල වාර්ෂික පරිභෝජනය මත පදනම් කරගත් ගෘහස්ථ පරිභෝජනය, කාර්මික පරිභෝජනය හා ආහාර සේවා කර්මාන්ත පරිභෝජනය) හා ආනයන මත පදනම්වය. රඳවාගෙන ඇති තොග හා වාර්තා නොවූ අපනයනයන් සඳහා සැලකිය යුතු අගයක් වෙන් කරනු ලැබේ. මෙම උපකල්පනයන් මත පදනම්ව 2011-2014 අතර කාලය සඳහා ඇස්තමේන්තු කරන ලද අපනයන කෘෂි භෝග නිෂ්පාදන ධාරිතාව පහතින් දක්වා ඇත (5.5.3.1 වගුව).

**5.5.3.1 වගුව: තක්සේරු කළ අපනයන කෘෂි භෝග නිෂ්පාදනය – 2011/2014**

| **භෝගය** | **2011** | **2012** | **2013*** | **2014**** |
|---|---|---|---|---|
| කොකෝවා | 525 | 513 | 515 | 500 |
| කෝපි | 2,974 | 3,000 | 3,000 | 3,000 |
| කුරුඳු | 18,250 | 17,165 | 17,500 | 17,600 |
| ගම්මිරිස් | 10,834 | 18,604 | 28,000 | 17,000 |
| කරඳමුංගු | 57 | 80 | 50 | 87 |
| කරාබු | 5,533 | 4,009 | 6,190 | 3,225 |
| සාදික්කා, වසාවාසි) | 2,116 | 2,002 | 2,545 | 1,656 |
| පුවක් | 24,485 | 23,450 | 24,000 | 23,500 |
| බුලත් | 30,645 | 28,200 | 30,000 | 30,800 |
| පැඟිරි තෙල් | 9 | 13 | 14 | 11 |
| ඉඟුරු | 13,663 | 14,911 | 14,075 | 15,481 |
| කහ | 9,308 | 8,708 | 11,282 | 11,351 |

**මූලාශ්‍රය: ජන සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු දත්ත සංචිතය**

***සංශෝධිත ** යාවකාලිකයි**

**5.5.4 2014 වසරේ අපනයන කෘෂිභෝගවල අපනයන හා අපනයන ආදායම්**

අපනයන කෘෂි භෝගවල අපනයන පරිමාව සාර්ථකව තෙවැනි වරටත් 2014 වසර තුළ දී වර්ධනයක් පෙන්නුම් කළ ද, අපනයන ආදායම්වල පහළ යාමක් වාර්තා විණි. සමස්ත අපනයන ආදායම 2014 වසර වන විට 2013

වසරේ තිබූ මෙ.ටො.57,192,5 සිට මෙ.ටො. 59,827.3 දක්වා 4.6%කින් වැඩි වී ඇති නමුත් පසුගිය වසරේ රුපියල් මිලියන 48,392.7ක් වූ අපනයන ආදායම 2014 වසරේ දී රුපියල් මිලියන 43,223.5 තෙක් පහළ බැස්සේය. (ඇමුණුම II).

2013 වසරේ දී විශිෂ්ඨ ප්‍රගතියක් පෙන්නුම් කළ කුළුබඩු 2014 වසරේ දී ඒ ආකාරයේම ප්‍රගතියක් පෙන්නුම් කිරීමට සමර්ථ වූයේ නැත. විශේෂයෙන්ම 2013 වසරේ දී මෙ.ටො. 21,329.6 ක ප්‍රමාණයක් අපනයන කළ ගම්මිරිස් 2014 වසරේ දී අපනයනය කිරීමට හැකි වූයේ මෙ.ටො. 7,929.6ක් පමණක් වන අතර මෙය ඉතා ශීඝ්‍ර පහළ බැසීමක් බැව් පැහැදිළිය. කුරුඳු අපනයන පරිමාව 2013 වසරට වඩා 2014 වසරේ දී තරමක් අඩු වුව ද අපනයන ආදායම 0.8%කින් ඉහළ ගොස් ඇත. කරාබු, සාදික්කා හා වසාවාසිවල අපනයන පරිමාව 2013 වසරට සාපේක්ෂව පිළිවෙළින් 74.8 % , 6.4 % හා 33.2 % කින් පහළ බැස ඇති අතර මේ කුළුබඩුවල අපනයන ආදායම ද පසුගිය වසරට වඩා අඩු අගයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවේ ගම්මිරිස් වගා කරන ප්‍රධාන ප්‍රදේශ වන මාතලේ, මහනුවර, රත්නපුර දිස්ත්‍රික්කවල ගම්මිරිස් වැඩිම අස්වැන්න සාමාන්‍යයෙන් ජූලි-අගෝස්තු මාසවල දී ලැබුණ ද මේ වසරේ ප්‍රධාන කන්නය තුළ එම ප්‍රදේශවලින් ලැබුණු අස්වැන්න ඉතා අඩු වූ අතර ඒ වෙනුවට අප්‍රධාන කන්නයේ දී (2014 දෙසැම්බර්-2015 ජනවාරි) සැලකිය යුතු ප්‍රමාණයේ අස්වැන්නක් ලැබිණි. කෙසේ වුවද, එම අස්වැන්න තවමත් අපනයන කර නොමැති අතර ගම්මිරිස් අපනයනයේ අති විශාල පසු බැස්මක් දක්නට ලැබීමට එය ප්‍රධාන හේතුව විය හැක.

කොකෝවා හා කෝපිවල අපනයන පරිමාවන් 2013 වසරට සාපේක්ෂව පිළිවෙළින් 73 % ක් හා 198 % ක් වශයෙන් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර අපනයන ආදායම් ද 57.8 % ක් හා 94 % ක් බැගින් වර්ධනය වී ඇත. කොකෝවා අපනයනවලින් කොටසක් ආනයනික කොකෝවාවලින් නිෂ්පාදනය කරන ලද අගය එකතු කරන ලද නිෂ්පාදනයන්ගේ ප්‍රති-අපනයනයන් වේ. 2013 වසරේ මෙ.ටො. 6330ක් වූ කොකෝවා ආනයනය 2014 වසරේ දී මෙ.ටො. 3,680 ක් ලෙස අඩු වීමෙන් පෙනී යන්නේ අපනයන පරිමාවන් වැඩිවීම සඳහා දේශීය කොකෝවා නිෂ්පාදනය ඉහළ යා ම ද බලපා ඇති බවයි. කෝපි අපනයනයන්ගේ ඉහළ යාම මුළුමනින්ම දේශිය නිෂ්පාදනය වැඩිවීම තුළින් සිදු වී ඇති බව සැලකිය හැකි අතර වසරින් වසර කෝපි අපනයන වැඩි වීම සඳහා වගා බිම් වපසරිය පුළුල් කිරීම හා ඵලදායීතාව වර්ධනය සඳහා වන අපනයන කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ ආධාර යෝජනා ක්‍රම නියත වශයෙන්ම දායක වී ඇති බව පෙනී යයි.

අනෙකුත් භෝග අතරින් කරදමුංගු හා වැනිලා යන භෝගවල අපනයන පරිමාව හා ආදායම සැලකිය යුතු ඉහළ යාමක් පෙන්නුම් කර ඇති අතර බුලත් හා ඉඟුරුවල අපනයන පරිමාව හා ආදායමෙහි අඩු වීමක් පෙන්නුම් කර තිබේ. 2014 වසරේ අපනයන කෘෂි භෝග අපනයන සම්බන්ධයෙන් වන විශේෂිතම සිදුවීම වනුයේ මෑත ඉතිහාසයේ පුවක් සඳහා වාර්තා වූ ඉහළම අපනයන පරිමාව 2014 වසරේ දී වාර්තා වීමයි. 2014 වසරේ දී ශ්‍රී ලංකාවට පුවක් මෙ.ටො. 27,002.79 ක් ආනයනය කරනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාවෙන් පුවක් මෙ.ටො. 29,508.8 ක් අපනයනය කරනු ලැබ ඇත. ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවට පුවක් අපනයන කර අනතුරුව එය අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස ඉන්දියාවට ප්‍රති-අපනයන කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයකුට අවසර ලබා දී ඇති අතර 2014 වසර තුළ දී මෙම ව්‍යාපාරය ඉතා සාර්ථකව සිදු

කරගෙන යන ලදී. මේ අනුව, දේශීය වශයෙන් නිෂ්පාදිත පුවක්වල අපනයන පරිමාව මෙට්‍රික් ටොන් 2305.9ක් ලෙස සැලකිය හැක.

සමස්තයක් වශයෙන්, සගන්ධ තෙල් සම්බන්ධයෙන් 2013 වසරට වඩා අපනයන පරිමාවෙන් 1.9 % ක අඩු වීමක් පෙන්නුම් කළ අතර අපනයන ආදායම් 10.3 % කින් වැඩි වී ඇත. කුරුඳු පොතු තෙල්, ගම්මිරිස් තෙල්, සේර තෙල්, ඉඟුරු තෙල් හා අපනයන පරිමාවන් මෙන්ම අපනයන ආදායම අතින් ද ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර ගම්මිරිස් තෙල්වල පමණක් අපනයන පරිමාව 238.1 % කින් ද අපනයන ආදායම 184.37 % කින් ද වැඩි වී තිබේ. කුරුඳු කොළ තෙල්, කරාබු තෙල්, කරදමුංගු තෙල්, පැඟිරි තෙල් හා සාදික්කා තෙල්වල අපනයන පරිමාවන් 2013 වසරට සාපේක්ෂව පසුබෑමක් පෙන්නුම් කර තිබේ. (ඇමුණුම II).

### 5.5.5 අපනයන සම්බන්ධතා පවත්වන රටවල්

ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි භෝග ආනයනය කරනු ලබන ප්‍රධාන රටවල සැලකිය යුතු වෙනසක් සිදු නොවූ අතර වෙළෙඳපොළ තුළ ප්‍රමුඛ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලද්දේ සාම්ප්‍රදායික ගැනුම්කරුවන් විසිනි. සාමාන්‍ය පරිදි, සමස්ත කුරුඳු අපනයනයෙන් 40-45 % කට ආසන්න සංඛ්‍යාවක් මෙක්සිකෝව විසින් මිල දී ගනු ලැබූ අතර බොහෝ දකුණු ඇමෙරිකානු රටවල් විසින් විශාල කුරුඳු තොග මිල දී ගන්නා ලදී. 2014 දී ශ්‍රී ලංකා ගම්මිරිස්, කරාබු, සාදික්කා, වසාවාසි හා පුවක්වල ප්‍රධාන ගැනුම්කරුවා වූයේ ඉන්දියාව වන අතර 2013 වසරේ දී ශ්‍රී ලංකා ගම්මිරිස්වලින් 34 % ක් පමණක් මිල දී ගත් ඉන්දියාව 2014 වසරේ දී 65 % ක් මිලදීගත් අතර එම ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ඉන්දියානු සමාගම්වලින් සිදු කරන ලද දේශීය මිලට සිදුකරනු ලබන ගැනුම් වලට අමතරවය. 2014 වසරේ දී ඉන්දුනීසියාවෙන් පුවක් මෙ.ටො. 27,000 ආනයනය කරනු ලැබූ අතර , ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ප්‍රති-අපනයන ලෙස ඒවා ඉන්දියාවට අපනයනය කරනු ලැබිණි. 2014 වසරේ මෙ.ටො. 29,508.8 ක් වූ මුළු පුවක් අපනයනයෙන් මෙ.ටො. 29498.8 ක් ම මිල දී ගනු ලැබුවේ ඉන්දියාව විසිනි.

### 5.5.6 මිල හැසිරීම

සාදික්කා, කරාබු හා කරදමුංගු හැරුණු කොට ප්‍රධාන කෘෂි අපනයන භෝගවල සාමාන්‍ය වාර්ෂික ගොවිපළ මට්ටමේ මිල සාධනීය වර්ධනයක් පෙන්නුම් කර තිබුණ ද එය ඉතා විශාල වර්ධනයක් ලෙස සැලකිය නොහැක. 2012 සිට වසර තුනක් තිස්සේම කරදමුංගුවල මිල අඩු වෙමින් පැවති අතර පසුගිය දශකයේ දිගින් දිගටම ඉහළ යාමේ නැඹුරුතාවක් පෙන්නුම් කළ සාදික්කා මිල 2013 හා 2014 වසරවල දී අවනතියක් පෙන්නුම් කරන ලදී. මෙම භෝගවල ලෝක වෙළෙඳපොළ මිල ගණන් ද මේ සමාන හැසිරීමක් පෙන්නුම් කරන ලදී. පුවක්වල ගොවිපළ මට්ටමේ මිල ගණන් 2013 වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ 71%ක වර්ධනයක් අත් පත් කර ගනිමින් ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. (ඇමුණුම III).

### 5.5.7 2014 වසරේ දී අපනයන කෘෂි භෝග ආනයන ප්‍රවණතා

2014 වසරේ දී සැලකිය යුතු විශාල පරිමාවක අපනයන කෘෂි භෝග ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ තිබේ. (ඇමුණුම IV). 2014 වසරේ මුළු ආනයන පරිමාව 36,151.81mt ක් වූ අතර එය 2013 වසරට වඩා 174.9%ක වැඩි වීමකි. ආනයන වියදම ද 2013 රුපියල් මිලියන.4604.84 සිට 2014 වර්ෂයේ දී රුපියල් මිලියන 9240.15ක්

දක්වා 100.7%කින් වැඩි විය. මුළු ආනයනවලින් මෙට්‍රික් ටොන් 27,000ක් පමණ පුවක් ආනයනය කිරීම වූ අතර ඒ සඳහා වැය වූ පිරිවැය රුපියල් මිලියන 5,163ක් පමණ විය. අනෙකුත් ප්‍රධාන ආනයන භෝග වූයේ කොකෝවා නිෂ්පාදිත හා කහ වූ නමුත් කොකෝවා ආනයන පරිමාව 2013 වසරට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමකින් පහළ බැස තිබුණේය. ගම්මිරිස් ආනයනය ද 2013 වසරේ 31.33mt. සිට 367.11mt. දක්වා ඉහළ ගොස් තිබූ අතර මෙම ගම්මිරිස් අපනයනය කරන ලද්දේ අලුතින් ඉදි කරන ලද අගය එකතු කිරීමේ නිෂ්පාදනවල යෙදෙන කම්හල් සඳහා අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කරනු පිණිසය. 2014 වසර තුළ කරාබු හා බුලත් හැරුණු කොට අනිකුත් සියලු අපනයන කෘෂි භෝග යටත් පිරිසෙයින් සුළු ප්‍රමාණවලින් හෝ ලංකාවට ආනයනය කරනු ලැබ තිබේ. (ඇමුණුම IV).

**5.6 පර්යේෂණ ප්‍රකාශන**

- අබේසිංහ, පී.ඩී.; සමරජීව, එන්.ජී.සී.ඩී; විජේසිංහ, කේ.ජී.ජී. (2014); සසම්භාවී ලෙස විස්තාරණය කරන ලද බහුරූපීය DNA (RAPD) හා අනුක්‍රමය ආශ්‍රිතව විස්තාරිත බහුරූපීය (SRAP) ලකුණුකුරු භාවිතයෙන් ශ්‍රී ලංකා කුරුඳු විශේෂයන් හඳුනාගැනීම සඳහා ප්‍රාථමික පරීක්ෂණය. *J.Natn. විද්‍යා පදනම**,** 2014 42 (3): 175 – 182.*
- කොඩිතුවක්කු, ආර්.ඩී., කුමාරි, අයි.එස්., ද සිල්වා, ඩී.පී.පී., විජේකෝන්, ඩබ්.එම්.ආර්.ඩබ්.බී. (2014) ගම්මිරිස් (*Piper nigrum* L.) තවාන් පැළ සඳහා ජෛව පෝෂක (Arbuscular Mycorrhizae - AM) හා ජෛව පාලන කාරකවල (*Trichoderma* sp. and *Pseudomonas fluorescens*) විභව භාවිතාවන්. ගම්මිරිස් පිළිබඳ Vol.vi, No.1, pp.34-46.
- කොඩිතුවක්කු, ආර්.ඩී., විජේකෝන්, ඩබ්.එම්.ආර්.ඩබ්.බී., කුමාරි, අයි.එස්, ද සිල්වා ඩී.පී.පී. (2014) ජෛවපාලන කාරක හා ජෛව පෝෂක (Arbuscular Mycorrhizae-AM) මගින් ගම්මිරිස් තවාන් පැළවල වර්ධනයට ඉවහල් වන ක්‍රියාකාරකම් හා පාංශුජ රෝගකාරකවලට එරෙහිව *Trichoderma* sp. හා *Pseudomonas fluorescens* යන ජෛව පාලන කාරකවල නාලස්ථ ප්‍රතිරෝධතා හැකියාව. උද්ධෘත ග්‍රන්ථ: SLCARP අන්තර්ජාතික කෘෂිකර්ම පර්යේෂණ සමුළුව, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය. 33 පි.
- චතුරානි, එල්.ජී.ටී.; සමරවීර, ඩී.එන්.; අමරසේකර, එම්.ජී.ටී.එස්.; (2014); කුරුඳු ( Cinnamomum zeylanicum Blume) වගා කරන පසෙහි වරණීය පාංශු ගුණාංග කෙරෙහි හුණු යෙදීමේ බලපෑම; *6 වැනි වාර්ෂික සමුළුව, කෘෂි විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය*
- ජයසිංහ ජී.ජී.; කැටකුඹුර, කේ.එච්.එම්.පී.කේ.; විජේසිංහ, කේ.ජී.ජී.; හේමචන්ද්‍ර, කේ.එස්.; වැලිගමගේ. එස්; (2014); දක්ෂිණ ශ්‍රී ලංකාවේ කුරුඳු වගාබිම්වල ගොවීන් විසින් සිදු කරන ලද ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරකම් හා පළිබෝධ හා රෝග තත්ත්වයන් අතර සම්බන්ධතාව. *උද්ධෘත ග්‍රන්ථ: SLCARP අන්තර්ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සමුළුව 2014, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය, අගෝස්තු 11-12, කොළඹ, ශ්‍රී ලංකාව 43 පි.*
- ජයසිංහ, ජී.ජී.; මලික්, බී. (2014) මකුළු කීඩැවන් සඳහා ෆයිටොසීඩ විලෝපිකයකු වන *Neoseiuluslon gispinosus* මහා පරිමාණයෙන් නිෂ්පාදනය සඳහා ආදර්ශයක් නිර්මාණය. *උද්ධෘත ග්‍රන්ථ: SLCARP අන්තර්ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සමුළුව 2014, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය සඳහා ශ්‍රී ලංකා කවුන්සිලය, අගෝස්තු 11-12, කොළඹ, ශ්‍රී ලංකාව 49 පි.*
- ජයසිංහ, ජී.ජී.; මලික්, බී. (2014) හරිතාගාර තත්ත්වයන් යටතේ ජෛව පාලක කාරකයකු ලෙස ෆයිටොසේඩ විලෝපිකයකු වන *Neoseiuluslon gispinosus* (Evans) යොදාගෙන දෙතිත් මකුළු කීඩැවා, *Tetranychus urticae විසින් ආසාදිත තක්කාලි කළමනාකරණය, කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2014. රුහුණු විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, 31-35 පි.*

- තිලකරත්න, සී.එල්., පෝෂ්, එස්., කේන්, කේ., නෝර්ටන්, ආර්., ටවුෂ්, එම්, සේනාවීර, එස්. (2014). ඔස්ට්‍රේලියානු හරිත නිදහස් වායු $CO_2$ ධනාරෝපණය ඔස්සේ තිරිඟුවල (*Triticum aestivum*) පත්‍ර වර්ධනයේ අන්තර්-විශේෂ විවිධත්වය: එය කාබන් හා/හෝ නයිට්‍රජන් සැපයුම ඔස්සේ ක්‍රමවත් වන්නේ ද? *Functional Plant Biology*. http://dx.doi.org/10.1071/FP14125
- දිසානායක එස්.ජී.එච්.සී.කේ., අත්තනායක ඒ.එම්.සී.අයි.එම්., ආචාර්ය අල්විස් එල්.එම්.එච්.ආර්., ජයසිංහ එච්.ඒ. එස්.එල්. හා ආචාර්ය ජේ.එම්. (2014). ගම්මිරිස් දේශීය වරණ නාලස්ථ ප්‍රචාරණය සඳහා ප්‍රොටොකෝලයක් නිර්මාණය. 5 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව - ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.
- ප්‍රදීප් එම්.ආර්., සුබසිංහ එච්.එම්.පී.ඒ., හිටිනායක, එච්.එම්.ජී.එස්.බී. - 2014,. ඉඟුරුවල වර්ධනය හා අස්වැන්න කෙරෙහි බීජ රයිසෝමවල බරෙන් ඇතිවන බලපෑම. වාර්ෂික පර්යේෂණ සමුළුව - 2014, කෘෂි විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
- පල්ලේගම, පී.ආර්.ඩී.කේ., වීරක්කොඩි, ඩබ්.ඒ.පී., සුබසිංහ, එච්.එම්.පී.ඒ.-2014,. බීජ ඉඟුරු (*Zingiber officinale* Roscoe) ගබඩා කර තබා ගත හැකි කාලය දීර්ඝ කිරීම සඳහා රසායනික වර්ධන නිශේධක භාවිතය. වාර්ෂික පර්යේෂණ සමුළුව - 2014, කෘෂි විද්‍යා පීඨය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.-
- බණ්ඩාර, එච්.ඒ.පී.සී., ප්‍රශාන්ත, බී.ඩී.ආර්, ඉඳුරුව, අයි.වී.ඒ.ඩී.සී.එස් (2014). සාදික්කාවල තුනී ස්තර වියළීමේ ලක්ෂණ: හිරු එළියෙන් වියළා ගැනීම හා යාන්ත්‍රානුසාරයෙන් වියළා ගැනීම සංසන්දනය. පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සැසි, ශ්‍රී ලංකාව, 18 වෙළුම. 2014 ජූලි 4-5
- රණසිංහ, ආර්.කේ.ආර්.එස්., නානායක්කාර, සී.එම්., සුමනසේන, එච්.ඒ., සමරවීර, ඩී.එන්. (2014). දේශීය *Burkholderia* විශේෂයක් භාවිතයෙන් නාලස්ථ රොක් ෆොස්ෆේට් ද්‍රාව්‍යතාවට බලපාන පාරිසරික පරාමිතීන් ප්‍රශස්තකරණය. වාර්ෂික පර්යේෂණ සමුළුව, කොළඹ විශ්ව විද්‍යාලය, 215 පි.
- වීරසූරිය එස්.එන්; මුණසිංහ, ආර්.එස්., විජේසිංහ, කේ.ජී.ජී. (2014); ගුණාත්මය, ගබඩා කර තබා ගත හැකි කාලය හා ආහාර සුරක්ෂිතතාව සඳහා කුරුඳු කූරුවලට සල්ෆර් දුම් ගැස්සවීමෙන් ඇති වන බලපෑම, උද්ධෘත ග්‍රන්ථ: *SLCARP අන්තර්ජාතික කෘෂිකර්ම පර්යේෂණ සමුළුව 2014, කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්තිය පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලය, අගෝස්තු 11-12, කොළඹ, ශ්‍රී ලංකාව. 87 පි.*
- සමරසේකර එම්.ඒ., විමලසිරි, කේ.එම්.එස්., ලියනගේ, ටී., සෙනෙවිරත්න, ඒ. (2014). ශ්‍රී ලංකා හා ඉන්දිනීසියානු පුවක් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්: හිරු එළියේ වියළීම හා යාන්ත්‍රානුසාරයෙන් වියළීම සංසන්දනය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, 18 වෙළුම, ජූලි 4-5 2014. 191 පි.
- සුබසිංහ, එච්.එම්.පී.ඒ., දිසානායක, ඩී.එම්.ආර්.ඩී. 2014. විවිධ භෝග කළමනාකරණ පිළිවෙත් යටතේ ගම්මිරිස් කරල් හා මූලකේෂවලට වියළ මූලද්‍රව්‍ය බෙදීයාමේ විවිධත්වය. Focus in Pepper - 2014, ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව.
- සුමනසේන, එච්.ඒ., ප්‍රියදර්ශනී, කේ.ඩී.එන්., බෝවත්ත, එස්., (2012) හව්‍ය අපනයන කෘෂි භෝග විශේෂයක් ලෙස වල්ලපට්ටා (Gyrinops Walla Gaetn.) යොදා ගැනීම. *The Sri Lanka Forester*. 34:109-120
- සෙනෙවිරත්න, ජේ.එම්., රාජපක්ෂ, අයි.ජී.එම්. (2014) දේශීය ගම්මිරිස්වල අනන්‍යතාව රැක ගනිමින් වැඩි අස්වැන්නක් ලබා දෙන ගම්මිරිස් ප්‍රභේද සංවර්ධනය. *Focus on Pepper* (ගම්මිරිස් කර්මාන්තය පිළිබඳ සඟරාව) VI වෙළුම. 1 කාණ්ඩය 2014 ජනවාරි-ජූනි, ජාත්‍යන්තර ගම්මිරිස් සමුළුව, ජකාර්තා, ඉන්දුනීසියාව. 12-19 පි.

## ඇමුණුම 1: අපනයන කෘෂි භෝග වගා වපසරිය (හෙක්.) දිස්ත්‍රික්ක අනුව - 2014*

| දිස්ත්‍රික්කය | කුරුඳු | ගම්මිරිස් | කරාබු | කරදමුංගු | කෝපි | කොකෝවා | සාදික්කා | පුවක් | බුලත් | සැගිරි | එකතුව | ඉඟුරු | කහ | මුළු එකතුව (ඉඟුරු, කහ ඇතුළත්ව) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහනුවර | 126 | 5,969 | 3,007 | 721 | 1,324 | 299 | 815 | 2,266 | 58 | - | 14,585 | 437 | 392 | 15,414 |
| මාතලේ | 327 | 6,433 | 674 | 1,133 | 660 | 1,068 | 73 | 1,194 | 45 | - | 11,607 | 38 | 87 | 11,732 |
| නුවරඑළිය | 35 | 881 | 337 | 116 | 1,084 | 5 | 4 | 554 | 7 | - | 3,023 | 134 | 145 | 3,302 |
| කුරුණෑගල | 158 | 3,009 | 403 | 8 | 706 | 152 | 50 | 829 | 1,072 | - | 6,387 | 378 | 85 | 6,850 |
| බදුල්ල | 190 | 2,512 | 55 | 10 | 336 | 35 | - | 1,423 | 55 | - | 4,616 | 97 | 59 | 4,772 |
| මොණරාගල | 79 | 1,783 | 6 | - | 192 | 599 | 1 | 1,304 | 56 | - | 4,020 | 6 | 3 | 4,029 |
| ගාල්ල | 11,192 | 468 | 192 | - | 107 | 3 | 2 | 755 | 240 | - | 12,959 | 90 | 51 | 13,100 |
| මාතර | 8,453 | 775 | 489 | 34 | 172 | 4 | 5 | 1,131 | 111 | - | 11,174 | 127 | 96 | 11,397 |
| හම්බන්තොට | 3,158 | 1,808 | 54 | 1 | 116 | - | - | 551 | 33 | 788 | 6,509 | 17 | 9 | 6,535 |
| කොළඹ | 227 | 243 | 59 | 1 | 58 | 2 | 2 | 215 | 85 | - | 892 | 95 | 8 | 995 |
| ගම්පහ | 265 | 1,700 | 114 | 2 | 369 | 8 | 6 | 1,123 | 1,128 | - | 4,715 | 295 | 89 | 5,099 |
| කළුතර | 3,369 | 313 | 130 | 3 | 139 | 4 | 4 | 584 | 1,000 | - | 5,546 | 111 | 29 | 5,686 |
| රත්නපුර | 4,019 | 3,253 | 403 | 338 | 226 | 23 | 6 | 1,898 | 138 | 389 | 10,693 | 89 | 51 | 10,833 |
| කෑගල්ල | 264 | 3,079 | 1,704 | 434 | 595 | 173 | 45 | 1,613 | 209 | - | 8,116 | 184 | 132 | 8,432 |
| වෙනත් දිස්ත්‍රික්ක | 5 | 65 | - | - | 50 | - | - | 1,035 | 359 | - | 1,514 | - | - | 1,514 |
| එකතුව | 31,867 | 32,291 | 7,627 | 2,801 | 6,134 | 2,375 | 1,013 | 16,475 | 4,596 | 1177 | 106,356 | 2,098 | 1,236 | 109,690 |

මූලාශ්‍රය: කෘෂිකර්ම සංගණනය-2002, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු දත්ත සංචිතය, කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
*අගයන් යාවකාලික වේ

ඇමුණුම I1 : අපනයන කෘෂි භෝගවල අපනයන පරිමාව හා අගය – 2013/2014

| නිෂ්පාදනය | ඒකකය | 2013 | 2014** | වර්ධනය % 2013/14 |
|---|---|---|---|---|
| කුරුඳු | පරිමාව (මෙ.ටො) | 13,799.3 | 13,686.4 | -0.8 |
| | අගය (රු.මි) | 17,129.2 | 17,274.2 | 0.8 |
| කුරුඳු කොළ තෙල් | පරිමාව (මෙ.ටො) | 265.1 | 248.0 | -6.4 |
| | අගය (රු.මි) | 479.7 | 485.8 | 1.3 |
| කුරුඳු පොතු තෙල් | පරිමාව (මෙ.ටො) | 16.8 | 17.0 | 0.9 |
| | අගය (රු.මි) | 323.5 | 499.5 | 54.4 |
| කරාබු | පරිමාව (මෙ.ටො) | 4,378.8 | 1,101.7 | -74.8 |
| | අගය (රු.මි) | 6,123.8 | 1,777.3 | -71.0 |
| කරාබු නැටි | පරිමාව (මෙ.ටො) | 1,099.4 | 138.2 | -87.4 |
| | අගය (රු.මි) | 237.1 | 42.3 | -82.2 |
| කරාබු තෙල් | පරිමාව (මෙ.ටො) | 4.5 | 2.1 | -54.4 |
| | අගය (රු.මි) | 39.5 | 24.8 | -37.3 |
| කොකෝවා හා කොකෝවා නිෂ්පාදන* | පරිමාව (මෙ.ටො) | 1,212.6 | 2,098.9 | 73.1 |
| | අගය (රු.මි) | 682.1 | 1,076.3 | 57.8 |
| කෝපි | පරිමාව (මෙ.ටො) | 19.1 | 57.0 | 198.3 |
| | අගය (රු.මි) | 15.3 | 29.8 | 94.8 |
| ගම්මිරිස් | පරිමාව (මෙ.ටො) | 21,329.6 | 7929.6 | -62.8 |
| | අගය (රු.මි) | 16,478.4 | 9,028.4 | -45.2 |
| ගම්මිරිස් තෙල් | පරිමාව (මෙ.ටො) | 7.6 | 25.7 | 238.3 |
| | අගය (රු.මි) | 101.1 | 287.5 | 184.4 |
| කරදමුංගු | පරිමාව (මෙ.ටො) | 4.1 | 8.3 | 101.3 |
| | අගය (රු.මි) | 21.4 | 39.6 | 85.0 |
| කුරුඳු තෙල් | පරිමාව (මෙ.ටො) | 1.7 | 1.3 | -25.1 |
| | අගය (රු.මි) | 73.8 | 59.2 | -19.7 |
| පැඟිරි | පරිමාව (මෙ.ටො) | 13.9 | 10.1 | -27.5 |
| | අගය (රු.මි) | 45.7 | 39.0 | -14.7 |
| සාදික්කා | පරිමාව (මෙ.ටො) | 1,741.5 | 1,630.6 | -6.4 |
| | අගය (රු.මි) | 2,029.8 | 1,927.7 | -5.0 |
| වසාවාසි | පරිමාව (මෙ.ටො) | 297.1 | 198.3 | -33.3 |
| | අගය (රු.මි) | 667.4 | 504.2 | -24.5 |
| සාදික්කා තෙල් | පරිමාව (මෙ.ටො) | 33.2 | 30.4 | -8.3 |
| | අගය (රු.මි) | 419.7 | 226.6 | -46.0 |
| වසාවාසි තෙල් | පරිමාව (මෙ.ටො) | 0.1 | 0.1 | 33.0 |
| | අගය (රු.මි) | 0.6 | 0.6 | -8.2 |
| පුවක්* | පරිමාව (මෙ.ටො) | 9,782.6 | 29,508.8 | 201.6 |
| | අගය (රු.මි) | 2,064.9 | 8,351.0 | 304.4 |
| බුලත් | පරිමාව (මෙ.ටො) | 3,024.5 | 3,002.7 | -0.7 |
| | අගය (රු.මි) | 1,368.3 | 1,378.6 | 0.8 |
| වැනිලා | පරිමාව (මෙ.ටො) | 0.1 | 0.3 | 200.0 |
| | අගය (රු.මි) | 4.0 | 6.0 | 49.4 |
| වැනිලා තෙල් | පරිමාව (මෙ.ටො) | 0.04 | 0.05 | 20.0 |
| | අගය (රු.මි) | 0.1 | 0.1 | 26.6 |
| සේර තෙල් | පරිමාව (මෙ.ටො) | 0.6 | 0.8 | 25.7 |
| | අගය (රු.මි) | 2.7 | 3.4 | 27.7 |
| **මුළු කෘෂි අපනයන භෝග** | **පරිමාව (මෙ.ටො)** | ***57,032.2** | **59696.1** | **4.7** |
| | **අගය (රු.මි)** | ****48,308.1** | **43,061.8** | **-10.9** |
| ඉඟුරු | පරිමාව (මෙ.ටො) | 92.3 | 59.6 | -35.4 |
| | අගය (රු.මි) | 29.0 | 70.9 | 144.3 |
| ඉඟුරු තෙල් | පරිමාව (මෙ.ටො) | 1.0 | 1.6 | 63.0 |
| | අගය (රු.මි) | 16.4 | 31.5 | 92.1 |
| කහ | පරිමාව (මෙ.ටො) | 66.9 | 69.9 | 4.5 |
| | අගය (රු.මි) | 39.5 | 59.3 | 50.1 |
| **එකතුව (ඉඟුරු හා කහ)** | **පරිමාව (මෙ.ටො)** | **160.2** | **131.2** | **-18.1** |
| | **අගය (රු.මි)** | **84.9** | **161.6** | **90.4** |
| **මුළු එකතුව (ඉඟුරු,කහ ඇතුළත්ව)** | **පරිමාව (මෙ.ටො)** | **57,192.5** | **59,827.3** | **4.6** |
| | **අගය (රු.මි)** | **48,392.7** | **43,223.5** | **-10.7** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව **අගයන් යාවකාලික වේ *ප්‍රති අපනයන ඇතුළුව

ඇමුණුම III : 2011/2014 දක්වා අපනයන කෘෂි භෝග වල දළ මිල ගණන් (රු. /කි.ග්‍රෑ.)

| භෝගය | මිල | වාර්ෂික දළ මිල | | | | වර්ධනය % 2013/14 |
|---|---|---|---|---|---|---|
| | | 2011 | 2012 | 2013 | 2014 | |
| කොකෝවා | ගො.මි. | 322.13 | 266.92 | 193.97 | 234.84 | 21.07 |
| | වෙ.මි. | 347.16 | 346.94 | 361.63 | 339.21 | -6.20 |
| | ලෝ.මි. | 332.71 | 304.31 | 315.35 | 402.23 | 27.55 |
| කෝපි* | ගො.මි. | 234.09 | 249.51 | 220.7 | 218.86 | -0.83 |
| | වෙ.මි. | 266.16 | 251.49 | 249.39 | 263.13 | 5.51 |
| | ලෝ.මි.* | 282.20 | 309.54 | 286.33 | 301.60 | 5.33 |
| ගම්මිරිස් | ගො.මි. | 691.90 | 832.05 | 731.06 | 1,037.64 | 41.94 |
| | වෙ.මි. | 703.46 | 826.83 | 765.98 | 1,095.81 | 43.06 |
| | ලෝ.මි. | 726.58 | 934.61 | 945.12 | 1,247.25 | 31.97 |
| කරාබු | ගො.මි. | 1,250.35 | 1,159.70 | 1,233.93 | 1,400.89 | 13.53 |
| | වෙ.මි. | 1,376.14 | 1,225.95 | 1330.13 | 1457.68 | 9.59 |
| | ලෝ.මි. | 1,291.82 | 1,367.58 | 1,591.14 | 1,904.25 | 19.68 |
| කුරුඳු කූරු | ගො.මි. | 921.85 | 1,042.08 | 1,109.41 | 1,172.79 | 5.71 |
| | වෙ.මි. | 822.82 | 889.53 | 892.60 | 1284.66 | 43.82 |
| | ලෝ.මි. | - | - | - | - | - |
| සාදික්කා | ගො.මි. | 742.53 | 838.45 | 683.88 | 642.17 | -6.10 |
| | වෙ.මි. | 790.02 | 909.83 | 777.85 | 692.31 | -11.00 |
| | ලෝ.මි. | 2,442.44 | 3,118.39 | 2,798.13 | 2,257.58 | -19.32 |
| වසාවාසි | ගො.මි. | 2,847.77 | 2,096.51 | 1,536.27 | 1,741.52 | 13.36 |
| | වෙ.මි. | 3,092.01 | 2,374.48 | 1,825.41 | 2,024.80 | 10.92 |
| | ලෝ.මි. | 3,758.72 | 3,141.56 | 2,650.38 | 2,169.48 | -18.14 |
| කරදමුංගු | ගො.මි. | 2,713.12 | 1,945.75 | 1,731.68 | 1,642.08 | -5.17 |
| | වෙ.මි. | 2,482.81 | 1,300.00 | 1,925.00 | 1,804.56 | -6.26 |
| | ලෝ.මි. | - | 1,667.93 | 1,864.16 | 1,187.48 | -36.30 |
| බුලත් (කොළ 1000ක් රු.) | ගො.මි. | 2,042.19 | 2,018.96 | 1,922.22 | 2,166.15 | 12.69 |
| | වෙ.මි. | - | - | - | - | - |
| | ලෝ.මි. | - | - | - | - | |
| පුවක් | ගො.මි. | 215.31 | 201.25 | 177.47 | 304.60 | 71.63 |
| | වෙ.මි. | 226.46 | 284.22 | 213.83 | 305.11 | 42.69 |
| | ලෝ.මි. | - | - | - | - | - |
| වැනිලා | ගො.මි. | - | - | - | - | - |
| | වෙ.මි. | - | - | - | - | - |
| | ලෝ.මි. | 2,848.00 | - | - | - | - |
| අමු ඉඟුරු | ගො.මි. | 76.51 | 106.78 | 214.40 | 289.59 | 35.07 |
| | වෙ.මි. | - | - | - | - | - |
| | ලෝ.මි. | - | - | - | - | - |
| අමු කහ | ගො.මි. | 47.70 | 36.54 | 34.54 | 37.37 | 8.19 |
| | වෙ.මි. | - | - | - | - | - |
| | ලෝ.මි. | - | - | - | - | - |

මූලාශ්‍රය: අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්ත සංචිතය/මහජන ලෙජරය/ සප්ටා

ගො.මි.: ගොවිපළ මට්ටමේ මිල / වෙ.මි: වෙන්දේසි මිල / ලෝ.මි.: ලෝක වෙළෙඳපොළේ මිල

*රොබස්ටා කෝපි මිල

## ඇමුණුම 1V: අපනයන කෘෂි භෝගවල ආනයන පරිමාව හා අගය – 2013/2014

| නිෂ්පාදිතය | ඒකකය | 2013 | 2014* | වර්ධනය(%) 2013/14 |
|---|---|---|---|---|
| කුරුඳු | පරිමාව (මෙ.ටො.) | 45.8 | 89.23 | 94.82 |
| | අගය (රු.මි.) | 64.75 | 133.07 | 105.51 |
| කුරුඳු කොළ තෙල් | පරිමාව (මෙ.ටො.) | 0.22 | 0.38 | 70.45 |
| | අගය (රු.මි.) | 1.03 | 0.23 | -77.67 |
| කුරුඳු පොතු තෙල් | පරිමාව (මෙ.ටො.) | 0.99 | 0.06 | -93.94 |
| | අගය (රු.මි.) | 12.24 | 0.04 | -99.67 |
| කරාබු | පරිමාව (මෙ.ටො.) | 5 | - | - |
| | අගය (රු.මි.) | 7.52 | - | - |
| කරාබු නැටි | පරිමාව (මෙ.ටො.) | - | 13.48 | - |
| | අගය (රු.මි.) | - | 3.56 | - |
| කරාබු තෙල් | පරිමාව (මෙ.ටො.) | 2.04 | 3.57 | 75.15 |
| | අගය (රු.මි.) | 5.77 | 10.02 | 73.66 |
| කොකෝවා හා කොකෝවා නිෂ්පාදිත | පරිමාව (මෙ.ටො.) | 6,330.22 | 3,680.20 | -41.86 |
| | අගය (රු.මි.) | 3,391.45 | 2,563.29 | -24.42 |
| කෝපි | පරිමාව (මෙ.ටො.) | 43.11 | 51.89 | 20.37 |
| | අගය (රු.මි.) | 44.18 | 61.06 | 38.21 |
| ගම්මිරිස් | පරිමාව (මෙ.ටො.) | 31.33 | 367.11 | 1071.75 |
| | අගය (රු.මි.) | 14.42 | 340.09 | 2258.46 |
| ගම්මිරිස් තෙල් | පරිමාව (මෙ.ටො.) | 0.81 | 0.76 | -5.93 |
| | අගය (රු.මි.) | 1.2 | 0.44 | -63.33 |
| කරදමුංගු | පරිමාව (මෙ.ටො.) | 42.07 | 40.47 | -3.80 |
| | අගය (රු.මි.) | 42.29 | 32.95 | -22.08 |
| කරදමුංගු තෙල් | පරිමාව (මෙ.ටො.) | 1.8 | 1.7 | -5.55 |
| | අගය (රු.මි.) | 23.53 | 20.4 | -13.30 |
| පැඟිරි | පරිමාව (මෙ.ටො.) | 1.36 | 0.33 | -75.73 |
| | අගය (රු.මි.) | 2.45 | 0.52 | -78.77 |
| සාදික්කා | පරිමාව (මෙ.ටො.) | 27.102 | 19.13 | -29.41 |
| | අගය (රු.මි.) | 34.613 | 33.00 | -4.66 |
| වසාවාසි | පරිමාව (මෙ.ටො.) | 0.5 | 10.40 | 1980.00 |
| | අගය (රු.මි.) | 1.21 | 17.09 | 1312.40 |
| සාදික්කා තෙල් | පරිමාව (මෙ.ටො.) | 1.8 | - | - |
| | අගය (රු.මි.) | 20.4 | - | - |
| පුවක් | පරිමාව (මෙ.ටො.) | 1,196.58 | 27,002.79 | 2156.664 |
| | අගය (රු.මි.) | 150.66 | 5,163.61 | 3327.326 |
| බුලත් | පරිමාව (මෙ.ටො.) | - | - | - |
| | අගය (රු.මි.) | - | - | - |
| වැනිලා | පරිමාව (මෙ.ටො.) | 0.26 | 5.44 | 1992.31 |
| | අගය (රු.මි.) | 0.15 | 9.59 | 6293.33 |
| වැනිලා තෙල් | පරිමාව (මෙ.ටො.) | 0.824 | 3.09 | 275.00 |
| | අගය (රු.මි.) | 1.89 | 2.95 | 56.08 |
| සේර තෙල් | පරිමාව (මෙ.ටො.) | 1.5 | 1.70 | 13.33 |
| | අගය (රු.මි.) | 3 | 3.45 | 15.00 |
| **මුළු අපනයන කෘෂි භෝග** | **පරිමාව (මෙ.ටො.)** | **7,733.32** | **31,291.72** | 304.63 |
| | **අගය (රු.මි.)** | **3,822.75** | **8,395.38** | 119.62 |
| ඉඟුරු | පරිමාව (මෙ.ටො.) | 1,295.60 | 691.89 | -46.60 |
| | අගය (රු.මි.) | 177.88 | 230.91 | 29.81 |
| ඉඟුරු තෙල් | පරිමාව (මෙ.ටො.) | 0.76 | 0.5 | -34.21 |
| | අගය (රු.මි.) | 8.67 | 7.3 | -15.80 |
| කහ | පරිමාව (මෙ.ටො.) | 4,118.73 | 4,167.71 | 1.19 |
| | අගය (රු.මි.) | 595.54 | 606.57 | 1.85 |
| **එකතුව (ඉඟුරු හා කහ)** | **පරිමාව (මෙ.ටො.)** | **5,415.09** | **4,860.10** | -10.25 |
| | **අගය (රු.මි.)** | **782.09** | **844.77** | 8.01 |
| **එකතුව (ඉඟුරු,කහ සමග)** | **පරිමාව (මෙ.ටො.)** | **13,148.41** | **36,151.81** | 174.95 |
| | **අගය (රු.මි.)** | **4,604.84** | **9,240.15** | 100.66 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව * අගයන් යාවකාලික වේ

## ඇමුණුම V: ව්‍යාප්ති නිලධාරීන් ස්ථානගත කිරීම

| | |
|---|---|
| **ගාල්ල** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | අලුත්වෙල |
| | හිනිදුම |
| | හබරාදුව |
| | අම්බලන්ගොඩ |
| | බලපිටිය |
| | අක්මීමන |
| | ඇත්කඳුර |
| | ඇල්පිටිය |
| | කරන්දෙණිය |
| | බද්දේගම |
| | නියාගම |
| | හික්කඩුව |
| | යක්කලමුල්ල |
| **හම්බන්තොට** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | ඕකේවෙල |
| | බෙලිඅත්ත |
| | මිද්දෙණිය |
| | කටුවන |
| | වලස්මුල්ල |
| | සූරියවැව |
| | වීරකැටිය |
| | වරාපිටිය |
| **ගම්පහ** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | දොම්පේ |
| | උඩුගම්පළ |
| | ගම්පහ |
| | මහර |
| | බඩල්ගම |
| | පල්ලෙවෙල |
| | බියගම |
| | මීරිගම |
| | දිවුලපිටිය |
| | මිනුවන්ගොඩ |
| | අත්තනගල්ල |
| **නුවරඑළිය** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | ගිනිගත්හේන |
| | හෙල්බොඩ |
| | හඟුරන්කෙත |
| | වලපනේ |
| | පල්ලේබෝවල |
| | නිල්දණ්ඩාහින්න |
| | රිකිල්ලගස්කඩ |
| | මල්දෙණිය |
| **මහනුවර** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | ගලගෙදර |
| | උඩුනුවර |
| | කුරුඳුවත්ත |
| | තලාතුඔය |
| | පූජාපිටිය |
| | උඩදුම්බර |
| | රඹුක්පිටිය |
| | යටිනුවර |
| | වත්තේගම |
| | කුණ්ඩසාලේ |
| | හතරලියද්ද |
| | අලවතුගොඩ |
| | මැදපිටිය |
| | ගහවට කෝරලේ |
| | උඩපළාත |
| | හුළුගහ |
| | මිණිපේ |
| | ගලහ |
| **රත්නපුර** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | වැලිගෙපොල |
| | කොළොන්න |
| | අයගම |
| | ගොඩකවෙල |
| | පැල්මඩුල්ල |
| | බලංගොඩ |
| | රත්නපුර |
| | ඇඹිලිපිටිය |
| | නිවිතිගල |
| | කැල්ල |
| | ඇළපාත |
| | පොතුපිටිය |
| | පල්ලෙබැද්ද |
| **මොණරාගල** | **ව්‍යා. නිල. කොට්ඨාසය** |
| | බිබිලේ |
| | මොණරාගල |
| | බඩල්කුඹුර |
| | මඩුල්ල |
| | හිඟුරුකඩුව |
| | මඩගම |
| | පදියතලාව |
| | බුත්තල |
| | මීගහයාය |
| | කොටගම |

**කෑගල්ල** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

මාවනැල්ල
උස්සාපිටිය
පින්නවල
කෑගල්ල
වරකාපොළ
දැරණියගල
දැදිගම
අරණායක
රුවන්වැල්ල
යටියන්තොට
බුලත්කොහුපිටිය
ගලිගමුව
රඹුක්කන

**මාතලේ** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

පලාපත්වල
උකුවෙල
තැන්න
රත්තොට
වේරගම
යටවත්ත
හුණුකැටඇළ
පල්ලපොල
වහකෝට්ටේ
අලුගොල්ල

**කුරුණෑගල** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

පොල්ගහවෙල
දොඩම්ගස්ලන්ද
මාවතගම
රම්බඩගල්ල
පොල්පිතිගම
කරඳගොල්ල
මැල්සිරිපුර
දඹදෙණිය
කටුගම්පළ
කිංගිරිය
වාරියපොළ
කුලියාපිටිය
පඩුවස්නුවර
මාදම්පේ
නාත්තන්ඩිය

**කොළඹ** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

අවිස්සාවේල්ල
හෝමාගම
පාදුක්ක

**බදුල්ල** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

සොරණාතොට බදුල්ල
හල්දුම්මුල්ල
නිකපොත
ඌවපරණගම
පස්සර
රිදීමාලියද්ද
හාලිඇළ
ලුණුගල
මීගහකිවුල
කන්දෙකැටිය
බණ්ඩාරවෙල


**මාතර** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

දෙනියාය
අකුරැස්ස
පස්ගොඩ
හක්මන
වැලිගම
දෙවිනුවර
දෙයියන්දර
කඹුරුපිටිය
රන්සෑගොඩ
පිටබැද්දර

**කළුතර** — **ව්‍යා. නිල. කොට්ඨාසය**

මදුරාවල
බණ්ඩාරගම
කළුතර
මතුගම
ඉත්තෑපාන
බදුරළිය
බේරුවල
හොරණ
බුලත්සිංහල
පැලවත්ත

ඇමුණුම V1 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංවිධාන සැලැස්ම - 2014




නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ, ස.අ. - සහකාර අධ්‍යක්ෂ, භෞ.ස.- භෞතික හා සංවර්ධන, ප්‍ර.අ.ඒ. -ප්‍රගති අධීක්ෂණ ඒකකය, පැ.සං. - පැළෑටි සංරක්ෂණය, ම.ප.ම. - මධ්‍යම පර්යේෂණ මධ්‍යස්ථානය, උ.ප.ම. - උප පර්යේෂණ මධ්‍යස්ථානය, ආ.ප.ඒ.- ආර්ථික පර්යේෂණ ඒකකය, සං.ලේ. - සංඛ්‍යාලේඛනඥ, පරි.නි. - පරිපාලන නිලධාරී, භාෂා පරි.- භාෂා පරිවර්තක, පර්.සං.ස- පර්යේෂණ හා සංවර්ධන සහකාර, සං.ස.- සංවර්ධන සහකාර, අය. සහ.- අයවැය සහකාර, සං.නි. - සංවර්ධන නිලධාරී, තා.නි.- තාක්ෂණ නිලධාරී, කළ.ස.- කළමනාකරණ සහකාර, පුස්ත.- පුස්තකාලාධිපති, ව්‍යා.නි.(වි) - ව්‍යාප්ති නිලධාරී (විශේෂ), ව්‍යා.නි.- ව්‍යාප්ති නිලධාරී, තා.නි.- තාක්ෂණ නිලධාරී, පරි.ද.ක්‍රි. - පරිගණක දත්ත ක්‍රියාකරු, ගො.ක. - ගොවිපළ කළමනාකරු, ගො.සේ.ස.- ගොවිපළ සේවා සහකාර, නි.පා. - නිවාස පාලක.



අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - අතමිට සරු හෙට දිනකට

ஏற்றுமதி விவசாயத் திணைக்களம் - வளமான எதிர்காலத்திற்கு

DEPARTMENT OF EXPORT AGRICULTURE - FOR A PROSPEROUS FUTURE